**වසර 2500 පසු**
**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.**

# සත්‍ය ධර්මය අවදි විය

## සූත්‍ර දේශනා 03

# පබ්බි සෝධන සූත්‍රය

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදයේ ප්‍රකාශනයකි.

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.



**සූත්‍ර දේශනා 02 - ජබ්බි සෝධන සූත්‍රය**

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

| | | |
|---|---|---|
| ධර්ම ග්‍රන්ථය පිළිබඳ විමසීම් | Email: | buddothpado@gmail.com |
| | Tel | +94 703 518 747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ |
| පරිගණක මුද්‍රණ සැකසුම | | **වාක්‍යා රූ**<br>අංක 42/8, මකුළුදූව, පිළියන්දල.<br>දුරකථනය 011 2 708377 |
| මුද්‍රණය | | **K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**<br>අංක 510, රාජගිරිය පාර, රාජගිරිය<br>දුරකථන 011 2 884701 |

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com / www.buddothpado.lk

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

1. Buddothpado -
https://youtube.com/@buddothpado

2. Buddothpado Aryanwahanse -
https://youtube.com/@buddothpadaaryanwahanse

3. Buddothpado  Unity -
https://youtube.com/@BuddothpadoUnity

4. Buddothpado English -
https://youtube.com/@weeejj

5. Buddothpado Tamil -
https://youtube.com/@buddothpadotamil

6. Buddothpado Zoom Discussion -
https://youtube.com/@Zoom-up2ik

7. Buddothpado Night Discussion -
https://youtube.com/@BuddothpadoNightDiscussi-zj2bk

8. Buddothpado English Zoom Discussion -
https://youtube.com/@BuddothpadoEnglishZoom

9. Buddothpado Radio Damma Discussion -
https://youtube.com/@BuddothpadoRDD

10. Buddothpado TV Damma Desana  -
https://youtube.com/@BuddothpadoTVdammaDesana

# නිවන් මඟ යායුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්විදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිලිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ) සත්‍යඤාණ අවබෝධය
2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)

   2.1 කෘත්‍යඤාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම

   2.2 කෘතක්ඤාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

**1. පූර්ව භාග ප්‍රතිපදාව (සත්‍යඤාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කල්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී**

බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඥාණය = සත්‍යඤ්ඤාණය)

- සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
- සිත මායාවක් බව අවබෝධකරගැනීම සිත යනු අරමුණාම බව දැනගැනීම
- අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
- ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම අරමුණාම ආත්මය බව දැකීම
- ශූන්‍යතා අවබෝධය
- ත්‍රිවිද්‍යා දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඤාණය, චුතුපපාත ඤාණය, ආසවක්‍යාඤාණය)
  (සිත = අරමුණ = ආත්මය)

1.1 කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසාදැන ගැනීම

1.2 නැවත නැවත සද්ධර්මශ්‍රවනය

1.3 යෝනිසෝමනසිකාරය

1.4 ධම්මානුධම්ම ප්‍රතිපදාව

**ශ්‍රාවකයා උට්ඨාන වීර්යෙන් කලයුතු දෙයින් වැඩි ප්‍ර තිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.**

**බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල් කැටයක පමණ දෙයකි.**

- සක්කාය දිට්ඨි ප්‍රහානය මෙතැනදී සිදුවේ.
- ශ්‍රාවකයා ආර්‍ය භූමියට පිවිසේ.

2. අපරභාග ප්‍රතිපදාව

2.1. **කෘත්‍යඤාණය** - අසාදැනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම - (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

2.1.1. **අරමුණෙහි සත්‍ය දැකීම**; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම(යථාභූත ඤාණය = යෝනිසෝ මනසිකාරය)

2.1.2. **අරමුණෙහි සත්‍ය දැක මිදීම**
අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම
ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම
සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

2.1.3. **ත්‍රි විද්‍යා ප්‍රායෝගිකව අත්දැකීම** (පුබ්බේනිවාසානුස්සති ඤාණය, චුතූපපාත ඤාණය, ආසවක්‍ෂය ඤ්ඤාණය)

2.2. **කෘතක්ඤාණය (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොභාදහමේ අනාවරනයක් පමනි. ඤාණයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැඟලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති**

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශුන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිර්ජීවෝ ශුන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජඣ බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක් නැති තැන චෙතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශූන්‍යත, අප්ප්‍රනිත

චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිස්ජීවෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤාස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජන්ති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය**

## පුණ්‍යානුමෝදනාව

මේ උතුම් ධර්ම දානය වෙනුවෙන්
උදව් උපකාර කළ සියලු දෙනාටම,
ධර්මයට ලැදි ඔබ සැමට
මෙම උතුම් කුසලය
මේ ඝෝර කටුක භයංකර සසරින්
මිදීම පිණිස උපනිශ්‍රය වේවා !

# පිදුම



කතරක අතරමංවී සිටි සියලුම
සත්වයන්ට අමා පැන් බිඳක් ලැබුණි.
මේ අමා පැන් බිඳ නිවරදි ව පානය
කර අපමණ දුක්ඛිත වූ
මේ භයංකර ඝෝර කටුක සසර
නිමකර ගැනීමට භාග්‍ය උදාවී ඇත.
ඒ අමා පැන් බිඳුව බිම නොහෙළා
ඉතාම ප්‍රවේසමෙන් ප්‍රඥා ඇස දල්වා
ගෙන පානය කර, මේ ඇසෙන පරම
නිර්මල වූ සත්‍යයට ඔබ දෙසවන්
යොමු කර, බුදුන් වහන්සේ පෙන්වූ
චතුරාර්ය සත්‍යය, පටිච්චිසමුප්පාදය,
සප්ත බොජ්ජංග නිවැරදිව
ගලපාගනිමින්, සද්ධර්ම
ශ්‍රවණය තුළින්ම ඔබට
නිවන උපනිශ්‍රය වේවා !
ප්‍රඥා ඇස පහළ වේවා !
නිවනින්ම නිවී සැනසෙත්වා !

# පටුන


| | |
|---|---|
| ජබ්බි සෝධන සූත්‍රය - 01 | 13 - 33 |
| ජබ්බි සෝධන සූත්‍රය - 02 | 34 - 59 |
| ජබ්බි සෝධන සූත්‍රය - 03 | 60 - 89 |
| ජබ්බි සෝධන සූත්‍රය - 04 | 90 - 123 |

# ජබ්බි සෝධන සූත්‍රය - 01

තෙරුවන් සරණයි !!!

**ජබ්බි සෝධන සූත්‍රය - මජ්ඣිම නිකායේ තුන්වෙනි කාණ්ඩයේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ දොළොස් වන ග්‍රන්ථයේ 143 වන පිටුව**

**රහතන් වහන්සේ හඳුනාගනිමු**

ජබ්බි සෝධන සූත්‍රය මේ සූත්‍රය ඉතාම දීර්ඝ පැහැදිලි කිරීමක් තියෙන සූත්‍රයක්. දීර්ඝව පැහැදිලි කරන්නේ කුමක්ද? ජබ්බි සෝධන සූත්‍රය තුළ බුදුන් වහන්සේ දීර්ඝ වශයෙන් පැහැදිලි කරනවා මේ රහතන් වහන්සේ ගේ ස්වභාවයත් රහතන් වහන්සේ කියලා අද නූතන යුගයේ ඇත්තටම විශාල හාස්‍යයට ලක්වෙලා තියෙනවා, මේ රහත් බව ප්‍රකාශ කිරීම. විහිලුවක් වෙලා තියෙනවා. මෙන්න මේ සූත්‍රය හරියට බැලුවොත් කෙනෙකුට මේ ජබ්බි සෝධන සූත්‍රය මේ සියල්ලටම සියල්ලම මනාකොට පැහැදිලි වෙනවා. මොකක්ද මේ වෙන්නේ කියලා. අද මොකක්ද වෙලා තියෙන්නේ කියලා. බුදුන්වහන්සේ බුදු සමය තුළ මේ සූත්‍රය තුළ මේ කාරණාව මනාකොට පෙන්නලා දෙනවා.

**ඒවං මේ සුතං ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ, තත්‍ර බෝ භගවා භික්ඛූ ආමන්තේසි භික්ඛවොති භදන්තේති තේ භික්ඛූ භගවතෝ පච්චස්සෝසුං භගවා ඒතදවොච.**

මා විසින් මෙසේ අසන ලදී - **ඒවං මේ සුතං**

"එක් කලක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවනාරාමයේහී අනේපිඬු සිටුගේ ආරාමයේ වැඩ වසන සේක්වා" එකල්හි භික්ෂූන් ඇමතූ භික්ෂූන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇසූහ. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇසූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළසේක. මෙන්න මේ කරුණු බුදුන්වහන්සේ දේශනය කළා.

" මහණෙනි මේ ශාසනයේ මහණ - **ඉධ භික්ඛවේ භික්ඛූ"**

**"ජාතිය ක්ෂය විය. බඹසර වසන ලද කත කරණීය කරන ලද මේ රහත් බව පිණිස කටයුතු අන් කිසිවෙක් නැතැයි නුවණින් දනීම් කියා අරහත්වය කරයි "**. ඒ අරහත්වය ප්‍රකාශ කෙරේ. මහණෙනි, ඒ මහණුන්ගේ භාෂිතය අභිනන්දනය ප්‍රකාශ නොකළ යුතුයි. පිළිගෙව් නොකට යුතුයි. පිලිගන්න එපා. මෙන්න දැන් නූතන යුගයේ මේ කාලයේත් මෙන්න මේ දේ තියෙනවා. අදත් අපිට දකින්න ලැබෙනවා මේ කාරණා මේ විදිහට

**ඉධ භික්ඛවේ භික්ඛූ** - මේ ශාසනයේ මහණ
**අඤ්ඤං බ්‍යාකරොති** - ජාතිය ක්ෂය වනවා

**'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී'ති. තස්ස, භික්ඛවෙ, භික්ඛුනො**

**භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා පඤ්හො පුච්ඡිතබ්බො - 'චත්තාරොමෙ, ආවුසො, වොහාරා තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා. කතමෙ චත්තාරො? දිට්ඨෙ දිට්ඨවාදිතා, සුතෙ සුතවාදිතා, මුතෙ මුතවාදිතා, විඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා - ඉමෙ ඛො, ආවුසො, චත්තාරො වොහාරා තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා.**

එතකොට බුදුන් වහන්සේ මෙතන පැහැදිලි කරනවා "බඹ බඹසර වස කරන ලදී. කත කරණීය රහත් බව පිණිස වෙන කිසිවක් නැතැයි මේ නුවණින් අන් කිසිවෙක් නැතැයි රහත් බව පිණිස කිරීමට අන් කිසිවක් නැතැයි මම නුවණින් දනිමි කියා" මෙන්න මේ ලෙස අරහත්වය ප්‍රකාශ කරයි නම්, මහණෙනි, මේ භාෂිතය පිළිගන්න එපා කියලා බුදුන් වහන්සේ දේශනා කරනවා. මේ භාෂිතය කිච්වා කියලා කතකරණීය කිච්චා කියලා.

**'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී'ති. තස්ස, භික්ඛවෙ, භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසි.**

පිළි ගන්නත් එපා. බාර ගන්නත් එපා. එක පිළිගන්න එපා කියලා බුදුන් වහන්සේම දේශනා කරනවා. ඕනම කෙනෙකුට කියන්න පුලුවන් කතකරණීය කියලා. මම රහත් වෙලයි කියල. බුදුන් වහන්සේ කියනවා බුද්ධ දේශනයෙන්ම ඒක පිලිගන්න එපා කියල. ඊට පස්සේ බුදුන් වහන්සේ තවදුරටත් ඒක පැහැදිලි කරනවා

**ඇවැත්නි, භාගවත්වු සියල්ල දක්නා වූ සියල්ල දන්නා වූ අරහත් වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේ විසින් මේ සත්‍යය මේ සතර වෝහාර මොනවට වදාරණ ලද. කවර සතර කෙනෙක් යත් දක්නා ලද්දේහි දෘෂ්ටිවාදී බවය. අසනා ලද්දෙහි ෂෘතවාදී බවය. දැකීම දැකීමක් විතරයි. ඇසීම ඇසීමක් විතරයි. ගන්ධ, රස, පොට්ඨබ්බ සංඛ්‍යාත මුතේ මුත වාදී බවයි. දැකීම දැකීම්ක්, ඇසීම ඇසීමක්, දැනීම් දැනීමක් බව ධම්මාලම්බන සංඛ්‍යාත විඤ්ඤාණයේ විඥාතවාදී බවය. විඤ්ඤාණයේ දැනීම දැනීමක් විතරයි. ඇවැත්නි, භාග්‍යවත්හු සියල්ල දක්නා වූ සියල්ල දන්නා වූ අරහත් වූ සම්මා සම්බුද්ධයන් වහන්සේ විසින් මේ සතර වෝහාර කෙනෙක් මොනවට වදාරණ ලදහ.**

මෙන්න මේ සතර වෝහාර තමයි මොනවාට වදාරණ ලද භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලදහ කියලා කියනවා. ඒ කියන්නේ

**දිට්ඨයේ දිට්ඨ මත්තං - සුතේ සුත මත්තං**
**මුතේ මුත මත්තං - විඥ්ඥාතේ විඥ්ඥාත මත්තං** කියලා

මෙන්න මෙතනදී එකක් හොඳින් දැන් මෙතන ඉදන් මේ සූත්‍රයෙන් පැහැදිලි කරනකොට දරාගන්න ඕනා. දැනගන්න ඕනා. දැනගත යුතුයි. බුදුන් වහන්සේ මේ රහතන් වහන්සේ නමක් කෙසේ හඳුනා ගනීම්ද කියන මෙන්න මේ පැහැදිලි කිරීම. මෙතනදී බුදුන් වහන්සේ දීර්ඝව පැහැදිලි කිරීමක් කරනවා. ඇත්තටම කිව්වොත් මේ

- එකක් තමයි සතර වෝහාර. සතර වෝහාර අවබෝධයෙන්,
- ඊට පස්සේ ධාතු අවබෝධයෙන්,

- පංච උපාදානස්කන්ධ අවබෝධයෙන් මේ පැහැදිලි කරන්නේ. බුදුන් වහන්සේ රහතන් වහන්සේගේ ස්වභාවය. මෙන්න මේව තියෙන්න ඕනා කියලයි මේ කියන්නේ. පංච උපාදානස්කන්ධ අවබෝධය.

- ඒ විතරක් නෙවෙයි ඊට පස්සේ අජ්ජඣත අධ්‍යාත්මික ආයතන, බාහිර ආයතන අවබෝධය.

- ඒ වගේම මේ නිමිති, අනුනිමිති. අනිමිත්ත නිමිත්ත, නිමිත්ත අනිමිත්ත මේ අවබෝධය.

**"න නිමිත්තක් සාහී"** කියන ඒක ඒ විතරක් නෙවෙයි. මේ ඊට පස්සේ තවදුරටත් බුදුන් වහන්සේ මේ රහතන් වහන්සේගේ ස්වභාවය පැහැදිලි කරනවා.

- එකලා වාසේ, අල්පේච්ඡතාවය ඒකත් රහතන් වහන්සේගේ ස්වභාවය බවට පැහැදිලි කරනවා.

- එතකොට ඒ විතරක් නෙමෙයි මෙතන සිව්පසය භාවිතය එක් වේලෙහි බත වැළඳීම බුදුන් වහන්සේ මේ රහතන් වහන්සේගේ ස්වභාවය විදිහටයි පැහැදිලි කරන්නේ. ඒ නිමිති නොගන්න සුළු, ඒ අනිමිත්ත ස්වභාවය රහතන් වහන්සේගේ ස්වභාවය විදිහටයි පැහැදිලි කරන්නේ.

- ආර්ය ඉන්ද්‍රිය සංවරය රහතුන් වහන්සේගේ ස්වභාවයට දාල බුදුන් වහන්සේ පැහැදිලි කරන්නේ.

- පංචනීවරණ යන්ගෙන් මිදුන ස්වභාවය රහතන් වහන්සේගේ ස්වභාවය, විදියටයි පැහැදිලි කරන්නේ.

- ඒ විතරක් නෙමෙයි චතුරාර්ය සත්‍යය අවබෝධය, රහතන් වහන්සේගේ ස්වභාවය විදිහටයි, ඒ ස්වභාවයට අනුගතව පැහැදිලි කරනවා.

- ඒ විතරක් නෙමෙයි කාමාශ්‍රව, භවාශ්‍රව, දිට්ඨාශ්‍රව කියන ආශ්‍රව ධර්මයෝ රහතන් වහන්සේගේ ස්වභාවය තුලින් පැහැදිලි කරනවා.

බුදුන් වහන්සේ මේ ජබ්බි සෝධන සූත්‍රය තුළ මේ රහත්භාවය කට මැන දොඩවිල්ලක් නොවෙයි කියන එක මෙන්න මෙතනින් අපිට මනාකොට පැහැදිලි වෙනවා.

මේ ජබ්බි සෝධන සූත්‍රය බුදුන් වහන්සේ දේශනා නොකලානම් කුමට කිව්වා වගේ තමයි අපට කියන්න හිතෙන්නේ. ඒ තරම්ම මේක වැදගත්. ඔබ බලන්න මේ තුළ පෙන්වන කාරණා, මේ රහතන් වහන්සේගේ ස්වභාවය බුදුන් වහන්සේ මෙන්ම මනා කොට පැහැදිලි කරනවා. මෙන්න මේව, මෙන්න මේව, මෙන්න මේව, රහතන් වහන්සේට අනුගත විය යුතුයි කියලා මෙන්න මේ ආකාරයට විය යුතුයි රහතන් වහන්සේ නමක් නම් කියලා.

ගාථා කිය කියා තාලයට මත් කර යන ඒවා, මේ බුද්ධ ශාසනයේ බුද්ධ වචනයට අනුගතයි කියලද ඔබ හිතන්නේ. නෑ, පිරිසුදු නිර්මල ශ්‍රී සද්ධර්මය කුමක්ද කියලා ඔබට මනා කොට දකින්න ලැබෙනවා. මේක හරියට බුද්ධ වචනය ඔබ මාධ්‍ය අධ්‍යයනය කළොත් කුමක්ද මේ බුදුන්වහන්සේ දේශනා කරන්නේ කියලා. රහත් කියලා කියන කෙනෙක් ගාව මේ නිමිති ප්‍රකට වෙන්නෙත් නෑ. එහෙම කෙනෙක් ගාව ආශ්‍රව ප්‍රකට වෙන්නේ නෑ. එහෙම කෙනෙක් ඒ දිට්ඨාශ්‍රව, භවාශ්‍රව, මේ අවිජ්ජාශ්‍රව දුරු කරගෙනයි තියෙන්නෙ. ඒ ස්වභාවය මනා කොට අපිට හැම තැනම දකින්න ලැබෙනවා. රහ කියන්නේ රහ නැහැනේ. රහත් භාවයි කියන්නෙ කෙනෙක් නෑ පිනවන්න. මේ පිනවන්න, නාමරූප වලින් මිදුන කෙනෙක්

නාමරූප පෙන්වන්නෙත් නෑ. රහත්භාවයට නෙමෙයි රහත් වුණු කෙනෙක් හම්බු වෙන්නේ නෑ.

**අරහත්වය කියන්නෙම කෙනා නෑ කියන එකයි. මම මලා කියන එකයි. සම්මුති වචනයෙන් කියනවා නම් මම මලා කියන එක තමයි අරහත්වය. ජීවත් වෙලා ඉන්න කොට මැරිල ඉන්න එක.**

මේ බෞද්ධ සමාජය ධර්මයෙන් පරිපූර්ණ විය යුතුයි. මේ බෞද්ධ සමාජය ධර්මය තුළින් ඉස්මතු විය යුතුයි. ධර්මය හොඳින් අවදි විය යුතුයි. ඒ නිසා තමයි මේ ධර්මය විවර කරන්නේ. හැබැයි මේ පටිසෝතගාමී දේශනයක් කරන එක නම් පහසු නැහැ. ඒ සත්‍යය ධර්මය දැකිය යුතු වෙනවා. ධර්මයේ කෝණයෙන් බැලිය යුතු වෙනවා. ඒ අතිශයින් දුර්ලභයි.

**"දුර්ලභං මනුස්සත්තං - දුර්ලභං සද්ධර්ම ශ්‍රවණද - දුර්ලභං පතිරූප දේශ වාසෝච - දුර්ලභං ක්ෂණ සම්පත්ති"**

මේ දුර්ලභ කාරණයි. අද ඒ සත්‍ය සද්ධර්මය ගන්න ඕන. ඔව් අපි සත්‍යය හෙළිකරනවා. එය භාරගැනීම නොගැනීම ඔබගේ කටයුත්තක්. අදත් අපිත් දකිනවා මේ සත්‍යයට අවදිවන ඒ සත්‍යය හඳුනාගන්න ඒ ප්‍රඥාවන්තයින් මේ දීපය තුළ නැතුවා නොවෙයි.

අධ්‍යාත්මිකව දියුණු පිරිසකුත් මේ රටේ දුර්ලභව හරි භික්ෂූන් වහන්සේලා වැඩසිටිනවා. නැත්තන් මේ දේශනා අහන්නේ නෑ. මේ දේශනාවලට ඔහු සවන් දෙනවා. අපි ඒ සත්‍යය කතා කළ යුතුයි. අපි එකයි කිව්වේ බුදුන් වහන්සේගෙන් ප්‍රශ්න අහනවා, බුදුන් වහන්සේ පිළිතුරු

දෙනවා. අන්‍ය ආගමිකයෝත් ප්‍රශ්න අහනවා බුදුන් වහන්සේ පිළිතුරු දෙනවා.

මේ ධර්මය තුළින්මයි ඔබගේ රැකවරණය වන්නේ. මේ නිවන් මඟ හැර ඔබට නෑ වෙන කතාවක්. දැස් අරින්නට කාලයයි කීවේ අන්න ඒ නිසයි. අපගේ ඒ උතුම් ධර්මය අපි නැවතත් විවර කරගත යුතු වෙනවා. ඒ මඟ අප යා යුතු වෙනවා. ඒ තුළින් අපගේ ඒ අධ්‍යාත්මිකව ඒ දියුණුව නැවත සාදා ගත යුතු වෙනවා

දැන් මේ ජබ්බි සෝධන සූත්‍රය තුළ පෙන්වන්නේ මෙන්න මේ පිරිහීමේ, තවත් මේ පිරිහීමට හේතුවන කාරණාව ඒ තමයි මේ රහත්බව, මේ රහත් කියලා කියන එක. මේක බුදුන් වහන්සේ කියනවා පිළිගන්න එපා කියල ඒ

**ඛීණා ජාති, වුසිතං** අර විදිහටම කියයි කියනවා. රහතන් වහන්සේගේ වාක්‍ය ඒ විදියටම කියයි කියනවා.

**'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති'**

කියලා ඒ විදිහටම කියයි කියනවා. හැබැයි පිළිගන්න එපා මහණෙනි කියලා කියනවා. ඒක අභිනන්දනය කරන්න එපා. ඒක අගය කරන්නත් එපා කියනවා. අන්න බුදුන් වහන්සේට ඊට පස්සේ ප්‍රකාශ කරනවා මේ රහත් භාවයේ, තියෙන ඒ උතුමන් වහන්සේ ගේ මෙන්න මේ ස්වභාවය තිබිය යුතුයි කියල. මේකෙදී කාරණා විශාල ප්‍රමාණයක් බුදුන් වහන්සේ හෙලි කරනවා.

බුදුන් වහන්සේ මෙතන මාතෘකා වලින්ම ඒ **උපාදානස්කන්ධයේ ස්වභාවය,** රහතන් වහන්සේගේ

ස්වභාවය, **ඒ ධාතු ස්වභාවය,** තුළ රහතන් වහන්සේගේ ස්වභාවය; **ඒ ආයතන ස්වභාවය** තුළ, රහතන් වහන්සේගේ ස්වභාවය කෙසේ විය යුතුද? **ඒ ආශ්‍රව කෙලෙස් වල ස්වභාවය** රහතන් වහන්සේගේ කෙසේ විය යුතුද, ඒ විතරක් නෙමෙයි **ඒ ආයතන පිනවීම - ඉන්ද්‍රිය සංවරය** රහතන් වහන්සේගේ කෙසේ විය යුතුද? **ඒ සිව්පසය** රහතන් වහන්සේගේ කෙසේ විය යුතුද? ඒ විතරක් නෙමෙයි, **ඒ පංච නීවරණ** රහතන් වහන්සේගේ කෙසේ දැකිය යුතු ද? මේ සාමාන්‍ය ඕනම කෙනෙකුට මෙන්න මේ ස්වභාවය නැත්නම් රහතන් වහන්සේ නමක් නෙමෙයි කියන එකයි කියන්නේ. මේ ජබ්බි සෝධන සූත්‍රය තුළ **මහෝපදේශ කෙසේ විය යුතුද, චතුරාර්ය සත්‍ය** කෙසේ විය යුතුද? **ඒ ආශ්‍රව ධර්ම කාමාශ්‍රව, දිට්ඨාශ්‍රව, භවාශ්‍රව** කෙසේ විය යුතු ද? මෙන්න මේ කාරණා අඩංගුව නොවේ නම් මහණෙනි ඔහු කටමැන දෙඩවිල්ලක් පමණි. හැබෑම රහතෙක් නෙමෙයි කියන එක බුද්ධ දේශනයෙන්ම පැහැදිලි කරනවා. මෙය ඔබ මනා කොට සවන් දිය යුතුමයි. ඔබ මේ මෙය නිරීක්ෂණය කළ යුතුමයි. විමර්ශණය කළ යුතුමයි.

සැබෑම රහතන් වහන්සේලා හඳුන ගන්න ජබ්බි සෝධන සූත්‍රය බලන්න. ඔබට ම වැටහෙයි රහත් බව යනු කුමක්ද කියලා? ඔය සූත්‍රයේ ඒ ගැන කතා කරනවානම් දීර්ඝ පැහැදිලි කිරීමක් මේ සූත්‍රය තුළ තියෙනවා. එක කාර්ණාවෙන් කාර්ණාව දීර්ඝව පැහැදිලි කරනවා.

කෙසේ දන්නා වූ ද, කෙසේ දක්නාහු ද ආයුෂ්මත්හු ගේ සිත මේ සතර වෝහාරයන් කෙරෙහි යම්කිසි උපාදාන වශයෙන් නොගෙන "මේ සතර වෝහාර ගැන බුදුන් වහන්සේ කියනවා කෙසේ දක්නා කෙනාද? අන්න රහතන්

වහන්සේගේ ස්වභාවයත් මෙතැනදී කියනවා. **සතර වෝහාර කෙසේ දක්නා කෙනෙක්ද?** කියලා මේ එක මාතෘකාවක් විතරයි.වෝහාර කියන මාතෘකාව "ලද්දෙහි දෘෂ්ටිවාදී" **බව. අසන ලද්දෙහි, දක්නා ලද්දෙහි දෘෂ්ටි බව. දෘෂ්ටිගත වෙලා ඉන්නේ. අසන ලද්දෙහි භාවී සෘතවාදි බව. ඇසුනු දේ හරි කියලාත් ගන්නවා. දැනුනු ගන්ධය, තුළ, මුතේ තුළ, ඒ කියන්නේ ගන්ධ, රස, උණුසුම සීතල ගතිය, මුතේ මුත වාදිය. ඒ ධර්මලාම්භන සංඛ්‍යාත විඥ්ඥාණය, විඥානවාදී බවයි.**

ඇවැත්නි භාග්‍යවත් වූ සියල්ල දන්නා වූ සියල්ල දැන් මේ විදිහට කියලා කියනවා බුදුන් වහන්සේම පැහැදිලි කරනවා වෝහාර. සතර වෝහාර කිව්වේ මෙන්න මේ කාරණා මොනවද සතර වෝහාර

**"දිට්ඨ, සුත, මුත, විඥානත"**

මෙන්න මේ ගැන මනා අවබෝධය. ආයුෂ්මත් හි සතර වෝහාර කෙරෙහි උපාදාන වශයෙන් නොගෙන උපාදාන කර ගන්නේ නෑ. **ඒ කියන්නේ දැකපු දේ උපාදානය කර ගන්නේ නෑ. ඇසුනු දේ උපාදනය වෙන්නේ නෑ. දැනුණු දේ උපාදාන වෙන්නේ නෑ. ආශ්‍රවයන් කෙරෙන් මිදුණේ ය. එය ආශ්‍රවයන් කෙරෙන් මිදීලා.** එතකොට මේ පරිවර්තනය පෙන්වන කාරණාව අපට මේක දීර්ඝ පැහැදිලි කිරීමක් තියෙනවා. බොහොම කෙටියෙන් කොටස් වශයෙන් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

**මහණෙනි වැස නිමවූ බඹසර ඇති කළ, කරණීය කත කරණීය බහා තැබූ කෙලෙස් බර ඇති පැමිණි ඒ ස්වාඨ සංඛ්‍යාත රහත් ඵල ඇති පරික්ෂි වූ භව සංයෝජන ඇති මොනවට දැහැන් මිදුනු ක්ෂීණාශ්‍රව මහණට පිළිතුරු පවසන**

**පිණිස මේ ස්වභාවය විශේෂ ඇවැත්නි මම රූපාලම්භනයෙහි රාග වශයෙන් උප ගම්මන නැතිය. පටිඝ වශයෙන් අපගමන නැතිය. තණ්හා දෘෂ්ටි විසින් අනිශ්‍රිතවය. දැන් දැන් මේ රූපය ගැන කතා කරනවා. රූපාලම්භනය රාග වශයෙන් එන්නේ නැහැ, ඇලෙන්නේ නෑ, ගැටෙන්නෙ නෑ. ඒ අනිශ්‍රිතයි. ඇසුරු කරන්නේ නෑ. ඡන්ද රාගය වශයෙන් ප්‍රතිබද්ධ නොවීය ඒකට ඇලෙන්නේ නෑ. අභිනන්දති අභිවදති, අජ්ඣෝසායති තිට්ඨති' කියන තැන මේ පැහැදිලි කරනවා. එන අරමුණු සෑම අරමුණක්ම එතකොට රහතන් වහන්සේගේ මෙලෙස සත්‍ය දැකලා මිදෙනවා. වර්ණයක් ඇසින් දැකපු ආරම්මණයත්, කනින් අහපු ශබ්ද ආරම්මණයත්, වර්ණ ආරම්මණයත්, ඒ දැනීම ආරම්මණ, ඒ මනෝ ද්වාරයෙන් ආවත් ඒ විඤ්ඤාණයෙන් ආවත් ඒ මනෝ විඤ්ඤාණය ආවත් ඒ ආරම්මණය මේ කුමන සිතක් පහල වුනත් ඒ සිතට ඇලෙන්නේ නැහැ, ගැටෙන්නේ නෑ. ඒ සිතේ ඇසුරු කරන්නෙත් නෑ බැස ගන්නෙත් නෑ.**

"න අභිනන්දති" කියන තැනට එනවා මේ රහතන් වහන්සේගේ ස්වභාවය.

මේ එක කාරණාවක් විතරයි මේ කියන්නේ. මේ වගේ කාරණා විශාල ප්‍රමාණ බුදුන් වහන්සේ දේශනා කරනවා බලන්න. මේ පළවෙනි කාරණාවත් මේ හැම කාරණාවක්ම ඔබට වැටහෙයි කියන කොට. එක කාරණාවකට වත් දැන් ඉන්න ඔය රහත් කියන අය ගැලපෙන්නෙ නෑ කියලා. ඔව් ඒකයි ඇත්ත. ඔබ රැවටෙනවා විතරයි.

**"ඡන්ද රාගය වශයෙන් ප්‍රතිබද්ධ නොවීය. කාම රාගයෙන් මිදුණේය. කෙලෙසුන් කෙරෙන් විසංයුක්ත වූයෙන් විගත ඒ සිතින් යුක්තව වාසය කරයි"**

ඒ සියල්ලෙන් මිදිලා වාසය කරන්නේ! බලන්න මේ කියන කාරණා

**ඇවැත්නි, මම ශබ්දාලම්භනයෙන්, ගන්ධාලම්භනයෙන්, රසාලම්භනයෙන් ඒ රාග වශයෙන් උපගමනය නැතියෙමි. ඒ පටිසරම්භනයෙන් ප්‍රතිපටිස වශයෙන් අපගමනය නැතියෙවු. ඒ කියන්නේ උපගමනය කියන්නේ ඒකට ඇලෙනවා. අපගමනය කියන්නේ ඇලෙන්නෙත් නෑ. ගැටෙන්නෙත් නෑ. තෘෂ්ණා දෘෂ්ටි විසින් අනිශ්චිත ඒකට ආසාව ඇසුරු කරන්නෙත් නෑ. තෘෂ්ණා, දෘෂ්ටි විදිහට අරගෙන ඡන්දරාගය විසින් පටිබද්ධ නොවීය. කාමරාගයෙන් මිදුණේ ය. කෙලෙස් කෙරෙන් විසංයුක්ත වූවෙමි. කෙලෙස් හටගන්නේ නැහැ. විසංයුක්තයි. විගතව. ඇවැත්නි, මෙසේ දන්නා වූ, මෙසේ දක්නා වූ, මාගේ සිත මේ සතර වෝහාරයන් කෙරෙන් උපාදාන වශයෙන් නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදුනේ යැයි කියෙමු.** මෙන්න මේ රහතන් වහන්සේගේ ස්වභාවයට එක උපමාවක්, බුදුන්වහන්සේ දෙනවා. මේ වගේ කාරණා දහයක් විතර බුදුන් වහන්සේ ඊටත් වැඩිය මේ සූත්‍ර තුළ ඉදිරිපත් කරනවා. මේ එකක් විතරයි අද ඔබට අසන්න ලැබෙනනේ. හැබැයි, මේ වගේ හැම කාරණාවක්ම ඔබට ඉස්මතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. කොටස් වශයෙන් ඉදිරිපත් කරන්න සිද්ධ වෙනවා.

මහණෙනි ඒ මහනවූන්ගේ භාෂිතය මැනවයි අභිනන්දනය කළ යුතුය. අනුමෝදනය කළ යුතු වෙනවා මැනවයි භාෂිතය **අභිනන්දනය** කොට අනුමෝදන්ව මතුවී ප්‍රශ්නයක් පිලිවිසිය යුතුය. අන්න ඒ අභිනන්දනය. දැන් මෙන්න මේ විදිහට තියෙනවානම් මේ මිදුණ මෙන්න මේ මිදුණ ස්වභාවය තියෙන ඒ මහණ, මෙන්න මේ රහතන්

වහන්සේගේ ස්වභාවය තමයි බුදුන් වහන්සේ මේ පැහැදිලි කළේ. එන අරමුණු වලින් මිදෙන ස්වභාවය. ඒ අරමුණු වලින් මිදෙන ස්වභාවය මේ මිදෙන ස්වභාවය, මේ මිදුණු ඒ ආශ්‍රව **අනිශ්‍රිත** වෙන්නැත්නම්, අරමුණු වලින් මිදිලා නම්, අන්න ඒ අභිනන්දනය කරන්න කියනවා. පිළිගන්න කියනවා. ඒ රහත් ස්වභාවයත් එතන රහත් ස්වභාවයක් තියෙන බව ප්‍රකාශ කරනවා. ඒක අනුමෝදන් වෙන්න කියනවා. මේක පිළිගන්න කියනවා.

**තස්ස, භික්ඛවෙ, භික්ඛුනො 'සාධූ'ති භාසිතං අභිනන්දිතබ්බං අනුමොදිතබ්බං. 'සාධූ'ති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උත්තරිං පඤ්හො පුච්ඡිතබ්බො. '''පඤ්චිමෙ, ආවුසො, උපාදානක්ඛන්ධා තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා.**

ඒක භාරගන්න කියලා කියන්නේ. අභිනන්දනය කරන්න කියන්නේ. මෙන්න මේ එක කාරණාවක් බුදුන් වහන්සේ මේ විදිහට සතර වෝහාරවලින් පැහැදිලි කරනවා. මේ රහතන් වහන්සේගේ ස්වභාවය මෙන්න මෙයයයි. එහෙනම්, භාරග න්න කියලා. **අනුමෝදි තබ්බා** කිව්වේ ඒක නිසයි. ඒ භාෂිතය **අභිනන්දනය** පිළිගන්න කියලා කිව්වා. ඒත් ප්‍රශ්නයක් පිලිසිය යුතුයි. තවත් ප්‍රශ්නයක්. ඒත් අහන්න කියලා. මේ විදියට තමයි දිගටම ප්‍රශ්න අහන ආකාරයෙන් තමයි මේ දිගටම යන්නේ.

ඇවැත්නි, භාග්‍යවත් වූ මේ සියල්ල දැන් ඔය විදිහට කියනවා ආයිමත්. සම්බුද්ධයන් වහන්සේ විසින් මේ පස්වැදෑරුම් උපාදානස්කන්ධයෝ මොනවට දෙසන ලදී. පළවෙනි කාරණය සතර වෝහාර. **අන්න ඊලග දෙවෙනි**

**කාරණාවට එනවා ඒකත් රහතන් වහන්සේගේ ස්වභාවය පෙන්වනවා. පංච උපාදානස්කන්ධයන්ගේ ස්වභාවය කෙසේ විය යුතුද?** කියන එක. එතනදීත් බුදුන් වහන්සේ ඒ විදිහටම මනා පැහැදිලි කිරීමක් කරනවා මේ පිළිබඳව. සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ මේ පස්වැදෑරුම් පංච උපාදානස්කන්ධයෝ මොනවට දේශනා කරන ලද. කවර පසෙක් යත් ඒ මෙසේය- රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ස්කන්ධයෝ. ඇවැත්නි, භාග්‍යවත් වූ සියල්ල දැන් ඒ විදිහට කියලා කියනවා. සම්බුද්ධයන් වහන්සේ විසින් මේ පංච උපාදානස්කන්ධයෝ මොනවට දේශන ලදහ. කෙසේ දන්නා වූ කෙසේ දක්නා වූ ඒ ආයුෂ්මතුන් ගේ සිත මේ මේ පංච උපාදානස්කන්ධයන් කෙරෙන්, උපාදාන වශයෙන් නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදුනේ වේද. මහණෙනි, දැන් ඒ පංච උපාදානස්කන්ධයන් කෙරෙන් මිදුනේ මොනවට දෙසන ලදී. එතකොට ආයුෂ්මතුන්ගේ ඒ පංච උපාදානස්කන්ධයන් කෙරෙහි උපාදාන වශයෙන් නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදුනේය. කෙලෙස්, ආශ්‍රව, කෙලෙස් උපාදාන කර ගන්නේ නැතුව දැන් මේ සතර වෝහාර ගැන පැහැදිලි කරන කොට අපට තේරුණා, එන අරමුණේ සත්‍ය දැකලා මිදෙන තැන. ඒකට ඇලෙන්නෙත් නෑ, ගැටෙන්නෙත් නෑ. **අනිශ්‍රිතයි.** ඒක **නිශ්‍රිත** වෙන්නෙත් නෑ. හැබැයි, ඊටපස්සේ කියනවා පංච උපාදානස්කන්ධයත් හැබැයි, එහෙනම් උපාදාන වෙන්නේ නෑ. එතනම ඒ කාරණාව පැහැදිලි කරනවා. ආශ්‍රව කෙලෙසින් මිදුණේ ය කියන එක.

අර විදිහටම කියනවා **ඛීණා ජාති, වුසිතං.** අන්න ඒ විදිහට කියලා කියනවා, **බඹ සර කරන ඒ බහා තැබූ කෙලෙස් බර ඇති පැමිණි රහත්ඵල ඇති ඒ ක්ෂීණාශ්‍රව, ඒ**

පරික්ෂීන සංයෝජනය ඇති ක්ෂීණාශ්‍රව මහණවුන්ගේ ප්‍රශ්න ව්‍යාකරණය මේ ස්වභාවය වෙයි. ඔන්න දැන් පැහැදිලි කරනවා.

ඇවැත්නි, මම රූපය ඒ විරාගය අනස්වාසීත ඒ රූපයෙහි ස්වභාවය මම රූපයේ අබලය, මම රූපයේ ඇලෙන්නේ නෑ, එතකොට රූපයෙහි උපයෙ උපාදාන කෙනෙක් ඇත්ද? සිත පිළිබඳ අධිෂ්ඨාන අභිනිවේස අනුශය කෙනෙක් යම් ඇත්ද? ඒ ක්ෂය හේතුවෙන්, විරාග හේතුවෙන්, නිරෝධ හේතුවෙන් නිබ්බිදන්ති, විරාගන්ති, නිරෝධන්ති කියන අර ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේගේ ඒ ස්වභාවය ඒක ඇලෙන්නෙ නෑ, ඒකට විරාගයක් ඇති වෙනවා. එන අරමුණුවලට ඇලෙන්නෙ ගැටෙන්නෙ නැති ස්වභාවය ඒ උපාදානස්කන්ධයෙන් මිදෙන ස්වභාවය තුළ එය පැහැදිලි කරනවා. විරාග හේතුවෙන්, නිරෝධ හේතුවෙන්, ත්‍යාග හේතුවෙන් හැරපියෙම් හේතුවෙන් මාගේ සිත මිදුණැයි නුවණින් දනිමි. මිදුණු බවත්, සිත ඒ කියන්නේ බැස ගන්නේ නෑ. සිත සිතෙන් මිදෙන බව අපි කිව්වේ ඒකයි. චිත්ත විමුක්තියක් ගැන. අපි කිව්වේ ඒකයි. මේ රහතන් වහන්සේගේ චිත්ත විමුක්තිය තුළ දෙයක් ප්‍රකට වෙන්න බෑ. නිමිති ප්‍රකට වෙන්න බෑ. මහා නුවණකින් ඒ ධර්මය දකින කෙනාටයි ඇත්තටම මේක වැටහෙන්නේ.

දන්නහුටයි, දක්නහුටයි -ජානතෝ පස්සතෝ කියපු තැනින්. ඔබගේ යම් අවබෝධයක්ද අපි දන්නවා මේ බුද්ධෝත්පාද නාලිකාව තුළ මේ සවන් දෙන අයට දැන් මනා අවබෝධයක් ඇති වෙලා තියෙනවා. මේ නිවන් මග ගැනත් ඒ නිවන් දැකීම යනු කුමක්ද? ඒ තුළ කුමක්ද සිදුවන්නේ කියන එක. ඒ අනුව දන්නවා දැන් සාමාන්‍ය විදිහටම හැසිරුණත් කටයුතු කළත් ඒ කිසිවකට බැස ගෙන නැති බව.

අභිනන්දනය කරන්නැති බව. ඒවා පස්සේ දුවන්නේ නැති බව. අනුව්‍යාජන හදන්න නැති බව. ඉතින් ඔබ මේ භාෂ්‍යයට ලක්වෙලා තියෙන රහත් භාවයට සාධාරණයක් විය යුතුයි. අද සමාජයේ මේකත් මහා ව්‍යසනයක් බව ඔබ දැකිය යුතුයි. මේක සුළුපටු කාරණාවක් නම් නොවෙයි. මෙය දුගතියට පාර වෙනවා. යමෙක් මේවට රැවටෙනවා කියන්නේ ඒ ශ්‍රාවකයින් පවා දුගති පරායන වෙනවා. දෙව්දත්ට පැහැදුණාට වැඩක් වෙන්නෙ නෑ, ඒ පිරිසම දුගති පරායන වෙනවා. ඔබ දන්නවා කඨින සිවුරක් පූජා කරන්න ඡන්දයක් විමසනවා. දෙව්දත් සැරියුත් දෙනම ඉන්න තැන. එතනදි මිනිස්සු ඡන්දය දෙන්නේ දෙව්දත්ට. ඇයි ඒ, දේව්දත් මල ගෙවල් වල එනවා. දෙව්දත් දාන ගෙවල් වල එනවා. දෙව්දත් තමයි ගෙවල් වල යන්නේ. මේ ඔක්කොම ඉෂ්ට කරලා දෙනවා කියන එක. එක නිසා දෙව්දත්ට තමයි ඡන්දය දෙන්නේ මිනිස්සු සැරියුත් හිමියන්ට නෙවෙයි. ලක්ෂයක් වටින කඨින සිවුර පූජා කරන්න ඡන්දයක් විමසුවාම දෙන්නේ දෙව්දත්ටයි ඡන්දෙ. සැරියුත් හිමියන්ට නෙමෙයි. අදත් ඒකමයි තියෙන්නෙ ඔබ ලාභ බොළඳ දේ පස්සේ හඹා ගෙන ගියාට ඔබ යන්නේ දුගතියටයි. දෙව්දත් දුගතියට ගියේ කෙසේද? එලෙසින්ම දෙව්දත් ගිය මග යන අයත් දුගතියටමයි වැටෙන්නේ. ඒ ශ්‍රාවකයෝ දුගතියටම යනවා.

සාදු සාදු කිය කියා දුගතියට යන අය අද ඉන්නවා ඔබට දකින්න ලැබෙයි. දෙව්දත් ගාවටත් ගියේ සාදු සාදු කිය කිය. දෙව්දත් ට අසපු හැදුවා රජවරු. අජාසත්ත රජ්ජුරුවෝ විශාල අසපු හැදුවා. දෙව්දත් ට තියෙන සත්කාර සේරම කරා. ඒ අමූලිකා ශ්‍රද්ධාවයි.

දෙව්දත් ගිය පාරේ යන අය දෙව්දත්ගේ සිද්ධ වෙච්ච දේම නේද වෙන්නේ. අදත් ඒ දේම වෙනවා. හරිම කණගාටුයි.

අපිට කරන්න පුළුවන් දේ සත්‍ය හෙලිකිරීම පමණයි. කල්‍යාණ මිත්‍රයා මඟ පෙන්වනවා පමණයි ආනන්දය, ජේතවනාරාමයට එන ආකාරයක් කියයිද ජේතවනාරාමයට එන පාරක් පෙන්වයිද? ඔවුන් වෙන කොහෙවත් යයි නම් මම කුමක් කරන්නද? ආනන්දය "**මෙන්න මේක තමයි බුද්ධ වචනය.** කල්‍යාණ මිත්‍රයා පණිවිඩය කියනවා පමණයි. ඒ මඟ යැම ඔබේ කටයුත්තක් අපි අපේ යුතුකම ඉටුකළා පමණයි. ඔබට ඔබගේ දෑස් දිහා බලන්න. ඔබම ඔබ දිහා බලන්න. ඔබ යන්නේ කොහාටද කියලා. ඔබට යමක් වැටහේවි. ඒ තුළ ඔබ එය ගලපා ගනියි. මේ ඔබගේ ජීවිත කතාව රැල්ලක් පස්සේ ලොකු සෙනගක් දැක්කට පලක් නෑ. ඔබ ඉන්නෙත් ඒ කුණු ගොඩ වගේ වේවි. සත්‍ය සොයා ගන්න. සත්‍ය සත්‍යයක්මයි. සත්‍ය හරි දුර්ලභයි. ඒ රැල්ලට යන මුහුදු රැල වගේ නෙවෙයි. එය හරි නිහඬයි. ඔබට එය නොපෙනේවි. ඔබම දුගතියට වැටේවි. "**අහෝ දෙව්දත් නොදුටු මොක්පුර**" අද අපට කියන්න වෙන්නේ මුළු රටේම ජනතාවට - "**අහෝ වැසියෙනි නොදුටු මොක්පුර**"

අදත් ඒකමයි වෙලාත් තියෙන්නේ. නිවන් මග හඳුනාග න්න. ඔය වැරදි පාරවල යන්න එපා. බුදුන්වහන්සේ භවය චුට්ටක්වත් පතන්නෙ නෑ. සූත්‍රවල බුදුන් වහන්සේ බ්‍රහ්මයෝ, නිගණ්ඨයෝ, ජටිලයෝ ඒ නිවැරදි පැත්තට ගන්න ඔවුන් සමග ගැටෙන් නැතුව ඔවුන් කියපු දේට හා හා කිව්වා ඒවා අද කියනවා බුදුන් වහන්සේ කියපු දේවල් කියලා. බුදුන් වහන්සේ කිව්ව මේ දුගතියෙන් යන්න කියලා දිව්‍යලෝකෙ කියලා කියනවා. එහෙම දේවල් බුදුන් වහන්සේ කියලා නෑ. මුල මැද අග ගලපලා දේශනයක් කරන්න. බාගෙට කියලා නවත්වන්න එපා. බුදුන් වහන්සේ මේව සම්පූර්ණ රවුමක්

ගිහිල්ලයි යනව කතාව නිවනටම. දානයක් ගැන කතා කළත් අනේ තිරිසන් සතාට දෙන දානෙන් පටන් අරගෙන බුදුන් වහන්සේ දුස්සීලයට, සිල්වතාට, රහත් ඵල උතුමන්ට, බුදු කෙනෙකුට දෙන දානය ගැන කියල නැවැත්තුව ද නැහැ. දාන දාහක් දෙනවට වඩා වැඩිය මේ ධර්මය එකම මොහොතක් දැකලා නිවන් මග යන වානම් ඒකයි අගය කළේ. අද කියන්නේ දානය ගැන විතරයි. අවසානෙට අර කියපු නිවන ගැන කතා කරන්න නැහැ. ධර්ම දානයයි උතුම්ම දානය.

එහෙනම් අසදිසි මහා දානය දීපු මල්ලිකා දේවිය ඇය දුගතියට වැටුනේ? අසූහාර දාහක් වෙහෙර විහාර හදපු අශෝක අධිරාජයා ඇයි දුගතියක වැටුනේ. කර්මඵලය බුද්ධ දේශනයක් නෙමෙයි කිව්වේ අන්න ඒ නිසයි. මහරහතන් වහන්සේ නමක් බුදුන් වහන්සේ හඳුන්වනවා දැකලා තියෙනවද? අස්සජි මහරහතන් වහන්සේ

**"යේ ධම්මා හේතුප් භගවා - තේසං හේතු තථාගතප් තෝ"**

ඒ තථාගතයන් වහන්සේ හේතුඵල දහමයි දේශනා කළේ කියන්නේ. මේ හේතුඵල දහම ඔබ දකින්න අනාත්ම ධර්මයක් විදිහට. ඒ දම්සක් පැවසුම් සූත්‍රය තුළ දේශනා කරන්නේ අන්න ඒ අනාත්ම ධර්මයයි. මහණෙනි, ඇස අනිත්‍ය ද නිත්‍ය ද, ඇස අනිත්‍යයි ස්වාමීනි, එහෙනම් එය දුකයි ද මහණෙනි, එහෙනම් එක ආත්ම වශයෙන් ගන්න පුලුවන්ද ?

**"නෝ හේතං බන්තේ"**

මේ අනාත්ම ධර්ම දැක්කේ නැත්නම් ඔබ යන්නේ මොක්පුරද? නෑ ඔබ යන්නේ කොහෙද? දෙව්දත් ගිය පාරේ.

අනාත්ම ධර්මය දකින්න. හේතුඵල දහම තුල ඔබට ආත්මයක් හමුවන්නේ නෑ

**"ඉමස්මිං සති ඉදං හෝති**
**ඉමස්මිං අසති ඉදං නහෝති**
**ඉමස්මිං උප්පද්දා ඉදං උප්පජ්ජති**
**ඉමස්මිං නිරෝධා ඉදං නිරුජ්ජති"**

කිව්වේ

**"මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ. මේ උපාදාන කල්හි මෙය උපදී. මෙය නිරුද්ධ වුන කල්හි මෙය නිරුද්ධ වේ".**

මොකක්ද? මේ කියන්නේ මහණෙනි, ඇස ලෝකයයි. හැබැයි ඇසෙන් එන වර්ණ, ශබ්ද මේ ආයතන ටිකෙන් හැදුනු ආත්මය, ඇසට එන වර්ණය තුළ ආත්මයක් නැහැ මහණෙනි. කනට එන ශබ්දය තුළ ආත්මයක් නෑ මහණෙනි. හැබැයි මේවා එකතු වෙලා අපිට ආත්මයක් හැදෙනවා මහණෙනි. අන්න ඒ ආත්මීය ඇත්තක් නෙවෙයි කියන එකයි අනාත්මයි කියලා කිව්වේ. ඒකයි ඇස අනාත්මයි කියලා කිව්වේ. මහණෙනි ඇස ලෝකයයි කියලා කිව්වා වගේම අර අනාත්මය දැක්කොත් අන්න ලෝකයෙන් මිදෙනවා. අන්න "විනෙයා ලෝකෝ" කිව්ව තැනින් අවිද්‍යා දෝමනස්සය අන්න සියලු දුකින් මිදෙනවා. තේරුණාද? ඒ කියපු එක. ඇසින් හදාගත්ත ලෝකයක් කියන්නේ එලියේ තියෙන එකක් නෙවෙයි. "සළායතන ලෝකෝ ලෝකෝ" කිව්වෙ" චිත්තේන නීයති ලෝකෝ" කීවේ ඒකයි.

රෝහිතත්ත ලෝකය බාහිරින් හොයන්න එපා කිව්වේ එකයි. ඔබ ඇයි රැවටෙන්නේ දැන් බාහිර දෙයක් නැත්නම්

ඔබට කොහොමද ඔය ආමිස කියන ඔක්කොම බලන්න ඔබට කරන්න පුළුවන්ද? කියලා. ඔන්න ඕකයි මහණෙනි, බුද්ධ ධර්මය පෙර නොඇසූ විරූ දහමක් වෙන්නේ ඒකයි. **"පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු"** කියලා කිව්වේ. සියලු සත්වයෝ ඉන්නේ බාහිර ඇත්ත කරගෙන.

ඔබට පෙර නොඇසූ විරූ දහම හමුවෙලා නැහැ. දස සංයෝජන වල මෙය අවිද්‍යාවයි, මාන්නයයි එකට තියෙන්නේ. **"අවිද්‍යා අශේෂ විරාග නිරෝධෝ"** කියන්නේ ඔබට නෑ නිරෝධ මගක්. ඔබ ඉන්නේ රැවටීමක. අවිද්‍යාව කියලා දැක්කේ නැත්නම්. කොයි මොහොතේ හෝ කෙනෙක්ගේ හුස්ම යනකොට ඉවරයි කතාව.

බෞද්ධයිනි කවදද ඔබ **සම්මා දිට්ඨියට** එන්නේ. පොඩ්ඩක් ඇස් ඇරලා බලන්න. ඔබ අන්ධ වෙලා නම් අර බුදුන් වහන්සේ කිව්වා වගේ තමයි.

මහණෙනි ජේතවනාරාමය යන පාරක් කියයිද, එන ආකාරයක් කියයිද, ඔවුන් වෙන කොහේවත් යයි නම් අපි කුමක් කරන්නද මහණෙනි, මම කුමක් කරන්නද මහණෙනි කියලා අහනවා. දැන් මේ අපි ජබ්බි සෝධන සූත්‍රය පටන් ගත්තා විතරයි. තාම එක පිටුවයි කිව්වේ. මේකේ තියෙනවා පිටු 143 ඉඳලා 153 වෙනකම් පිටු දහයක් තියෙනවා. තාම කිව්වෙ එක පිටුවයි. ජබ්බි සෝධන සූත්‍රය කියවන සෑම කෙනෙක්ගේම දෑස් ඇරෙනවා. ඔබේ දැස් ඇරෙනවා. ඔබ බලන්න ඒ සූත්‍රය බුදුන් වහන්සේ විශාල පර්යායක් පැහැදිලි කරනවා. හොර රහතන් ලා ගැන. ඒ තරම් පැහැදිලි කිරීමක් අද වෙන තෙක් කවුරුත් කරලා නැහැ. ඒ තරම් විශාල පැහැදිලි කිරීමක් මේ හොර රහතන් ගැන බුදුන් වහන්සේ

ජබ්බි සෝධන සූත්‍රය තුළ කරනවා. හොඳයි එහෙනම් මේ සමාජය නම් අවදිවෙන්න ඕනා. ඒ අවදි වීමට මේ හේතුවයි. හැමෝටම ඒ නිවන්මග හමුවෙන්න ඕනා. හොඳමයි, අපි නැවතත් ජබ්බි සෝධන සූත්‍රයෙන් හමුවෙමු.

තෙරුවන් සරණයි!!!

# ජබ්බි සෝධන සූත්‍රය - 02

**දෙවන කොටස මජ්ඣිම නිකායේ 3 වන කාණ්ඩයේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ 12වන ග්‍රන්ථයේ 143 වන පිටුව**

මීට පෙර එහි මුල් කොටස ඔබට, ඉදිරිපත් කළා. එතනදි රහතන් වහන්සේගේ ස්වභාවය රහතන් වහන්සේ මම රහත් වුණා කියලා රහත් භාවය ප්‍රකාශ කළොත් යම් කිසි භික්ෂුවක් මම රහත් යැයි එය පිළිගන්න එපා කියලා, බුදුන් වහන්සේ දේශනා කළ වදාලා. එතකොට බුදුන් වහන්සේ එතැනදී ජබ්බි සෝධන සූත්‍රය තුළ පැහැදිලි කරනවා, කෙලෙස නම් ඒ රහත් භාවය යමෙක් ප්‍රකාශ කරන්නේ නම් කෙලෙස නම් රහතන් වහන්සේ නමක් හඳුනා ගන්නෙම් ද කියලා. මම රහතන් වහන්සේ නමක් කියලා කිවූ පමණින් එය බාර ගන්න එපා කියලා බුදුන් වහන්සේ මනා කොට පැහැදිලි කරා. බුදුන් වහන්සේ

**"ඛීණා ජාති, වුසිතං, නාපරං ගත්තං"**

කියලා කිව්වත් බාර ගන්න එපා කිව්වා. එතකොට මම රහත් කිව්වට පිළිගන්න එපා කියලා බුදුන් වහන්සේම දේශනා කර වදාළා ජබ්බි සෝධන සූත්‍රය තුළ. බුදුන් වහන්සේම පැහැදිලි කරනවා කෙසේද රහතන් වහන්සේගේ ස්වභාවය කියලා. අන්න එතනදි බුදුන් වහන්සේ මෙන්න මේ කාරණා ගණනාවකින්ම බුදුන් වහන්සේ මෙන්න මේ ස්වභාවය

ඇත්තේ නම් ඔවුන් රහතන් වහන්සේ නමක් කියලා ප්‍රකාශ කරනවා. මොන ගුණද රහතන් වහන්සේ ගාව. එතකොට මොන ස්වභාවද මොන අවබෝධයද තියෙන්න ඕනේ. රහතන් වහන්සේ නමක් කියලා කවුරු හෝ කියනවා නම් එය ඔහුගෙන් ප්‍රශ්න කරන්න කියලා බුදුන් වහන්සේ කාරණා ප්‍රකාශ කරා. එතකොට ඒකේ **මුල් කාර්ණාව විදිහට අපි ගිය පාර දේශනය ඉදිරිපත් කළා. සතර වෝහාර ධර්මයෝ රහතන් වහන්සේගෙන් ප්‍රශ්න කරන්න කියලා බුදුන් වහන්සේම ඒ මුල් කොටසෙදි අපි ඔබට පැහැදිලි කළා.**

සතර වෝහාර ධර්මයෝ කියලා බුදුන් වහන්සේ කුමක්ද පැවසුවේ

**දිට්ඨෙ දිට්ඨවාදිතා, සුතෙ සුතවාදිතා, මුතෙ මුතවාදිතා, විඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා - ඉමෙ ඛො, ආවුසො, චත්තාරො වොහාරා තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා.**

එතකොට මෙතනදී දිට්ඨේ දිට්ඨ වාදිතා කියලා කිව්වේ, සුතේ සුත වාදිතා කියලා කිව්වේ, මුතේ මුත වාදිතා කියලා කිව්වේ, විඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා කියලා කිව්වේ කුමක්ද? **ඒ කියන්නේ ඇසින් දෙයක් බලල දුටු දේ, දෙයක් කියලා ගන්නවා නම්, කනින් අසන දේ දෙයක් කියලා ගන්නවනම්, දැනෙන දේ දෙයක් කියලා ගන්නවනම්, ඒ කියන්නේ දිට්ඨ, සුත, මුත. මුත කියන්නෙ (ඝාන ප්‍රසාදය - ගන්ධය, ජිව්හා ප්‍රසාදය - රස හා කායප්‍රසාදය - උණුසුම් සීතල, තද ගතිය) මේ දැනීම්, උණුසුම් සීතල, තද ගතිය, ගන්ධ, රස.** මෙන්න මේ දිට්ඨ, සුත, මුත, විඥානත කියන දුටු දේ, දෙයක් කියලා ගන්නවා නම්, ඇසුණු දේ දෙයක් කියලා ගන්නවා නම්,

දැණුනුදේ දෙයක් කියලා ගන්නවා නම්, ඒ විඥානතයෙන්, ඒ මනෝ විඥානයෙන් ඔබට ඒ එන ආරම්මන එය දෙයක් කියලා ගන්නවනම්, ඒ අරමුණුවල ඔබ දෙයක් දකිනවා නම් එතන රහතන් වහන්සේ නමක් නෑ.

**අරමුණේ දෙයක් නැති බව දකිනවා නම්, ඒ අරමුණේ නිමිත්ත ප්‍රකට වෙන්නේ නැති නම්, දෙයක් කියලා ගන්නේ නැත්නම්, අන්න එතනයි ඒ කියන්නේ දැකපු දේ දෙයක් කර කරගන්නේ නැත්තම්, ඇසුනු දේ දේ දෙයක් කර ගන්නේ නැත්නම්, දැනුණුදේ දෙයක් කරගන්නේ නැත්නම්, සිතුන දෙයක් කර ගන්නේ නැත්නම්, අන්න එතනයි රහතන් වහන්සේගේ ස්වභාවය.**

එයයි ප්‍රශ්න කරන්න කියලා බුදුන් වහන්සේ ඒ සතර වෝහාර ධර්මයෝ කියලා දේශනා කරන්නේ. අපි ඊගාවට පැහැදිලි කරා ගියපාර දේශනයේදී මහණෙනි, ඒ මහනවූන්ගෙ භාෂිතය අන්න, නැවතත් කියනවා ඇවැත්නි, නැවතත් ප්‍රශ්න කරන්න කියලා. ඒ කියන්නේ මතුවෙයි ප්‍රශ්නයක් පිළිවෙත් විය යුතුය. **අන්න, එතනදී බුදුන් වහන්සේ නැවතත් අර දෙවැනි ප්‍රශ්නය නැවතත් ප්‍රශ්න කරන්න කියනවා.** මේ රහත් භාවය ප්‍රකාශ කළොත් යම් කිසි භික්ෂුවක් සතර වෝහාර ධර්මයෝ ප්‍රශ්න කරලා නිකන් ඉන්න එපා කියනවා. නැවතත් ප්‍රශ්න කරන්න කියනවා. **පංචඋපාදානස්කන්ධයෝ කවරේද?** කියලා ඒ කියන්නේ මේ දැනුමට ආ **රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ තමයි පංච උපාදානස්කන්ධ කියන්නේ. ඔහොම දෙයක් නෙමෙයි. ප්‍රශ්න කරන්න කියන්න උපාදානස්කන්ධ කියන්නේ.** දැන් රහත් භාවය ප්‍රකාශ කළොත් යම් කිසි භික්ෂුවක් ඒ භික්ෂුවගෙන් මොකද්ද උපාදානස්කන්ධය කියලා කොතනින් හරි පංච උපාදානස්කන්ධය විග්‍රහ කරන්න

කිව්වොත් ඒ ඔහු යමෙක් පැහැදිලි කරනවා නම් ඒ පංච උපාදානස්කන්ධ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන මට්ටමෙන් නෙවෙයි ඊටත් වඩා, ඒ රහත් භාවය තුළ එය අවබෝධ කර ගත යුතු වෙනවා. එහෙනම් එය මනා කොට පැහැදිලි කළ යුතු වෙනවා. **රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ස්කන්ධ** කියන එක, ඕනෑම මේ දහම් පාසල් දරුවෙකු වුනත් දන්නවා, මේ පොත්වල තියෙනවා. එහෙම එකක් නෙමෙයි මේ කියන්නෙ. **මේ කියන්නේ රූප, වේදනා, සංඥා , සංඛාර, විඤ්ඤාණ කියන්නේ මේ ස්කන්ධයෝ කියන්නේ බාහිර එකක් නෙමෙයි. ස්කන්ධයෝ කියන්නේ අපි හදාගත්ත තැන් ස්කන්ධ කියන්නේ. ස්කන්ධ දුක්ඛා, ස්කන්ධ ඛායා කියන එක, පැහැදිලි කරන්න ඕනා. ඒ කියන්නේ ස්කන්ධ ඛායා, සක්කාය දෘෂ්ටිය ප්‍රහීණ වෙන්න ඕන, රහත් භාවය ලබන්න.** සක්කාය දෘෂ්ටිය ප්‍රහීණ වෙන්න නම් ස්කන්ධ ඛායා අවබෝධ කරන්න ඕනා. මොකක්ද? ස්කන්ධ ඛායා ඇසින් දෙයක් බලලා දෙයක් කියලා ගන්නවනම්, එය දෙයක් කියලා දැනෙනවනම්, එතනමයි ස්කන්ධය තියෙන්නේ. ස්කන්ධයෙන්මයි දෙයක් ගන්නේ.

**"ස්කන්ධා නං පාතිභාවෝ, ආයතනානං පටිලාභෝ, අයං උච්චචති ජාති"**

මෙන්න මේ ස්කන්ධය විග්‍රහ කරන්න ඕන. ස්කන්ධය ඔහු විසින් ඒ රහතන් වහන්සේ කියාලා කියන යමෙක් ප්‍රකාශ කරනවා නම් ඔහුගෙන් ප්‍රශ්න කරන්න කියලා බුදුන්වහන්සේ මෙතැනදී පැහැදිලි කරනවා

**"පඤ්චිමෙ, ආවුසො, උපාදානක්ඛන්ධා තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්මදක්ඛාතා. කතමෙ"**

එතකොට **කතමෙ පඤ්චඋපාදානක්ඛන්ධො- රූපූඋපාදානක්ඛන්ධො, වෙදනූඋපාදානක්ඛන්ධො, සඤ්ඤූඋපාදානක්ඛන්ධො, සඞ්ඛාරූඋපාදානක්ඛන්ධො, විඤ්ඤාණූඋපාදානක්ඛන්ධා**

ඇවැත්නි, භාග්‍යවත් වූ සියල්ල දැන් එතකොට, මෙන්න මේ විදිහට ඒ ස්කන්ධ ගැන ප්‍රශ්න කරන්න කියලා කිව්වා. ඒ ස්කන්ධයන්ගේ කෙසේද දන්නා වූ කෙසේ දක්නා වූ ආයුෂ්මතුන්ගේ පංච උපාදානස්කන්ධයන් කෙරෙහි උපාදාන වශයෙන් නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදුනේ දැයි එතකොට වැස නිම වූ බඹසර කළ දැන් එතකොට කෙලෙස් බර පැමිණි රහත් එල ඇති ඒ භව සංයෝජන ඒ ක්ෂීණාශ්‍රව දුරු කරපු ඒ මහණවූ ගේ ප්‍රශ්න ව්‍යාකරණය මේ ස්වභාවය.

ඇවැත්නි, **මම රූපය අබලය විරාගය අන්වාසික යැයි දැන රූපයේ හා රූප උපාදානං කෙරෙහි ඇත්ද? සිත පිළිබඳ අධිෂ්ඨාන අභිනිවේසන. ඒ කියන්නේ අනුසය කෙලෙස් ඇත්ද? ඒ ක්ෂය හේතුවෙන්, විරාග හේතුවෙන්, නිරෝධ හේතුවෙන් ඒ ත්‍යාග්‍ය හේතුවෙන් හැරපි හේතුවෙන් මාගේ සිත් මිදුනේ යයි නුවණින් දනිමි.**

ඇවැත්නි, '**මේ වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ඒ මම ඒ විරාහ උපාදාන කොට නොකොට, ඒ අභිනන්දනය කොට නොකොට, එය ක්ෂය හේතුවෙන්, විරාග හේතුවෙන්, නිරෝධ හේතුවෙන් අන්න, ත්‍යාග්‍ය හේතුවෙන් ඒ හැරපියා මෙසේ පංච උපාදානස්කන්ධයන් කෙරෙන් මිදුනේ උපාදාන වශයෙන් නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදුනේ මේ මහණවූගේ භාෂිතය මැනවයි අභිනන්දනය කළ යුතුය.**' ඒ කියන්නේ යමෙක් ඒ නිවැරදිවම ඒ විදිහටම **පංච**

**උපාදානස්කන්ධය අපි සිතින් එන අරමුණ දෙයක් කියලා එක ගන්නවා නම්, එය දෙයක් කියලා ගන්නේ නැත්නම්, දෙයක් කියලා ගත්තොත්, එතන රහතන් වහන්සේ නමක් නෑ. දෙයක් කියලා ගන්නේ නැත්නම් ඒ නුවණින් දැකලා දෙයක් නැති බව දැකලා එතන ඒ උපාදානස්කන්ධය දෙයක් කරලා ගන්නේ නැතුව උපාදානස්කන්ධයෙන් මිදෙන ඒ අරමුණේ සත්‍ය දැකලා මිදෙන තැන අන්න එතනයි. ඒ රහතන් වහන්සේගේ ස්වභාවය.** එතකොට මෙන්න මේ කාරණ වයි මේ පංච උපාදානස්කන්ධය බුදුන් වහන්සේ ප්‍රශ්න කරන්න කියලා කියන්නේ.

එතකොට **තුන්වැනි කාරණය එනවා. නැවතත් බුදුන් වහන්සේ දේශනා කරනවා මහණෙනි,** ඒ මහණුන්ගේ භාෂිතය දැන් එතකොට කිව්වා ඒවා පැහැදිලි කරනවා නම් හරියාකාරයෙන් ඒ උපාදානස්කන්ධයෙන් මිදෙන ශීලය කවර ආකාරයෙන් විය යුතුද කියන එක අන්න ඒ ප්‍රශ්න කිරීම තුළයි භාරගන්න කියල කිව්වා. ඊට පස්සේ කිව්වා නැවතත් ප්‍රශ්න කරන්න කියලා ඒ කියන්නේ

**''තස්ස, භික්ඛවෙ, භික්ඛුනො 'සාධූ'ති භාසිතං අභිනන්දිතබ්බං අනුමොදිතබ්බං. 'සාධූ'ති භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උත්තරිං පඤ්හො පුච්ඡිතබ්බො''' ක්ෂයමෙ, ආවුසො, ධාතු, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන"**

ඒ නැවතත් ඔන්න ප්‍රශ්න කරන්න කියලා කිව්වා. එතකොට ඒක භාරගන්න කියලා. ඊට පස්සේ කියනවා දැන් තේරුම බැලුවොත් ඒ පැහැදිලි කරන ආකාරයට සතුටින් එය අනුමෝදන්ව නැවතත් ප්‍රශ්නයක් විමසිය යුතුයි. ඇවැත්නි,

භාග්‍යවත් වූ දැන් ඒ විදියටම කියලා කියනවා. අරහත් වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් ඒ ධාතු, අන්න එතනදී කියනවා සය ධාතු පැහැදිලි කරන්න කියලා.ඒ ධාතු, සදෙක් මොනවට වදාරන ලද්දාහ. කවර සය ධාතු යත් පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාශ ධාතුවත්, විඤ්ඤාණ ධාතුවත් බුදුන් වහන්සේ මෙන්න මේ ආකාරයට සය ධාතු ප්‍රශ්න කරන්න කියලා කියනවා.

ඇවැත්නි, භාග්‍යවත් වූ දැන් ඒ විදියට කියලා කියනවා සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් ඒ ධාතු සය මොනවට වදාරණ ලදහ, කෙසේ දන්නාවූ, කෙසේ දක්නා වූ ආයුෂ්මතුන් ගේ සිත මේ සය වැදෑරුම් ධාතුන් කෙරෙන් උපාදාන වශයෙන් නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදුනේ වේද මහණෙනි, වැස නිම වූ බඹසර ඇති කළ බහා තැබූ කෙලෙස් ඇති ඒ පැමිණ රහත් ඵලය පිණිස ඒ භව සංයෝජනය ක්ෂය කොට ඒ මොනවටද මිදුනේ ක්ශිණශ්‍රව මහණට ඒ ප්‍රශ්න ව්‍යාකරණ පිණිස ඒ පඨවි ධාතුව ආත්ම වශයෙන් නො පැමිණේ.පඨවි ධාතුව නිශ්චිතවූ සෙසු ධාතු ද ආත්ම කොටගෙන නොපැමිණියේය. පඨවි ධාතු ඒ උපය උපාදාන නොගත යුතුය. ඒ තෘෂ්ණා, මාන, දිට්ඨි ලෙස අභිනන්දනය අභිනිවේස නොකළ යුතුය. ක්ෂය හේතුවෙන්, විරාග හේතුවෙන්, නිරෝධ හේතුවෙන්, ත්‍යාග්‍ය හේතුවෙන් අන්න නුවණින් දනිමින් දකිමින් ඒ පඨවි, ආපෝ, තේජෝ, වායෝ ඒ ආකාශ ධාතුවත්, විඤ්ඤාණ ධාතුවත් ආත්ම වශයෙන් නොගෙන ඒ ආත්ම විඤ්ඤාණධාතු නිශ්චිත කොට ගෙන ඒ නොගතිමි. ඒ විඥාන ධාතු නිශ්චිත වූ ඒ තෘෂ්ණා දෘෂ්ටි සංඛ්‍යාත ඒ උපය උපාදාන කෙනෙක් ඇත්ද? ඒ සිත පිළිබඳ තෘෂ්ණා, දෘෂ්ටි සංඛ්‍යාතයේ අභිනිවේස අනුශය කෙනෙක්

ඇත්ද? ඒ ක්ෂය හේතුවෙන්, විරාග හේතුවෙන්, නිරෝධ හේතුවෙන් ඒ මාසිත මිදුනේ යැයි නුවණින් දනිමි. ඇවැත්නි, මෙසේ හෙයින් දක්නාවූ, මෙසේ හෙයින් දන්නාහු දක්නාවූ මාගේ සිත මේ සය වැදෑරුම් ධාතු උපාදාන කොටගෙන උපාදාන නොගෙන මිදුනේයැයි මතැනදී පැහැදිලි කරන කොට බුදුන් වහන්සේ මනා කොට පැහැදිලි කරනවා ඒ රහතන් වහන්සේගේ භාෂිතය කෙසේද විය යුතුද කියන එක. එතැනදී පැහැදිලි කරනවා ආත්ම වශයෙන් නොගෙන අන්න පඨවිය, පඨවිය ලෙසත්, පඨවිය ආත්ම වශයෙන් නොගෙන එය නොපැමිණෙයි. ඒ බැස නො ගනීයි, කියන එක. එතකොට උපාදන කර ගන්නේ නැති බව, අභිනිවේස කර ගන්නැති බව, එය ක්ෂය කොට විරාග නිරෝධ හේතුවෙන් එය හැරපියා අන්න ආශ්‍රව කෙලෙස් ක්ෂය වී අන්න රහත් භාවයට පත්වුණු ආකාරය පැහැදිලි කර වියයුතු වෙනවා. එතකොට ඒ භාෂිතය කෙසේ විය යුතුද කියන එක. ඒ සය ධාතු පැහැදිලි කරන්නේ කියනකොට නිකන් මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියලා ඊට පස්සේ ඒ ආකාශ ධාතුව, විඥාන ධාතුව කියලා කියන එකක් නෙමෙයි. බලාපොරොත්තු වෙන්නේ. මෙතනදී ඒ අනාත්ම ධර්මය කෙසේ විය යුතුද කියන එකයි. ඒ කියන්නේ පඨවිය තුළ ආත්ම සංඥාවක් නැති බවයි, ඒ ආත්ම වශයෙන් නොගන්නා බවයි. එතකොට පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන මේ සතර මහා භූත තුළ සතර මහා ධාතුන්හි ආත්ම වශයෙන් නොගැනීම, ආත්මීය දැනීමක් නැතිවීම. අපි කියනවා නම් මේක සතර වෝහාර ධර්ම වලදිත් එනවා, ඒ කියන්නේ සතර වෝහාර ධර්මයේ පැහැදිලි කළේ දිට්ඨ, සුත, මුත, විඥානත කියන විදිහට. නමුත් දැන් මෙතන සය ධාතු විදිහට ගන්නකොට දැන් මෙතන ගන්නවා අර මුත කියන

තැන්දී සාණ, ජිවහා - රස, ගන්ධය සහ උෂ්ණසුම, සීතල, තද ගතිය. අන්න ඒ කාය ප්‍රසාදය කියන එක. උෂ්ණසුම, සීතල, තද ගතිය තුළ ආත්ම ස්වභාවයක් ඉස්මතු වෙනවා නම්, දෙයක් කියලා ඉස්මතු වෙනවා නම්, එතන ඒ එන අරමුනේ එතන එහෙනම් රහතන් වහන්සේ නමක් නෑ. එහෙනම් ඒ කාය ප්‍රසාදය තුළ ආත්ම භාවයක් දැනෙන්නේ නැත්නම්, ඒ සය ධාතුන්හි ආත්ම ස්වභාවයක් දැනෙන්නේ නැත්නම්, ඒ කියන්නේ මෙන්න මේක මේ විදියට ඔබ දරාගන්න.

මේක අපගේම ප්‍රත්‍යක්ෂ තුළ අපි දේශනා කරන්නේ. ඒ කියන්නේ කෙසේ විය යුතුද සය ධාතු, දැන් අපි ගමු සතර වෝහාර ධර්ම කෙසේ විය යුතුද? දැන් රහතන් වහන්සේගේ ස්වභාවය කුමක්ද? ඔන්න අපගේ ප්‍රත්‍යක්ෂතාවයෙන් ඔබට පැහැදිලි කරනවා ඒ කියන්නේ කුමක්ද? දැන් සතර වෝහාර ධාතු කියනකොට එතන දිට්ඨෙ, දුටු දෙයක් නැහැ, දුටු කෙනෙක් නැහැ කියනවා වගේ එතනදි දෙයක් කියලා දැනෙන්නේ නෑ, දෙයක් කියලා දැනෙන්නේ නැත්නම්, එතන දෙයක් කියලා හමුවන්නේ නෑ. දෙයක් කියලා හමුවන්නේ නැත්නම් ඒ දෙයක් කියලා දැනෙනවනම්, ඒ වර්ණය තුළ,ශබ්දය තුළ, ගන්ධය තුළ, රස තුළ, උෂ්ණසුම, සීතල හා තදගතිය තුළ, ඒ කියන්නේ මේ එන සෙන්සස් (sensor) වල එන ආරම්මණය දෙයක් කර ගන්න කෙනාට එය දෙයක් කියලා බැසගන්නවා නම් එතන රහතන් වහන්සේ නමක් නෑ. ඇත්තම කතාව රහතන් වහන්සේගේ ස්වභාවයයට එහෙම දෙයක් කියලා දෙයක් හම්බ වෙන්නේ නෑ. ඔන්න වෝහාර ධර්ම.

පංච උපාදානස්කන්ධ ගන්නකොට වේදනා, සංඥා, සංඛාර, විඥානයෙන් තමයි මේක දෙයක් කියලා ගැනෙන්නේ.

මේ එකම තැන තමයි පැහැදිලි කරන්නේ. නමුත් මේ ආකාර කිහිපයවත් ප්‍රශ්න කරන කොට තමයි මේක තේරෙන්නේ. **පංච උපාදානස්කන්ධ බාහිර කොහෙවත් හම්බවෙන්නේ නෑ.** පංච උපාදානස්කන්ධ කියන්නේ මෙතන දෙයක් කියලා ගන්න ආකාරය. එතනදී වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන්නේ දැනගැනීම.

**ඒත් අරමුණමයි. වෝහාර ධර්ම කිව්වත් අරමුණමයි, සිතට එන අරමුණේ සත්‍ය දැකීමයි. එතකොට පංච උපාදානස්කන්ධ කිව්වත් අරමුණමයි. සිතට එන අරමුණේ සත්‍ය දැකීමයි.**

එතකොට මේ **තුන්වෙනි කාරණාව** පැහැදිලි කළේ **කුමක්ද? බුදුන් වහන්සේ ප්‍රශ්න කරන්න කිව්වේ සය ධාතු. සය ධාතුත් ඒ වගේමයි. සය ධාතුත් බාහිර දෙයක් වෙලා හම්බ වෙන්නේ නෑ. එයත් විඤ්ඤාණයේ අත්දැකීමක් මයි වෙන්නේ.** එහෙනම් විඤ්ඤාණයේ අත්දැකීමක් කොහෙවත් හම්බවෙන්නේ නෑ.අන්න ඒකයි ඒක මේ පඨවි ආත්ම වශයෙන් දැනෙන් නෑ කියන එක. එහෙනම් දෙයක් කියලා දැනුනොත් ආත්මයක් කියලා දැනෙනවා. දෙයක් කියලා දැනෙන්නේ නැත්නම් ආත්මයක් කියල දැනෙන්නේ නෑ. එතකොට මේ සේරම විඤ්ඤාණයේ අත්දැකීම් කියලා ගත්තම බාහිරන් හම්බවෙන්නෙත් නෑ. අන්න ඔබ කියනවා නම් පඨවි, ආපෝ, තේජෝ, වායෝ අර තියෙන්නේ අර තියෙන්නෙ කියල, බාහිරේ ඔබ රහත් වෙලා නෑ. ඒක දකින්න ඕනි මහා නුවනින්. රහත් භාවය තුළ කොහොමද? එය දැකිය යුතු වන්නේ එය අවබෝධ විය යුත්තේ අවබෝධක්ඤාණය තුළ. ඒ රහත් භාවයට ප්‍රත්‍යක්ෂතාවයට එන්නේ කොහොමද? **ඒ පඨවි, තේජෝ, වායෝ, ආකාස ධාතු සහ විඤ්ඤාණ ධාතු කිව්වත් එයත් සියල්ලම විඤ්ඤාණ මායාවෙන් ම අත්දැකීමක්.**

**කාය ප්‍රසාදය තුළ අත්දැකීමක් - උණුසුම, සීතල, තද ගතිය කියන්නේ. එතකොට ඒ විදියට ඔබට දැක්කොත් අන්න සය ධාතු ඔබ ආත්මීය දෙයක් කියලා හම්බවෙන්නේ නෑ.දෙයක් කියලා හම්බවුනොත් එතන ආත්ම ස්වභාවය තමයි. අන්න එකෙන් මිදුනොත් තමයි රහත්භාවය කියන්නේ.** එහෙනම් එතන දෙයක් කියලා අහුවෙනවා නම් රහතන් වහන්සේ නමක් නෑ. එතකොට දිට්ඨ, සුත, මුත එන ආරම්මණ වල දෙයක් හම්බ වුනේ නෑ. උපාදාන ස්කන්ධ වලත් දෙයක් හම්බ වුණේ නෑ. එහෙනම් අවසානයේ පැහැදිලි කරපු ධාතු වලත්, හය ධාතුවත් දෙයක් හම්බ වුණේ නෑ. ඔන්න ඊගාවට නැවතත් ප්‍රශ්න කරන්න කියලා එතකොට සතුටින් පිළිගන්නේ. එසේ පවසනවා නම්, ඊට පස්සේ කියනවා මතුවී ප්‍රශ්නයක් ඇසිය යුතුය. අපි දැන් පාලි පොඩ්ඩක් සූත්‍රය පොඩ්ඩක් තියලා අපි අවශ්‍ය තැනේදී ඉස්මතු කරමු. මේකේ කාර්ණා ටික පැහැදිලි කරගෙන යමු. බුදුන් වහන්සේ නැවතත් පැහැදිලි කරපු සරල විදිහට එතකොට නැත්නම් මේක දීර්ඝ පැහැදිලි කිරීමක් තියෙනවා. එතකොට ඔබටත් පහසුයි. ඔබටත් වැටහෙනවා කියන කාරණාව. දැන් කාරණා තුනක් පැහැදිලි කළා.

**දැන් හතරවෙනි කාරණාව. ඒ කියන්නෙ මෙතන දී බුදුන් වහන්සේ නැවතත් ප්‍රශ්න කරන්න කියලා කියනවා.** ඇවැත්නි, භාග්‍යවත් වූ සියල්ල දන්නා දැන් ඔය විදිහට කියලා කියනවා **ආධ්‍යාත්මික ආයතන සහ බාහිර ආයතන ගැන.** එතකොට කියනවා ආධ්‍යාත්මික බාහිර ආයතනයෝ ඒ සදෙන මොනවට වදාරන කවර සදෙසයක් යත්. අන්න ඇස රූපය, කන ශබ්දය, නාසය ගඳයෝය, දිව රසය. එතකොට ස්පර්ශය අන්න උණුසුම, සීතල, තද ගතිය ඒ ධර්මයෝ සිත ධර්මයෝය. ස්පර්ශය කාය ප්‍රසාදය සිත ධර්මයෝ

කියල. එතකොට ආයතන හය විදිහට අරගෙන ඇස, කන, දිව, නාසය, කය, මන කියන. මේ එන ආරම්මණ වලත් ආත්මයක්, සත්වයෙක්, පුද්ගලයෙක් හම්බ වෙන්න බෑ. එය හමු වෙනවානම් එතන රහතන් වහන්සේ නමක් නෑ. **එතකොට අජ්ඣත්ත බහිද්ධා කියලා කියනකොට ඇසත්, රූපයත්. එතකොට ඇසත් රූපයත් කියනකොට එතන ඇස කියන්නේ, එතන ආයතන කෘත්‍ය. එතකොට ඇස කියන්නෙ ආයතන කෘත්‍යය. රූපය කියන්නේ හදාගත්ත රූපය. ඒ තුළ දෙයක් තියෙනවනම්, දැන් ඇසත් රූපයත් අජ්ඣත්ත ආයතනයත්, බහිද්ධා ආයතනයත් කියන්නේ අපි සාමාන්‍ය සරලව පැහැදිලි කරනවා නම් ඔබ දන්නවා, මේ එළියෙ තියෙන්නේ, මෙතන මම ඉන්නේ කියන අජ්ඣත්ත බහිද්ධා කියන අන්ත දෙකක් අපිට හම්බ වෙනවා.**

එතකොට අර තියෙන්නේ කියලා සාමාන්‍ය අසෘතවත්, පෘතග්ජන කෙනාගේ ස්වභාවය තමයි එලියෙන් පෙන්නන එක. අර තියෙන්නේ අඹ ගහ. අර ඉන්නේ දරුවා, මේ තියෙන්නේ ගෙදර. එතකොට ඒ එළියෙන් පෙන්නන කොට මෙතන මම ඉන්නවා. මම තමයි දැන් මේවා හිතන්නේ. අජ්ඣත්ත බහිද්ධා දෙකක්. එතකොට නාමය, රූපය කියන්නෙත් මේ ස්වභාවයෙන්ම තමයි. එතකොට අපිට **මෙතන නාමය, අතන රූපය.** එතකොට **"වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර අයං වුච්චති උච්චති නාමං"** කියනකොටත්, ඒ ස්වභාවයම තමයි මෙතන නාමය අතන රූපය කියලා ගන්නවා. එතකොට **"චත්තාරෝච මහා භූතනං උපාදාය රූපං"** කියල එතන රූප කියලා ගන්නවා. මහා භූත ඇසුරු කරගෙන භූතය නමුත් මේ රහතන් වහන්සේගේ අත්දැකීම නෙමෙයි. මේක සාමාන්‍ය පෘථග්ජන අත්දැකීමක්.

රහතන් වහන්සේගේ අත්දැකීම් කොයි වගේද? කියල අපි මේ හොඳ අවබෝධයකින් ඔබට මේ පොත තුළ වෙන කාරණා පැහැදිලි කරන්නේ හොඳ අවබෝධයකින්. ඔබට ඒ සත්‍යය හෙළි කරනවා. ඒ කියන්නේ අජ්ඣත්ත බහිද්ධා කියන රහතන් වහන්සේට අන්ත දෙකක් හමුවන්නේ නෑ. ඇත්තම කිව්වොත් මේ රහතන් වහන්සේ අන්ත දෙකක් පරිහරණය කරනවා නම් එතන තියෙන්නේ අන්න විඤ්ඤාණය. එතකොට **පටිත්ථිත විඤ්ඤාණයක්** වෙනවා. ඒ තුළ දෙයක් හමුවෙලා තියෙනවා. ඒ තුළ ආත්ම දෘෂ්ටියක් තියෙනවා. ඒ තුල රහත් භාවයක් නෑ. එහෙනම් අන්ත දෙකක් හමු නොවෙනව නම් අන්න එතනයි අන්ත දෙකෙන්ම මිදුන තැනයි, දෙයක් හමුනොවන තැනයි. එහෙනම් රහතන් වහන්සේගේ ස්වභාවය ප්‍රශ්න කරන්න කිව්වේ අන්න ඒකයි බුදුන්වහන්සේ. **රහතන් වහන්සේ කෙනෙක් ගේ ඒ ස්වභාවය ඒ ප්‍රශ්න කරොත් අන්න පැහැදිලි කළොත් මෙන්න මෙතන මෙහෙම දෙයක් නැති බව අජ්ඣත්තවත්, බාහිරවත් දෙයක් හම්බවෙන්නේ නෑ කියන එක. අන්න ඒ මනා කොට පැහැදිලි කළොත් නාම, රූප උපරුජ්ජනය වෙන හැටි අන්න ඒ රහතන් වහන්සේගේ ස්වභාවය.** ආත්මයක් පරිහරණය කරනවා නම් බාහිර තියෙනවා කියලා ගන්නවානම් මෙතන මම ඉන්නවා කියලා ගන්න සිද්ධ වෙනවා. බාහිර දෙයක් තියෙනවා කියලා ගත්තොත්, පොත් තියෙනවා කියලා ගත්තොත්, පොත තියන තැනමයි මමත් ඉන්නේ. හැබැයි, පොත කියලා දෙයක් හම්බ වෙන්නේ නැත්තම් එතන මමත් නෑ.

**"ඒතං මම"** පොත් තිබ්බොත් මාත් ඉන්නවා.

**"ඒසෝ හමස්මිං - එමේසො අත්තා"**

හැබැයි මෙතන පොත කියලා දෙයක් නැත්නම් අන්න ඒක දකින **"ඒතං මම"** මම නැති වෙනවා. මම, මගේ, මගේ ආත්මය කියන එක නැතිව වෙනවා. මේ කියන **"ඒතං මම, ඒසෝ හමස්මිං - එමේසෝ අත්තා"** කියන එක දුරුවෙනවා. හැබැයි **එතන දෙයක් තිබ්බොත්, එතන මම ඉන්නවා. අන්න ඒකයි අජ්ඣත්ත බහිද්ධා කියන්නේ.** මේ අන්ත දෙකක් පෙන්වන්න හේතුව. මේක අවිද්‍යා භූමියේ තියෙන්නේ. පෘථග්ජන භූමියේ තියෙන්නේ. සතා සිවුපාවා පවා බාහිර ඇත්ත කරගෙන ඉන්නේ. එතකොට **"අන්තෝ ජටා බහී ජටා"** කියලා අන්ත දෙකක් කියල, අන්ත දෙකක් අපිට හම්බ වෙන්නෙ ඒ නිසයි. එතකොට හැබැයි ඒක පෘථග්ජන භූමිය **ආර්ය භූමියේ අන්ත දෙකක් හම්බ වෙන්නේ නෑ. මෙයයි රහතන් වහන්සේගේ අත්දැකීම. එයයි රහත් භාවය. එයයි ආත්ම දෘෂ්ටිය තුළ තමයි අන්ත දෙකක් තියෙන්නේ. දෙයක් තිබ්බොත් තමයි මෙතන මමත් ඉන්නේ.** හැබැයි, **ඒ රහත් භාවය තුළ ඒ ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේ නමක් බවට පත්වන්නේ රහත් භාවයට. ඒ කියන්නේ අරහත්වයට පත්වන්නෙ අනුත්තරත්වයට පත් වන්නේ දෙයක් හමුනොවන තැන.** දෙයක් හමුවන තැන ලෝකෙට බැස ගත්ත තැන. ලෝකයක් ඇති තැන ලෝකෙන් මිදීමක් සිද්ධ වෙන්නෙ නෑ. **"ලෝකවිදූ"** කියන තැනට යන්නේ නෑ. ඒ අනුත්තරත්වයට එන්නේ නෑ. මේක මහා නුවනට හසුවෙන්නේ. ඔබ මේක ප්‍රායෝගිකව, ඔබට අත්දකින දකිනවා නම්, ඔබ ප්‍රායෝගිකව මේ ධර්මය ප්‍රායෝගික වෙලා නම්, ඔබට මේ අත්දැකීම තියෙනවා නම්, ඔබ අපි ඒ රහත්භාවයට ඔබ ඉතාම ළඟයි. ඒ අවබෝධය ඇති තාක්, ඒ අවබෝධය නැතිතාක් ඔබ රහත් භාවයට සමීප නෑ. මේක මීට කලින් පැහැදිලි කරපු උපාදානස්ඛන්ධයේ ස්වභාවයමයි. ඒ ස්කනධ කායා කියන එක දකින්න බැරිනම්

ඔහු දකින්නේ මේ කය කියන එක. මෘත කලාබරෙන් නම් ඒ රහත් භාවය ඔබට දුරයි. හැබැයි ඔබ දකින්නේ ඒත් ස්කනධ කායා කියන තැනින් දෙයක් කරගන්න තැනින් නම් ඒ රහත්භාවය ඔබට ළඟයි. එහෙනම් ඔබ රහත්භාවයට ළඟයි. ඒ වෝහාර ධර්ම වලත් ඒක තියෙනවා. එන අරමුණු වල දෙයක් කරගත්තොත් ඒ රහත් භාවය ඔබට දුරයි. හැබැයි දෙයක් දකින්නේ නැත්නම් ඒ රහත්භාවය ඔබට ළඟයි. මේ ඔබ ගමන් කරන ක්ෂීණාශ්‍රව ඒ රහත්භාවය කරා. මේ නිවන් මඟ යන ආකාරය, මේ ගෝගාවචර ස්වභාවයයි මේ පෙන්නන්නේ. එහෙනම් ඔබ යායුතු මාවත කුමක්ද කියන එක මේ ජබ්බි සෝධන සූත්‍රය තුළ ඔබට මනාව හමු වෙනවා. ඇත්තටම නිවන් මග යන සැම කෙනෙකුටම මේ පැහැදිලි කිරීම් ඉතාම වටිනවා. ඇත්තටම කෙසේ විය යුතුද කියන එක ගලපාගන්න වටිනවා. එතකොට මෙතනදී අපි පැහැදිලි කරා අජ්ඣත්ත බහිද්ධා කියන ස්වභාවය එතනදී වචනය දැන් පැහැදිලි තේරුම පරිවර්තනයට පොඩ්ඩක් යොමු වෙලා බැලුවොත්

**මහණෙනි, ඒ කත කරණීය එතකොට ඒ ලැබූ රහත්භාවය ක්ෂය වෙයි. භව සංයෝජන ඇති මොනවට මිදුණු ඒ ක්ෂීණාශ්‍රව මහණට එතකොට රූපයෙහි, චක්ඛු විඤ්ඤාණයේ විඥ්ඥාත ධර්මයෝ තෘෂ්ණා, ඡන්දයෙන්, රාගයක්, නන්දියක්, තෘෂ්ණාවක් ඒ තණ්හා, මාන, දිට්ඨියක් උපය උපාදාන ඒ සිත තෘෂ්ණා, දෘෂ්ටි නම් ඒ අධිෂ්ඨාන අභිනිවේස අනුශය කෙනෙක් ඇත්ද එය ඔහුගේ ක්ෂය හේතුවෙන්, විරාගය හේතුවෙන්, නිරෝධය හේතුවෙන්, තාගෘයය හේතුවෙන් මිදුනේ යැයි ඒ නුවනින් දනිමි.** ඇවැත්නි ඒ සෝතයේ ශබ්දයෙහි, ඝානයෙහි එතකොට මේ එන අරමුණ වල එතකොට **මෙතනදී කියනවා**

ඒ තණ්හා, මාන, දිට්ඨි දෙයක් තිබ්බොත් තමයි දෙයක් කියලා ගන්න කොටම එතන තණ්හා, මාන, දිට්ඨි තියෙනවා. ඒ කියන්නේ දෙයක් කියලා ගත්තොත් ඒක තණ්හා, මාන, දිට්ඨි කියන්නේ එකේ තියනවා දෙයක් කියලා ගත්තොත් එතන මම, මගේ, මගේ ආත්මය කියා ඒ තුනම තමයි තණ්හා, මාන, දිට්ඨි කියන්නෙ. ඒ කියන්නේ දෙයක් කියලා ගත්තොත් එක දකින කෙනෙක් ඉන්නවා. එතකොට මම ඉන්නවා. එතකොට තණ්හා, එතකොට මාන, ඒක මගේ එතකොට මැනිමක් තියෙනවා. තණ්හා, මාන, දිට්ඨි කියන්නේ. එක ආත්මයක්. මම, මාගේ, මගේ ආත්මය. එතකොට ඒකම තමයි තණ්හා, මාන, දිට්ඨි. මේ වචන මෙතන වචන ස්වභාව වලින් තමයි ඔබ මේක දකින්නේ. තණ්හා, මාන, දිට්ඨි කියන එකත් ඒ වගේම මම, මගේ, මගේ ආත්මය නමුත් මේකේ විග්‍රහය බැලුවහම එකම විග්‍රහය, දෙයක් තිබ්බොත් තමයි මම, මගේ, මගේ ආත්මය කියන්නේ. එකම තමයි තණ්හා, මාන, දිට්ඨි හැබැයි මෙතනදී තවත් මේක ගැඹුරින් ප්‍රශ්න කරනවා.

ඒ කියන්නේ ඇසත්, රූපයත්, ඇසේ විඤ්ඤාණයත් කියන තැනින් ඒ කියන්නේ දෙයක් කරගත්ත තැනින්

"චක්ඛුං පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛුං විඤ්ඤණං තින්නං සංගති පස්සෝ"

කියන තැනින් එතකොට එතනදී අර අජ්ඣත්ත, බහිද්ධා කියන අන්ත දෙකක් දකින්නේ නෑ කියන තැන, ඒ අන්ත දෙකක් හමුවුන්නේ නෑ කියන තැන, පේන්නෙත් එතන දෙයක් තිබ්බොත් මෙතන මමත් ඉන්නවා කියන එක. එතකොට එතන විඤ්ඤාණය බැස ගන්නවා කියන්නේ එතකොට එතන දෙයක් වෙනවා. එතකොට මෙතනදී අවබෝධය මනා

කොට තියෙනවා. ඇස ගැන, චක්ඛුශය ගැන, ඒ වගේම චක්ඛු විඤ්ඤාණය ගැනත්. එක්කෝ ඒ වගේ චක්ඛු සම්ඵස්සය ගැනත්. මේක දෙයක් මෙතන ලොකු තේරුමක් තියෙනවා කියනවා. එතන වේදනාවක් ඒ කියන්නේ ඇලීමක්, ගැටීමක් ඇතිවන්නේ දෙයක් තිබ්බොත්. එහෙම උනොත් අර චක්ඛු සම්පස්සය කියන්නේ දෙයක් කරගන්න එකමයි. එතකොට චක්ඛු විඤ්ඤාණය කියන්නේ දෙයක් කියලා දැනෙන එකමයි. ඒක චක්ඛු සම්ඵස්සය වෙන කොටත් ඒක දෙයක් කරගෙන. එතකොට එතන චක්ඛුශය  කියන්නේ ඇසත්, ඒ ඇස කියන්නෙත් මේක හදාගන්න එකමයි. එතකොට මෙතනම මේ සිද්ධිය සිද්ධ වෙන නිසා එකක් අපි හදාගෙන දකින එකක්. **අපිට මේ ධර්මය හොඳින් නුවණින් දැක්කොත් තමයි ඇසත්, රූපයත්, ඇසේ විඤ්ඤාණයත් කියන තුනේම මිදීම සිද්ධවෙන්නේ. එතකොට චක්ඛුශයෙහි, රූපයෙහි, චක්ඛු විඤ්ඤාණයෙන් යම් තෘෂ්ණාවක් උපදී නම් රාගයක්, නන්දියක් එයින් ඒ තෘෂ්ණාවක් ඒ උපාදාන නොගෙන ඒ තෘෂ්ණා දෘෂ්ටි ලෙස ඒ ගන්නේ නැතුව ඒකෙන් මිදුනොත් ඒක අන්න විරාගයට ගියොත් අන්න එතනයි රහතන් වහන්සේගේ ස්වභාවය.**

එතකොට ඇසෙන් දෙයක් කියලා ගත්තොත් ඒ දේට බැස ගත්තොත් එය අභිනිවේසට ගියොත්, එක දෙයක් කරගත්තොත් ඒක අභිනන්දනයට ගියොත්, ඒක තණ්හාව, ඒක උපාදාන ඒ සේරම එතනයි තියෙන්නේ. එතකොට එකම පාරියායක් මේ වචන පොඩ්ඩක් පරිස්සමින් දකින්න. එතකොට අධ්‍යාත්මික ආයතනත් බාහිර ආයතනත් විදියට දකින ආකාරය කියනකොට ඒක ඇස, කන, දිව, නාසය, කය, මන එතකොට මේ අරමුණු තමයි මෙතන එන්නේ. ඒ අරමුණේ

තමයි මේ බාහිර කර ගන්නැති කමක්, සිතෙන් එහෙම දෙයක් හමු නොවන තැනත් එතන මිදීමයි. ඒ **චිත්ත විමුක්තියයි.** දෙයක් කියලා ගත්තොත් විමුක්තිය එයාට හමුවූන්නේ නෑ. එතකොට ඒ තණ්හා, මාන, දිට්ඨිය ඇතිවෙනවා. එතකොට මෙන්න මෙයයි රහතන් වහන්සේගේ අත්දැකීම. එතකොට මේයයි ප්‍රශ්න කරන්න කියලා කියන්නේ. කෙසේ විය යුතුද කියන එක. එතකොට එය පැහැදිලි කරනවා නම් එය භාර ගන්න කියලා බුදුන්වහන්සේ එතනම පැහැදිලි කරනවා. **මෙ පරිදි දක්නා වූ ඒ සය වැදෑරුම් අධ්‍යාත්මිකත් බාහිරත් උපාදාන වශයෙන් නොගෙන ආශ්‍රව කෙරෙන් මිදුණේ වේ ද මහණෙනි එය පිළිගනීයි කියලා කියනවා.** ඊට පස්සේ නැවතත් ප්‍රශ්න කරන්න කියලා කියනවා.

මෙතනදි බුදුන් වහන්සේ පැහැදිලි කරනවා නිමිති, **අනුනිමිති ගැන. ඒ කියන්නේ මේක ම විදිහට පරිවර්තනය තියෙන විදිහටම අපි ගත්තොත්, දැන් ඔන්න පස්වෙනි කාරණාවට එනවා. දැන් අජ්ඣත්ත බහිද්ධා කියන ආයතන විදිහට බැලුවා.** එතනත් මිදීමක් දැක්කා. ඊට පස්සේ සවිඤ්ඤාණක කයේ ද බාහිර හැම නිමිත්තෙහිද ඒ මහණ නම් වූ ඒ අහංකාර තෘෂ්ණාව නම් වූ මතින්කාර මහන අනුශයෝ මොනවට වසන ලද්දාවූද මහණෙනි ඒ නිමවූ බඹසර ඇති. අන්න ඒ කෙලෙස් බර ඇති ඒ රහත්පිරිස ඒ භව සංයෝජන මිදුනු ඒ ක්ශිණාශ්‍රව මහණුන්ගේ මෙන්න මේ ප්‍රශ්න කරන්න කියලා කියනවා. ප්‍රශ්න ව්‍යාකරණ පිණිස මේ ස්වභාවය ඇවැත්නි තථාගතයන් ඒ විදිහටම කියලා කියනවා. ඒ දහම් අසා මම ඒ සද්ධාව ප්‍රතිලාභය යුක්තෙන් වෙමි. මෙසේ ගෘහවාසි මෙන්න මේ විදියටම කියනවා කෙළෙස් රජති. **ඒ මෙන්න මෙතැනදී වටිනා කාරණා කිහිපයක් බුදුන්**

වහන්සේ පැහැදිලි කරනවා. සවිඥානක කයේ ද බැහැර හැම නිමිත්තේම එතකොට මෙතන හැම නිමිත්තෙහි කියලත් කියනවා. සවිඥානක කයෙහිද බැහැර හැම නිමිත්තෙහි මහන නම් වූ අහංකාර මමිංකාර මාන අනුශය කියනකොට ඒ කියන්නේ මම, මගේ,මගේ ආත්මය කියා ඒ මේ දෙයක් කරගන්න එකම තමයි මෙතනදී ඒ මෙතැනදී තවත් වටිනා තැනක් බුදුන් වහන්සේ පැහැදිලි කරනවා. ඒ ගිහි ස්වභාවයත්, පැවිදි ස්වභාවයත් ඒකත් පැහැදිලි කරනවා. එතනදී කියනවා ගෘහ වාසය සම්බන්ධ ඒ කෙලෙස් රජස් ඇති ඒ ගිහි ගෙය වසන්නා විසින් ඒකාන්ත පරිපූර්ණ වූ, ඒකාන්ත පාරිශුද්ධ වූ, ඒ බඹසර පුරන්නට සුකර නොවෙයි කියලාම බුදුන් වහන්සේ, පැහැදිලි කරනවා. ඒ මම කෙහෙවස් බහා හැර දමා ඒ ගිහිගෙ න් නික්ම ඒ පැවිද්දට පැමිනෙන්නම් ඒ මැනවයි පැහැදිලි කරනවා. එය සුදුසුයි කියන එක බුදුන්වහන්සේ මැනවයි කියලා ඒ සිත පහළ වෙනවා කියන එක. ඒ ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේගේ ස්වභාවය පැහැදිලි කරනවා. ඇවැත්නි, මම පසුකලෙක  අල්ප වූ හෝ බොහෝ දැන් මේ විදියට කියලා කියනවා. භෝග සය ඒවා අත්හැරීයයි කියලා. ලාභ සත්කාර අත්හැරීයයි කියල කියනවා. හිස්කෙස් බෑවයි කියලා කියනවා. ගිහි ගෙයින් නික්ම පැවිද්දට පැමිණි යැයි කියනවා. ඒ පැමිණියේ නම් යෙහෙයි කියනවා. එතකොට මම මෙසේ පැවිදි වූයෙමි. ඒ භික්ෂූන්ගේ ඒ ශික්ෂා පැමිණියේයි අන්න එතකොට මේ විදිහට කියලා කියනවා ලැජ්ජා ඇත්තෙමි. පැමිණියෙමි සර්ව ප්‍රභූ ඒ හිතානුකම්පී එතකොට අර වෙනස් වෙන ස්වභාවය පැහැදිලි කරනවා. ඒ රහතන් වහන්සේගේ ස්වභාවය එතැනදී තවත් පැහැදිලි කරනවා. එතකොට පවිත්‍ර වූ ආත්මයන් වාසය කළෙමි. දුන්දේ ගන්නා සුලු නුදුන්දේ නොගන්නා අන්න ඒ ස්වභාවය දුන්නොත් ගන්නවා. ඒ

**ආහාරය දුන්නොත් වලඳනවා. නැත්නම් නෑ.** අන්න ඒ විදිහට මෙතන ඒ පරිවර්තනය අර සටීකාර අනාගාමී කියන කොටත් අපි කිව්වා මේ විදියේ පරිවර්තනයක් සටීකාර ගේ ස්වභාවය තුළ එතනදිත් අර පින්වන්න යන්නේ නෑ. හොයාගෙන හදාගෙන කන්න, ඒවා අර උපයගෙන කන ඒවා එහෙම නැත්නම්, තමන්ට ඕනා විදිහට රසට පිනවන විදිහට ආයතන පිනවන ඒවා ඒවට යන්නේ නැතිබව රහතන් වහන්සේගේ ස්වභාවය.

ඒ හම්බකරගෙන කන ස්වභාවයක් නෙමෙයි. එතකොට රහතන් වහන්සේගේ ස්වභාවය ආයතන පිනවන ස්වභාවයකුත් නෙවෙයි. දුන්නොත් වළඳනවා. නැත්නම් ඒ අල්පෙච්ජව කටයුතු කරන එකයි, එතනදි පැහැදිලි වෙන්නේ. එතකොට මනාකොට ඒ පරිවර්තනයයෙන් ඒ විදිහයටම සඳහන් වෙනවා. ඒ වගේමයි මෙතැනදී තවත් කාරණයක් පැහැදිලි කරන්න ඕනා. **මේ ගිහි වතේ පැවිදි වතට ආවොත් මැනවයි කියන එකක් මෙතැනදී බුදුන් වහන්සේ පෙන්වා දෙනවා. හිසකෙස් බා මේවා හැර දමා ඒ භව බෝග සම්පත්තියෙන් අතහැරලා අල්පේච්ඡ ස්වභාවයට එනවා කියන එක.** දැන් මේ නූතන යුගයේ මේ භෝග සම්පත්තිය ගැන ඒ ආයේ රැස්කරන ස්වභාවය මෙතන දී සම්පූර්ණයෙන්ම බුදුන්වහන්සේ ප්‍රතික්ෂේප කරන බව පේනවා. එතකොට බුදුන් වහන්සේ මේ කරුණු තුළ දී පැහැදිලි කරනවා ඒ භෝග සම්පත්තිය අතහැරලා බෝග ස්කන්ධ අතහැරලා අල්පේච්ඡ ස්වභාවයට ගිහිගෙයින් නික්ම පැවිද්දට අල්පේච්ඡ ස්වභාවය තමයි එතැනදි මතු කරන්නේ. **ඒ වගේ ග්‍රාම ධර්ම සංඛ්‍යාත ඒ මෛථුන සේවනයෙන් විරතව ඒ දුරුව ඒ හැරපියා බ්‍රහ්මචාරීව අන්න කටයුතු කරන බව**

**කියනවා.** ඒ වගේම මුසා බස් කීමෙන් වැලකීම කියනවා. වගේම සත්‍යවාදී වූයෙමි කියනවා. ඒ ස්ථිර වචන ඇත්තෙක් වෙනවයි කියනවා. ඒ වගේම මෙතන විශ්වාසනීයව වචනම කියනවා. ඇත්තෙක් වේ කියනවා. **ඒ වගේම වැලකී සිටිනවා කියනවා මුසා බස් දෙඩවීම** ඒ වගේ ඒ සම්පූර්ණයෙන්ම වැළකී සිටින බවක් මෙතන සඳහන් වෙනවා. **ඒ වගේම පිසුනු බස්, මුසාවාදා, පිසුනා වාචා, සම්ප්‍රප්පලාපා ඒ සම්පූර්ණයෙන්ම බැහැර වෙනවා කියලා සඳහන් වෙනවා.** ඒ වගේම තවදුරටත් පැහැදිලි කරනවා ඒ වගේම කියලා මුසාවාදා, පිසුණා වාචා, පරුෂාවාචා, ඒවයෙන් බැහැර වෙනවා කියලා. බහුජන කාමි එතකොට බහුජන මනාප ඇති ඒ බස් වෙනස් ඒ භාවිතා වෙන්නේ. එතකොට මීට තවත් පැහැදිලි කරනවා **කාලවාදී වුයෙමි, බ්‍රහ්මවාදී වූයෙමි. භූත වාදී වූයෙමි. ධර්මවාදී අර්ථ වාදී වූයෙමි. විනයවාදී වූයෙමි.** සුදුසු කල්හි ඒ සුදුසු දේ පර්යන්තයේ ඒ අර්ථ සහිත ඒ භාෂිතය ගැන කතා කරනවා. ඒ වගේම එක් වේලෙහි බත වළඳන කරන එක් වේලෙහි සුළු විම් විකාල භෝජනයෙන් වැලකුණෙමි. බොජුන් වැලකුණෙමි. ඒ අර නච්ච ගීත වාදන ඒ විදිහට මේ ටික කියෙනවා. නච්ච ගීත වාදන ඒ ටික කියලා කියනවා වැලකුණෙමි. ඊට පස්සේ අර විදිහට රන් රිදී පිලිගැන්වුමෙන් වැලකුණෙමි. දාන පිළිග ැන්වූ මෙන් වැලකුණෙමි. අමුමස් පිළිගැනුමෙන් වැලකුණෙමි. එතකොට ස්ත්‍රී කුමාරිකාවන් පිළිගැනුමෙන් වැලකුණෙමි. ඒ දැසි දස්සන් පිළිගැනුමෙන් ඇඳුමෙන් වැලකුණෙමි. ඒ විදියට කෙත් වතුපිටි හැමදේම අතහැරෙනවා කියලා කියනවා. ඒ වගේම තම සන්තකයේ කිසිවක්ම තබා ගන්නා බවක් මේකේ සඳහන් වෙන්නේ නැහැ. ඒ වගේම මේ ස්වභාවය පවසන්නේ මේ රහතන් වහන්සේගේ ස්වභාවය. බුදුන් වහන්සේ මෙය

හැර පියා දමනවා කියන එක මේ රහත්භාවයේ ස්වභාවයයි. එතකොට අර විදියට මේ වාක්‍ය ටික සේරම අපිට පාලියෙන් දකින්න ලැබෙනවා. සූත්‍රය තුළ තියෙනවා.

**පටිවිරතො අහොසිං උපක්ඛට්යෝ නේන**

**"පටිවිරතො අහොසිං"** ඒ විදිහටම කියනවා පටි විහරතෝ කියලා කියන්නේ **පරිහරණය කරන්නේ නෑ** කියන එක. පටිවිරතෝ කියන වචනය දිගටම භාවිතා කරලා තියෙනවා. **පටිවිරතෝ අහොසිං** කියන වචනයෙන් භාවිතා කරලා තියෙනවා. පටිවිරතෝ අහොසිං අර විදිහට දිගටම භාවිතා කරලා තියෙනවා. එහෙම කියලා ඊට පස්සේ ඒ කියන්නේ ඒවා **පටිවිහරති බව. ඒ කියන්නේ ඒවා පරිහරණය වෙන්නේ නෑ කියලා. ඒ පටිවිහරත කියන්නේ ඒවට අනුගත ඒවා.** අපි මෙහෙම ගත්තොත් මේවා දකින්න මහා නුවණින් රහතන් වහන්සේගේ ස්වභාවයටයි. දැන් **රහතන් වහන්සේ කියලා කියන්නේ කවුද? ආත්ම දෘෂ්ටිය නෑ. දෘෂ්ටියක් නැති වෙන කොට කෙනෙක්, දෙයක් මුකුත් හම්බවෙන්නේ නෑ.** බාහිරින් **මිදෙනවා කියන්නේ බාහිර කිසිම දෙයක් ගහක්, කොළක්, දරුවෙක්, ගෙයක්, දොරක් මොකවත් කොහොමවත් හම්බ වෙන්නේ නෑ. පටිවිහරතෝ කියන්නේ ඒවාට බැඳිලා නෑ. බැඳීමක්, ඒවා අල්ලා ගැනිමක් සිද්ධ වෙන්නේ නෑ.** දැන් හැබැයි මේක බොහොම පරිස්සමෙන් ගන්න. මේ සූත්‍රය මේ පැහැදිලි කරන කාරණා මේ කේ පටිවිරතෝ කියනකොට මේවා පරිදි පරිහරණය කරන, මේවා මම කරගෙන, මගේ කරගෙන නෑ. සාමාන්‍යයෙන් රහතන් වහන්සේගේ සාමාන්‍ය විදිහට කනවා, බොනවා සාමාන්‍ය විදියට කතාබහ කරනවා. අපි කිව්වේ වෙනද විදිහටම පේනවා වෙනද විදිහටම දැනෙනවා, වෙනද විදිහටම ඇහෙනවා. මොකුත් වෙනස්

වෙලා නොවෙයි. නමුත් මේ මගේ කියලා දේවල් හම්බ වෙන්නේ නෑ. **මගේ මගේ කියන දේවල් නැති වෙනවා.** එතකොට එහෙම අවබෝධයෙන්ම මිදිලා තියෙන්නේ එතන **සංඛිත්තේ නිබ්බිදාය** කියන තැනින් **එතකොට පටිවිරතෝ කියන්නේ ඒවා ඒ විදිහට මගේ කරගන්න ස්වභාවය නැති වෙන්නේ.** මේ කියන දේවල් හොඳින් නුවණින් දකින්න. ඔබ දකින්න සැබෑම රහත් භාවය කුමක්ද? ඒක නිසා බොහොම පරෙස්සමින් ඒ දිහා බලන්න. පිරිසිදු වෙන්නේ ඕනේ. ඒ නිසා මේ හෙළිදරව් කිරිම වැදගත්. ඔබට ජබ්බි සෝධන සූත්‍රය මේ ටික බලන්න පුළුවන්. මේ **පටිවිහරති කියන එක** හැබැයි වැරදියට **විග්‍රහ කරන්න පුළුවන්. පටිවිහරතී කියලා කියන්නේ සාමාන්‍ය විදිහටම ඒවා භාවිතා කරනවා නමුත් බැඳිලා නෑ කියන එක.** හැබැයි ඔබ එතනදිත් රැවටෙන්න එපා. එහෙනම් අල්පේච්ඡතාවය තියෙන්න ඕනි.එහෙනම් මහේච්ඡතාවය තියෙන්න බෑ. එහෙනම් මහේච්ඡතාවය තියෙනවානම් පටිවිහරති ඒ උනාට මම කනවා, බොනවා කියනවා, එතන මහේච්ඡතාවයක් තියෙනවා. **මම මේවා භාවිතා කරනවා කියනවා නම් ඒ මහේච්ඡතාවය. එතන අල්පේච්ඡතාවයක් නෑ.** ඊගාව එක තමයි එක් වේල වළඳති තියනකොට මෙතන පැහැදිලිවම රහතන් වහන්සේ මේ සේරගෙන්ම අතහැරීමේ ස්වභාවය. පැහැදිලි කරනවා. අතහැරීමේ ස්වභාවය, අතහැරෙන ස්වභාවය එය සියල්ලම පැහැදිලි කරනවා. එතකොට සම්පූර්ණයෙන්ම ගිහි ගෙයින් නික්මෙන ස්වභාවයක් පැහැදිලි කරනවා. එතකොට පටිවිහරතී කියන එකෙනුත් ඒවා හරියටම විග්‍රහ කරගන්න. ආයෙ ගිහියෙක් වෙන්නේ නෑ. ආයෙ පෘතග්ජනයෙක් වෙන්නේත් නෑ. ඒ කියන්නේ රහතන් වහන්සේ කියන්නේ ඔබ දකින්න මේ පෘතග්ජනයා කියන එක්කෙනාවත්, මේ ගිහි කියන

එකවත්, පැවිද්ද කියන එකවත්, මේ වචන වලින්වත්, ඇඳුම් වලින්වත් නෙමෙයි ඔබ මේක හොඳින් දකින්න. ඔබ දකින්න ඔබගේ අභ්‍යන්තර පරිවර්තනය තුළ මේ **අනාත්ම ධර්මය තුළ ආත්මයක් නැති බවට ඔබ අවබෝධයට පත් වන කොටයි මේ පටිවිහරති කියන එක වෙන්නේ. ඒකත් නුවණින් දකින්න. මේ සැබෑම භික්ෂු කමද කියලා භික්ෂු සූත්‍රයේ තියෙනවා. ඒ අරමුණේ සත්‍යය දැකලා දෙයක් කර ගන්නේ නැති තැන භික්ෂුවක් ඉන්නේ.** එහෙම දෙයක් කරගෙන ඒ පැත්තෙ බහිනව නම් ඒත් එක්ක දඟලනවා නම් එතන භික්ෂුවක් නෑ. එතන පෘතග්ජනයි. ඒ ශ්‍රමණ සූත්‍රයත් ඒ විදියටම දකින්න. පැවිද්ද කියන එක වත, ගිහිවත, පැවිදිවත, වත වෙනයි, ශ්‍රමණ වෙනයි, භික්ෂු වෙනයි, අරහත්වය වෙනයි පටලවා ගන්න එපා. ඇඳුම් වලට වඳිනවා කියන කතාව දැන් ඉවරයි. ඒ කාලෙ ගියා. දැන් සැබෑම භික්ෂුව දකින්න. මේක සැබෑම අරහත්වය තුළ මහත්ඵල උතුමන්ට කරන වන්දනාවක්. ධම්ම කියන එක අඳුන ගන්නත් බෑ ඒ අයට. ඒ අය දන්නෙ නැහැ ආර්ය විනය කියන්නේ මොකක්ද කියන එකවත්. මේ සිත තුළ. මේ සිතෙන් මිදෙන මඟ. ශූන්‍යත පටිසංයුක්ත දේශනා ඒ අය ඇසුරු කරන්නේ නෑ. ඒක නිසා ඒ අයට ධර්මය හම්බ වෙන්නේ නෑ. අපි ධර්මයේ සත්‍ය පිරිසුදු කරගන්න ඕනා. එහෙම වුනොත් තමයි අපේ භික්ෂූන් වහන්සේලා පවා පිරිසුදු වෙන්නේ. සත්‍යම දකිනවා.

**"සබ්බ දුක්ඛනිස්සරණ නිබ්බානාය සච්ච කරනත්තාය ඉමං කාසාවන් ගහේත්වා"**

කියලා මේ කසාවත දරන්නේ. එහෙනම් ආයෙ යන්නේ පිණ්ඩපාතේ. එහෙනම් ඒ මොකක් සඳහා ද? **සිතට එන අරමුණු සත්‍ය දැකලා මිදීම සඳහා, ස්කන්ධයේ උදය වැය**

**දැකීම, උපාදානස්කන්ධය මිදෙන සීලය රකින්න ඕන නිසයි සිව් පසෙන්. සිවුපසය අවශ්‍ය නිසයි පැවිදි වෙන්නේ. අනුකම්පා උපාදාය කියලයි ඉල්ලන්නේ.**

**සබ්බ දුක්ඛනිස්සරණ** - දුකින් මිදීම සඳහා

**නිබ්බානාය සච්ච කරනත්තාය** - නිවන් දැකීම සඳහා අනුකම්පං උපාදාය මට අනුකම්පා කරන්න ස්වාමීනි, ඔය පැවිද්ද මට දෙන්න ස්වාමීනි.

**සබ්බ දුක්ඛනිස්සරණ නිබ්බානාය සච්ච කරනත්තාය ඉමං කාසාවන් ගහේත්වා පබ්බාජ්ජාය** - ඔය පැවිද්ද මට දෙන්න ස්වාමීනි. ඒ විදිහටයි පැවිද්ද ඉල්ලන්නේ. මොකක්ද? මේ වත,මොකක්ද භික්ෂුව කියලා, මොකක්ද ශ්‍රමණ, මොකක්ද අරහත්වය කියලා. මේ බුදුන් වහන්සේ ගෙනුත් ප්‍රශ්න අහනවා. සැරියුත් හිමියන්ටත් සාමණේර හිමියෝ බීම ගෑවෙනවා සිවුර කියනවා ඒත් ඒ තරම්ම සාසනයේ විනිවිදභාවයක් තියෙනවා.එදා බුදු සමයේ බුදුන් වහන්සේගේ ගෙන් ප්‍රශ්න අහනවා. බුදුන් වහන්සේ පිළිතුරු දෙනවා. නිගන්ඨයොත් අහනවා ඇවිල්ල ප්‍රශ්න බුදුන්වහන්සේ එලවනවද ? නෑ පිළිතුරු දෙනවා. සාකච්ඡා කරනවා. ඇයි ඒ ඒක තමයි මේ ධර්මය තුළ තියෙන විනිවිද විනිවිදභාවය

ජබ්බි සෝධන සූත්‍රය බලන්න ඕනා. ඒකෙ තියෙන 49 වන පිටුව හොඳට බලන්න. ඒ තුළ තියෙනවා මේ රහතන් වහන්සේගේ **මෙන්න මේ කියන පස්වෙනි ආකාරය පොඩ්ඩක් බලන්න. ඒකෙ අල්පේච්ඡ තාවය කියන්නේ කුමක්ද කියල බලන්න.** එකේ මහේච්ඡතාවයක් නෑ. අන්න ඒක හොඳින් හඳුනගන්න. පටිවිහරති තමයි. පටිවිහරති උනාට අපි මෙක සිතින් බැඳිල නෑ. නමුත් පරිහරණය කරනවා කියලා

තමන්ට ඕන දේ කරන්න බෑ. ඒක හොඳින් දකින්න මේකට ගැලපෙන්නේ නැහැ. එහෙම වුනොත් ඒ අල්පේච්ඡතාවය තියෙන්න ඕනි. ඒ මහේච්ඡතාවය නෙවෙයි. එහෙනම් ලද දෙයින් සතුටු වෙන්න ඕන ඉල්ලගෙන කන්න බෑ. එහෙනම් තමන්ට රස පිනවන්න නෙමෙයි ඒ

**නෙවදවාය, දඩමන්ඩායන, මනඩනායන, න භූෂ නට්ඨායන**

කියන ඒ විදිහට නෙමෙයි අර ශරීරය වර්ණවත් කරගන්න මේ අනිත් අයට පේන්න, කැපිල පේන්න එහෙම ආහාර ගන්න එකක් නෙවෙයි.

තෙරුවන් සරණයි !!!

# ජබ්බි සෝධන සූත්‍රය - 03

**තෙරුවන් සරණයි !!!**

**ජබ්බි සෝධන සූත්‍රය - මජ්ඣිම නිකායේ තුන්වෙනි කාණ්ඩය බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ 12 වන ග්‍රන්ථය. 149 පිටුව**

පුද්ගල සරණ නොව නිවැරදි ධර්මයේ සරණ යන්න

මේ ජබ්බි සෝධන සූත්‍රය අපි මේ තුන්වන කොටස ඉදිරිපත් කරන්නේ. පළවෙනි කොටසෙත්, දෙවැනි කොටසෙත් ඔබට අහන්න ලැබුණා රහතන් වහන්සේ නමක් කෙසේ හඳුනා ගනීද කියලා. බුදුන් වහන්සේ යම් මහණෙක් පැමිණ මම රහත් කියල කිව්වට පිළිගන්න එපා කියලා දේශනා කළ වදාළා. මහණෙනි, ඒ පිළිකෙව් කරාට බැහැර කරන්න. අභිනන්දනය නොකලව එය බාර ගන්න එපා කිව්වා. දැනුත් ඉන්නවා මම රහත් කියන අය ඕන තරම්. බුදු සමයේත් ඉඳලා තිබෙන බව අපට එතකොට පැහැදිලි වෙනවා. බුදුන් වහන්සේ ඊට පස්සේ කියනවා මෙන්න මෙසේ, එසේනම් ඒ මහණ ගෙන් ප්‍රශ්න කළ යුතුයි කියලා. හැබැයි ආකාර දහයකට වැඩිය බුදුන් වහන්සේ ප්‍රශ්න කළ යුතු ආකාරය ගැන පැහැදිලි කරනවා. එයින් ආකාර දෙකක් අපි මුල් කොටසේ දී පැහැදිලි කළා. එතනදී සතර වෝහාර

**ගැන ඊට පස්සේ පංච උපාදානස්කන්ධ ගැන, කෙසේ විය යුතුද?** රහතන් වහන්සේගේ පැහැදිලි කිරීම් කියන එකත් බුදුන් වහන්සේ පැහැදිලි කරනවා. සතර වෝහාර ප්‍රශ්න කරනවා වගේම දෙන පිළිතුරත් මෙසේ විය යුතුයි කියලා පැහැදිලි කරනවා. එහෙම නෙවෙයි නම් එතන '**ඛීණා ජාති, වුසිතං, නාපරං ගත්තං**" කිව්වට වැඩක් නෑ. එහෙම දෙයක් වෙලා නෑ කියනවා. කෙලෙස් තියනවානම් **ඛීණා ජාති, වුසිතං** කියලා කටින් මම රහත් කියලා කියන්නෙත් නෑනේ. ඇත්තටම එතකොට කෙලෙස් තියෙන නිසානෙ කියන්නේ. කෙලෙස් නැත්නම් කියන්නේ නැහැනේ. ඒකෙනුත් ඒක පැහැදිලි වෙනවා. **දැන් බුදුන් වහන්සේ මෙතැනදී මේ සතර වෝහාර රහතන් වහන්සේ නමක් නම් මෙන්න මේවා පැහැදිලි කරන්න ඕනා.** හැබැයි මෙතන වාක්‍ය වචන ලිව්වට මෙතන ගැබ් වෙලා තියෙන අරුත ඇත්තටම රහත් වෙනකම්ම කෙනෙකුට තේරෙන්නේ නෑ. මොකද පෘතග්ජන භූමියට මේක වැටහෙන්නේ නෑ. හැබැයි මේකේ ඒ අරුත ඒ තමයි අපි මේ ඔබට පැහැදිලි කරන්නේ.ඒක අපි හොඳට පෙන්නනවා. මෙවැනි ස්වභාවයක් තියෙනවනම් මෙන්න මේ ස්වභාවය නම් පමණයි බුදුන් වහන්සේ බාර ගන්න කියන්නේ. නැත්නම් පිළිකෙව් කරව. බැහැර කරන්න කියලා කියනවා පිළිගන්න එපා කියලා කියනවා.

**පංච උපාදානස්කන්ධයත් එහෙමයි. ඒ බාහිර හමුවෙන්නෙ නැති බව. මේ සේරම සිතම බව, සිතුවිලිම බව, සිත කියලා දෙයක් නැති බව, ආත්මයක් කියලා දෙයක් නැති බව මෙතන ආත්මයක් දෙයක් තියාගෙන රහත් වෙන්නේ.** නෑ කවුරුත්. අරහත්වය කියලා කියන්නේ මොකක්ද බලන කොට **"සෝපදි ශේෂ නිබ්බාන". ඒ කියන්නේ ඇත්තටම සම්මුතියේ**

කිව්වොත් එහෙම මැරිලා ඉවරයි. දැන් මම මැරුණා කියලා කියන්නේ. ඊට පස්සේ රහනැති වෙනවා කියන එක. "සළායතන ලෝකෝ ලෝකං, සළායතන නිරෝධෝ නිබ්බානං" ඇස, කන, දිව, නාසය පිනවීමයි ජීවත් වෙනවා කියන්නේ. එහෙනම් ඇස, කන, දිව, නාසයෙන් දෙයක් කරගන්නේ නැත්තම් අන්න එතනයි අරහත්වය. හැබැයි මේක වචනෙකට දැනුමකට නෙවෙයි. ඒ බවට පත්වෙනව අරහත්වය බවට දෙයක් කර නොගැනීම තුළ සිද්ධ වෙන සිද්ධිය. ඊට පස්සේ ඒ අල්පේච්ඡතාවය ඒක බත වළඳන එක, එක් වේලෙහි බත වැළඳීම. බුදුන් වහන්සේ මනාකොට පෙන්වනවා මේක. මේ දෙවෙනි කොටසේ දී අපි ඔබට පැහැදිලි කළා ඒ රහතන් වහන්සේ උපාදානස්කන්ධයෙන් මිදුණු ස්වභාවයට පස්සේ අජ්ඣත්ත බහිද්ධා කියන ආයතන දෙක. අජ්ඣත්ත ආයතන, බහිද්ධා ආයතන, සය ආයතන මේ අජ්ඣත්ත, බහිද්ධා කියලා ආයතන දෙකක් ස්වභාවය මෙන්න මේ රහතන් වහන්සේ ප්‍රශ්න කරන්න.

අජ්ඣත්ත, බහිද්ධා ආයතන එතකොට රහතන් වහන්සේට අජ්ඣත්ත ආයතනයවත්, බහිද්ධා ආයතනයවත්. ඒ වගේම පටිත්තිත විඤ්ඤාණයවත් හමුවන්නේ නෑ. ඒ මොහොතේ ඇතිවන විඤ්ඤාණය ඒ මොහොතේම හටගෙන නිරුද්ධ වෙනවා. පවතින විඤ්ඤාණයකුත් නෑ. ඒ විතරක් නෙමෙයි මේ ස්වභාවය තුළ දැන් මේ තුන්වෙනි කොටසේදීත්, අජ්ඣත්ත බහිද්ධා කොටසේදීත් අපි දෙවන කොටසේ දී පැහැදිලි කරා. ඒ වගේම දෙවෙනි කොටසේදී මේ තණ්හා, මාන, දිට්ඨි ස්වභාවය ඒ තෘෂ්ණාවේ ස්වභාවය පැහැදිලි කළා. අහංකාර, මහංකාර, මාන, අනුශ ස්වභාවය පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස ධාතුත්, විඤ්ඤාණ

ධාතුත්, කියන සාය ධාතු දෙවැනි කොටසේ දී පැහැදිලි කළා. දෙවැනි කොටසේ දී අපි එනකොට ඒ දෙවෙනි කොටසෙදි අපි ඔබට අන්තිමට පැහැදිලි කරා ඉතාම වටිනා මේ අල්පේච්ඡතාවය මහේච්චාව නැති බව. ඒ වගේම ඒ දුන් දේ ඉල්ලගෙන වළදන්නේ නෑ කියන එක, ලැබුණු දෙයක් පමණක් වළඳනවා කියන එක. සිව්පසය පරිභෝජනය කරන ආකාරය ඒ අබ්‍රහ්මචාරි ස්වභාවය ඒක මනා කොට පැහැදිලි කරනවා. බුදුන් වහන්සේ මෙන්න මෙසේ විය යුතුයි කියලා රහතන් වහන්සේ ගේ ස්වභාවය අපි දෙවෙනි කොටසෙදි පැහැදිලි කළා. ඒ වගේම භෝජනය ගැන පැහැදිලි කලා. ඒ අර ප්‍රත්‍යවේක්ෂා කරන ආකාරයටම බුදුන් වහන්සේ පටිවිරතෝ කියන තැනින් පටිවිරතෝ අහෝසිං මේ විදියට මේකෙ අපි දැන් මෙතැන දී මේ පැහැදිලි කරන කාරණා ඉතාම වැදගත් වෙනවා. අපි දැන් මේ කොටසේදි ඔබට ඉදිරිපත් කරන මේ තුන්වෙනි කොටසේදි රහතන් වහන්සේලා දෘෂ්ටිගත වෙලා ඉන්න හැටි දේශනා කරන කොට භාවය පතන ඒවා සිද්ධ වෙන්නේ නැති බව.

මෙය හොඳින් ප්‍රත්‍යක්ෂතාවයට එනතෙක් ඔබ සන්දිට්ඨිකව ඔබගේ සියත් නුවණ එක්ක ඔබගේ ගමන යනවා නම් ඔබට දැනෙයි මේ අල්පේච්ඡතාවය තුල කෙනෙක්, පුද්ගලයෙක්, සත්වයෙක් හමුනොවන බව ස්වභාව දහමටම දියවී යනවා. ඒ තුළ ඇතිවන්නේ නාම රූප වලින් මිදුන ස්වභාවයයි. ඒ නාම රූප වලින් මිදුන ස්වභාවය තුළ රූපයක් හදාගෙන කෙනෙක් ගේ පින්තූරයක් දාගෙන ඒ ලාභ, කීර්ති ප්‍රශංසා බලාපොරොත්තුවක් කවදාවත්ම ඇති වෙන්නේ නෑ, කෙසේවත් ඇති වන්නේ නෑ. රහතන් වහන්සේ නමකට එය කෙසේවත් සිදුවන්නේ නෑ. එය කෙදිනක වත්

සිදුවන්නේ නෑ. කෙසේවත් සිදුවන්නේ නැහැ. ඇත්තටම කීව්වොත් එය ලැජ්ජාවට කරුණක් රහතන් වහන්සේ නමක් නම් රහතන් වහන්සේට එය ලැජ්ජාවක්. ඒ කියන්නේ උන්වහන්සේ කැමති වෙන්නේ නෑ. බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලා අතර යම්කිසි අඩදබරයක් සිද්ධ වුනොත් බුදුන් වහන්සේ ගහගන්න යනවද? නෑ බුදුන් වහන්සේ හෙම්හිට අන්ධ වනයට වඩිනවා. අන්න එයයි රහතන් වහන්සේගේ ස්වභාවය පෘතග්ජන භික්ෂූන්ට අන්තයක් තියෙනවා. දෙයක් තියෙනවා. ඒක නිසයි මේ විවිධාකාර දේවල් කරන්නේ. ඒ ආයතන ඔස්සේම එන ඒ පිනවීමක් ඔස්සේමයි. නමුත් ඒවායින් ඉවත් වුනහම ආයතන පින්වීමෙන් ඉවත් වුණාට පසුව එයින් මිදුනට පසුව චිත්ත විමුක්තියට අනිමිත්ත නම්, නිමිති ප්‍රකට වෙන්නේ නැත්නම්, ශූන්‍යත නම්, අප්‍රනිත නම් කතා කරන්න දෙයක් ඉතුරු වෙන්නේ නෑ. ඒ උත්තරීතර හුදකලාවයි. ඒ නිහැඬියාවයි. ඒ එක් බත වැලඳීමට හේතුවයි. එය අල්පේච්ඡතාවයට හේතුවයි. ඒ සැබෑම රහතන් වහන්සේ කෙසේ විය යුතුද කියලා ඒකයි මේ ජබ්බි සෝධන සූත්‍රය තුළ බුදුන් වහන්සේ ගෙන හැර දක්වන්නේ.

එකේ 3 වන කොටසේදී ඔබ දැන ගත යුතුම කාරණා එතනත් ඔබට පැහැදිලි කළ යුතුයි. ඒ කාරණා ඔබ දැනගත යුතුමයි. ඒ දෙවන කොටසේ පැහැදිලි කරපු කාරණාව වගේම 3 වන කොටසට එනවිට ඔබට අහන්න ලැබෙනවා, ඔබට දකින්න ලැබෙනවා මේ 149 පිටුවේ **ඒ ලාභ ප්‍රයෝජන, කීර්ති, ප්‍රශංසා, සත්කාර, දැසිදස්සන්, මිල මුදල්, භවබෝග මේවා ගැන පරිහරණයන් නැති බව රහතන් වහන්සේගේ අවසානයේ දී අපි දෙවන කොටසේ දී පැහැදිලි කළා. ඒ ගිජුභාවයෙන් මිදෙනවා. ඒ විකාල භෝජනවලින් මිදෙනවා. මුසාවාදා, පිසුණාවාචා, පරුෂාවාචා, සම්ප්‍රප්පලාපා කියන**

මේ කටමැත දෙඩවිලි වලින් විතක්ක වලින් ගොඩක් මිදිමක් තියෙනවා. ඒ රහතන් වහනසේගේ ස්වභාවය ඒ වගේම ඔබට යමක් කියන්න ඕනි. ඒ සබ්බ්‍රහ්මචාරී ස්වභාවය හඳුනාගන්න. ඔබ බොහොම පරිස්සම් වන්න. යමෙක් මේ අරහත්වයට පත්වේ නම් ඒ අරහත්වය තුළ ඔබ දකින්න එපා එක මහා නුවනින් දකින්න. අද සමාජයේ ගොඩක් පටලැවිලි තියෙනවා. ගොඩක් සිර වුන තැන් තියෙනවා. ඒ අනවබෝධය නිසයි. සිද්ධ වෙලා තියෙන්නේ. අපි තුන්වන කොටසට ආවොත් බුදුන් වහන්සේ නැවතත් මෙන්න මෙහෙම ප්‍රශ්න කරනවා. රහතන් වහන්සේ නිමිති නොගත යුතුයි කියලා. ඒ නිමිති අනුව්‍යඤ්ජන නොගත යුතුය. ඒ කියන්නේ නිමිති කියන්නේ දැන් මේසේ, පොත, ඇඳ, ඉර, හඳ, ගහ, කොළ, දොරවල් මේ නිමිතිගතයි. නිමිත්තක් හට ගන්නේ නාම රූප විඤ්ඤාණ මායාව දෙයක් කර ගැනීමයි. බාහිර පතිත වීම තුළ නිමිත්තක් හටගන්නවා තියෙනවා කියලා දැනෙන එක. ඉත්තත්වය - සත්ව පුද්ගල ස්වභාවයයි. ඒ දෙයක් කියලා ගැනීමමයි. ආත්ම ස්වභාවය, අපි ගත්තොත් දැන් මේ මම කියලා කියන්නේ නම් මේසේ, මේ පුටුව, මේ ඇඳ, මේ ඉර එහෙම නම් මේසේ දකින මම ඉන්නවා

ඒතං මම - ඒසෝ හමස්මිං
ඒමේ සෝ අත්තා

මම, මගේ, මගේ ආත්මය කියන එක. මේ ශරීරය මම කියලා ඒතෙන්ට නෙවෙයි මේක ගැට ගහන්නේ අපි දන්නවා

රූපං අත්තතෝ සමනුස්පස්සති
රූප වත්තං අස්සතෝ සමනුප්පස්සති
රූපස්මිං වාතාං අත්තනු සමනුප්පස්සති
අත්ත නීවා රූපං සමනුප්පස්සති

රූපයමයි ආත්මය කියලා හිතනවා. ආත්මය රූපය කියලා හිතනවා. රූපය තුළ ආත්මයක් තියෙනවා කියලා හිතනවා. ආත්මය තුළ රූපයක් තියෙනවා කියලා හිතනවා මොකක් ද මේ රූපය?මොකක්ද මේ ආත්මය. රූපය කියන්නේ දෙයක් කියලා ගත්තොත් ඒ රූපාරම්මණයයි. රූපය කියන අපි කිව්වේ අන්න ඒ නිසයි. දෙයක් මේසයක්, පොතක් ,පුටුවක්, ඇඳක්, දෙයක්. ඒ රූපාරම්මණයටයි . ඔබ කිව්වේ

**චත්තාරෝච මහාභූතානං - චතුන්නංච මහා භූතානං - උපාදාය රූපං රුප්පං**

කිව්වට

**රුප්පංතිකෝ ආවුසෝ රූපං** - රුප්පනය නිසා රූපයක් හැදෙන්නේ

**රූපං රූප්පත්තාය සංඛතං අභිසංකරෝති**

රූපය දෙයක් බවට පත්වන්නේ අභිසංස්කරණය, ඔය තුනම නැතුව මෙතන රූපයේ විග්‍රහය කිරීම වරදිනවා. ඕනම කෙනෙකුට එක කෑල්ලක් විග්‍රහ කිරීමෙන් ඵලක් නැහැ. මේ රූපය කියලා කියන්නේ මේ ධර්මය සම්පූර්ණයෙන්ම. **"මනෝ පුබ්බං ගමා ධාම්මා", "චිත්තේන නීයති ලෝකෝ"** ගැනයි. එහෙනම් එය සිතකයි සකස් වෙන්නේ. මේ අපි කතා කරන බාහිරේ කියලා හිතන එකත් සිතකයි සකස් වෙන්නේ . ජේනව නෙමෙයි, හිතනවා කිව්වේ අන්න ඒ නිසයි. අජ්ඣත්ත බහිද්ධා කියලා රහතන් වහන්සේට අන්ත දෙකක් හම්බ වෙන්නේ නෑ. ඒක පෘථග්ජන භූමිය තමයි ආ බාහිර කියලා ගැටගහල. එහෙනම් මේ රූපය කියලා කියන්නේ රූප සංඥාවක්. එහෙනම් . ඒයත් විඥ්ඥාණ මායාවෙන් මේ සිතින්ම හදාගත්ත විඥ්ඥාණයක්. විඥ්ඥාණය ඒ මොහොතේ දැනගැනීම පමණයි. විඥ්ඥාණය කියන්නේ

පවතින එකක් නෙමෙයි එතනම හටගෙන නිරුද්ධ වෙනවා. එතනම මේ මොහොතේම දැන ගත්ත ඒ මොහොතේම දැනග ැනීමක්. දැනගැනීමක් පමණයි. එච්චරමයි පැවැත්මක් නෑ විඤ්ඤාණයට. ඒකයි විඤ්ඤාණය අපි සිතක් කියනකොට අර ගගක් වගේ ප්‍රවාහයක්. ඒ විඤ්ඤාණ ප්‍රවාහයට තමයි සිතක් කියන්නේ. පවතින විඤ්ඤාණයක් නැහැ. පවතින සිතකුත් නෑ. එතකොට, මේ මොහොතේ මේ තියෙන සිත නෙමෙයි ඊගාව මොහොතේ තියෙන්නේ, පවතින සිතක් නෑ. හැබැයි මේ අවබෝධය තුළ මොකක්ද සිද්ධ වෙන්නේ ඔබ හිතන්න එපා ආ මුකුත් නෑ ආ දැන් රහත් එහෙම නෙමෙයි මේ රහත්භාවය.

තාම කාරණා ඉදිරිපත් කරල ඉවර වුණේ නෑ. ආශ්‍රව කෙලෙස් ක්ෂය වෙන්න ඕනා. ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේ කියලා කියන්නේ. තාම ඒ කාරණා ඉදිරිපත් කළේ නෑ. ඒකයි මේ කොටස් වශයෙන් ඉදිරිපත් කරන්නේ. මේ සූත්‍රයේ තියෙන ආකාරයට ඡේදයෙන් ඡේදයට අරගෙන. හැබැයි ඒක සම්පූර්ණ වෙන්න නම් අර ආශ්‍රව කෙලෙස් ක්ෂය වුණ තැනින් තමයි රහතන් වහන්සේ කෙනෙක් බවට පත් වන්නේ. ඒ තාක් අර චිත්තාරෝපණය තියෙන තාක් කල් ආත්ම සංඥාව ගිලිහෙන්නේ නෑ. රහත් කීවට දූන් කෙලෙස් තියෙනවා. දැන් මොකද කරන්නේ. දැන් හිතෙන දේවල් කනවා. හිතන දේවල් පරිහරණය කරනවා. දැන් ඒක රැවටිල්ලක් බවට පත්වෙනවා. මේක දකින්න ඕනා මහා නුවණකින්. කුමක්ද? මේ පවසන කාරණාව කියන එක. දැන් මේ මෙතන මේ නිමිති, අනුව්‍යඤ්ජන ගන්නේ නෑ කියන කියන තැන. රහතන් වහන්සේට මෙතන දෙයක් හම්බ වෙන්නේ නෑ කියන එක. අර "ධම්ම" කිව්වේ "පටිච්ච

**සමුප්පාදේසු ධම්මේසු ධම්මං" කිව්වේ දෙයක් තිබ්බොත් ධම්ම දෙයක් නැතිනම් ඉදප්පච්චතාවය.**

**ඉමං සති ඉදං හෝති -ඉමස්මිං අසති ඉදං නහෝති**
**ඉමස්මිං උප්පාදා ඉදං උප්පජ්ජති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ජති**

මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ. මෙය ඉපදුනු කල්හි මෙය උපදී. මෙය නිරුද්ධ වූන ක ල්හී මෙය නිරුද්ධ වේ. මොකක්ද මේ කියන සමීකරණයක් වගේ **ඉදප්පච්චතාවය.** පටිච්ච සමුප්පාද ධර්මය "**ධම්මේසු ධම්මා**" කිව්වේ දෙයක් නැති බවයි. දැන් චිත්‍රයක අඳිනවා පුටුවක්. ඔබ ඇත්තට දකිනවා පුටුවක්. දැන් චිත්‍රයේ ඇඳපු පුටුවේ පුටුවක් නැද්ද? නෑ. පුටුවක් තියෙනවා. එතන පුටුවක් කියලා දෙයක් තියෙනවද?හැබැයි චිත්‍රයක පුටුවක් කියලා දෙයක් නෑ. හැබැයි පුටුවක් නැද්ද? ආ එතන පුටුවක් තියනවා. මෙන්න මේක තමයි හිස් බැල්ම රහතන් වහන්සේත් ඇත්තටම මොකක්ද මේ නිමිති. නිමිති නැතිකම මේ මොකද්ද? මේ කියන නිමිති නොගන්නා සුළුයි කිව්වේ කුමක්ද?

දැන් පුටුව කියලා නිමිත්තක් නැද්ද කොලේ. තියෙනවා. දැන් ඇත්තටම එතන පුටුවක් තියෙනවද? දෙයක් නෑ. දැන් මොකක්ද මේ අනිමිත්තයි කිව්වේ. දැන් සාමාන්‍ය ස්වභාවය තමයි විඤ්ඤාණය නැති වෙන්නේ නැහැනේ. විඥානය අනිදස්සනන් කියන්නේ විඥානය අනිදස්සන වෙනවා කිව්වේ ඔන්න ඕක නිසා තමයි. ඔය වචනේ දැම්මේ. විඤ්ඤාණය කියන්නේ ඒ මොහොතේ දැනීම. ඒ මොහොතේ මට හටගත්ත එක. ඒ කියන්නේ මොහොතක්වත් සිත පවතින්නේ නෑ. නමුත් ඒ මොහොතේ විඤ්ඤාණය. එතකොට සිතක්

කියලා දෙයක් නැහැ. සිතක් තියෙනවා නම් විඤ්ඤාණ ප්‍රවාහයකට තමයි සිතක් කියන්නේ. ඒ මොහොතේ එක ක්ෂණයකට නෙමෙයි සිතක් කියන්නේ. දෙයක්, බිත්තියක් කියලා පේනවා වගේ පේනකොට චිත්තක්ෂණ කෝටි ගානක් පහළ වෙනවා කියන්නේ ඔන්න ඔය නිසයි. ඒ කියන්නේ ප්‍රවාහයක් ගඟ ගලනවා. ගලන ගඟට, ගඟ තියෙනවා වගේ ගන්න නම්, ප්‍රවාහයක් වෙන්න ඕනා. දැන් මේක හඳුනාග න්න මහා නුවණින්. එතකොට දැන් මේ නිමිත්තක් නිමිති නොගන්නා සුළුයි කියන එක ගැඹුරු ම කාරණාවක්. මේක රහතන් වහන්සේගේම ස්වභාවය ප්‍රත්‍යක්ෂතාවයකින්මයි එළිවෙන්න ඕනා. අපට ඒ ප්‍රත්‍යක්ෂතාවය තුළ අපි ඒ හෙළි කරන කාරණා ඔබ ගලපලා බලන්න. ඔබටත් වැටහේවි. මේ ධර්මය ගැලපුණොත් විතරයි ඔබට එය වැටහෙන්නේ. මේක නුවණින් දකින කාර්ණාවක්. පොතකින් හොයන්න බැරි එකක්. මේක පොතේ ලියන්න බැරි ධර්මයක් වෙන්නේ මෙන්න මේ නිමිති නො ගන්නා සුළුයි කියන තැන තමයි, පොතක ලියන්න බැරි. අනිමිත්ත නම් කොහොමද පොතක ලියන්නේ. අනිමිත්ත දෙයක්. ඔන්න ඕක ලියන්න බෑ. නමුත් මේ අත්දැකීම ඔබට උපමා උදාහරණ සහිතව මේක පැහැදිලි කළ හැකියි කුමක්ද මේ කියලා. ඒක තමයි මාලුක්‍යපුත්ත සූත්‍රය තියෙන වටිනාම කම. මේ සූත්‍ර දේශනාවල අපි දකින වාටිනාම සූත්‍රයක් ඒක එතන තියෙන්නේ මොකක්ද සමාජයටත් හොයන්න බැරි කිසි කෙනෙකුට දකින්න බැරි ගැඹුරුම ඒ අත්දැකීම තියෙන්නේ අන්න ඒ මාලුක්‍යපුත්ත සූත්‍රය තුලයි. ඒක තමයි මේ හැම තැනම ඔබට මතුවෙන ඔබට හොයාගන්න බැරි අර අවිධිමත් ස්වභාවය කියන එක. **ඒ අනිමිත්ත ස්වභාවය තමයි.**

**අපි දැන් ඊළඟ කාරණා විදිහට බුදුන් වහන්සේ ප්‍රශ්න කරන්න කියන්නේ නිමිති නො ගන්නා සුළුයි කියන එකයි.** රහතන් වහන්සේ කියලා කියනවා නම් කවුරුහරි මම රහත් කියලා අන්න ඔහුගෙන් මේ ප්‍රශ්න කරන්න කියලා. කියපු ප්‍රශ්න දහයකට වැඩි ප්‍රමාණයක්. ඔබට මේ ටිකෙන් ටික ඉදිරිපත් කරන්නේ. ඇත්තටම කිව්වොත් ඉදිරිපත් කරගෙන ආපු ප්‍රශ්න මාලාව අපි මෙහෙම අංක විදිහට සඳහන් කරත් ඊට වැඩිය අනුගත ප්‍රශ්න ගොඩක් තියෙනවා. එක ප්‍රශ්නෙක යටින් තියෙනවා තවත් ප්‍රශ්න මාලාවක් ගොඩ ගැහිලා. ඇත්තටම ඒවා ගළපන්න බෑ. ඒවා පොතක් බලලා කියන්න බෑ. අත්දැකීමක්ම වෙන්න ඕනි. ඇත්තටම රහත් භාවයට පත් වෙන්න ඕනි. සැබෑ ලෙසම නම් මෙය පැහැ පැහැදිලි කරන්න. මෙය පොතක ලියන්න බෑ. ඒක නිසයි පොතකින් හොයන්නත් බෑ. ඒක අත්දැකීමක්. ඒක කෙනෙකුට, පුද්ගලයකුට අත් දකින්නත් බෑ. කෙනා පුද්ගලයා නැති වෙන තැනයි ඒ අත් දැකිම එන්නේ. ඒ මේ මොහොතේම මේ ක්ෂණයෙන්ම අත් දකින්න ලැබෙනවා. මැරිල ලබන දේකුත් නෙමෙයි. මේ ක්ෂණයේ මේ ධර්මය ශ්‍රවණය කරන කොටත් ඒ අත්දැකීම ඇතිවෙනවා. ඒක අන්න කොණ්ඩඤ්ඤ වැටහුණා කියල කිව්වේ අන්න කොණ්ඩඤ්ඤට වැටහුනා කියල කිව්වේ. අන්න කොණ්ඩඤ්ඤ මේ නිමිති නොගන්නා සුළු අනිමිත්ත ස්වභාවය තමයි ගොඩක් අයට තේරෙන්නේ නැත්තේ. බොහෝ අය දන්නේ මේ සිතේ ස්වභාවය. අනිමිත්ත පොත. පොත කියන්නේ නිමිත්ත. මේසේ කියන්නේ නිමිත්ත. අනිමිත්ත කියනකොට හිතනවා ආ පොත කියලා දෙයක් නෑ. පොත හම්බු වෙන්නේ නෑ. දැන් රහතන්වහන්සේට පොත් නෑ, මේස නෑ, මුකුත් නෑ. එහෙම හිතනවා, හිතනකොට අන්න ඒක අනිමිත්ත කියලා හිතනවා. නිමිති නෑ. පොත් නෑ

කියලා රහතන් වහන්සේ වෙනද විදියටම පේනවා, වෙනද විදිහටම ඇහෙනවා, අන්ධ වෙලා නෑ, බීරි වෙලා නෑ. වෙනද විදියටම දැනෙනවා. හැබැයි මෙතන ඊට වැඩිය ගැඹුරු කාරණාවක් කියනවා. ඒ හිස් බැල්ම කියලා අපි කිව්වේ ඒ නිසයි. ඒ කියන්නේ පොත කියලත් දන්නවා. අර චිත්‍රෙ වගේ චිතේ පුටුවක් තියෙනවා. හැබැයි ඇත්තටම චිත්‍රෙ පුටුවක් කියලා දෙයක් නෑ. රත්තරන් පවුමක වටිනාකමක් චිත්‍රෙක තියෙනවාද ? නැ ඒක පින්තූරයක් විතරයි. හැබැයි පින්තූරේ රත්තරන් මාලයක් තියෙනවා. හැබැයි ඇත්තටම රත්තරන් මාලයක් කියලා දෙයක් පින්තූරේ තියෙනවද නෑ. ඇත්තටම රත්තරන් මාලයක් කියලා දෙයක් පින්තූරේ නෑ. **මේක තමයි සත්‍ය වශයෙන්ම අනිමිත්තයි කියන්නේ.** නිමිති අනිමිත්ත බවට පත් වෙනවා කියන එක ඉතාම ගැඹුරුයි. මේ විඤ්ඤාණය අනිදස්සන වෙනවා කියන එක. **අනිදස්සන වෙනවා කියන්නේ විඥානය දැනගැනීම නැති වෙනවා කියන එක නෙමෙයි. විඤ්ඤාණය දැනගැනීම ඒ විදියමයි. පොත කියලා දන්නවා, පුටුව කියලත් දන්නවා, පින්තූරේ වගේ. හැබැයි එතන දෙයක් නෑ. ඔන්න ඕකයි අනිදස්සන කිව්වේ.** මේ අනිදස්සන විඤ්ඤාණය ගොඩක් අයට තේරෙන්නේ නෑ. මේ අවිධිමත් ස්වභාවය අනිමිත්තයි කිව්වේ කුමක්ද කියන එක. අනිමිත්තයි,ශූන්‍යතයි, අප්‍රණිතයි කියන එකයි වැටහෙන් නැති අත්දැකීමක් නැතුව කියන්න බෑ. අත් දකින්න ඕන මේක හිතලා කියන්නත් බෑ. මේක අත් දකින්නම ඕන. හිතලා කොච්චර ඔබ කියන්න ගියත් අපි ඔබෙන් අහන එක ප්‍රශ්නයයි. සමහරවිට ඔබට උත්තර දීගන්න බැරිවෙන්න පුළුවන්. ඔබ අසරණ වේවි. අත්දකීම සිතල කියන දේට හාත්පසින්ම වෙනස්. ඉතිං මෙන්න මේ අත්දැකීම තමයි ඔබ ලැබිය යුතු අත්දැකීම වන්නේ. ඒක

**අවධිය.** ඒකයි හීනෙන් නැගිටිනවා කියන්නේ. සැබෑම ලෝකයේ හීනේ කියන්නේ මේ පොත, මේසේ ඇඳ කියලා අපි ඉන්න එක. හීනයක්. එහෙම දෙයක් හමුවන්නේ නෑ. නමුත් ඔබට ඒක වැටහෙන්නේ නෑ. නමුත්, අන්න ඒ සත්‍ය දකිනවා කියන එක ගැඹුරු කාරණාවක්. අනිමිත්තයි කියපු එක. දැන් පොත නැතිවෙලා නෙමෙයි. හැබැයි පොත නැද්ද? නෑ පොතක් තියෙනවා. හැබැයි පොතක් කියලා දෙයක් තියෙනවාද? නෑ පොතක් කියලා දෙයක් නෑ. ඇයි පොතක් නැද්ද? ඇයි පොතක් තියෙනවා. මොකද්ද මේ කියන කතාව. පොතක් තියෙනවා කියනවා. ඊට පස්සේ එහෙම පොතක් කියලා දෙයක් නෑ කියනවා. ඔන්න ඕක තමයි ගොඩක් අයට තේරෙන්නේ නැත්තේ. ඒකයි මාලුක්‍යපුත්ත සූත්‍රය ඉතාම ගැඹුරුයි කිව්වේ. ඒක හොයාගන්න බෑ එතන තියෙන්නේ අවධිය.

**ඒ ආශ්‍රව කෙලෙස් ක්ෂය වන තැනයි. අවදිමත් ස්වභාවය මතු වෙන්නේ.** එතකම්ම ඒ අරහත් සමාධියට පත් වන්නේ නෑ කවුරුත්. හැබැයි එතන තියෙනවා දැක්ම නිවන පෙනි පෙනි නැති වෙනවා කිව්වේ අන්න ඒකයි. **අසමාහිත සමාධියයි, සමාහිත සමාධියයි** කිව්වේ, හිත විසිරෙන කෙනෙකුට මේක හමු වෙන්නෙත් නෑ. හිතේ රාග, ද්වේශ, මෝහ කෙලෙස් අයට හමු වෙන්නෙත් නෑ. ලෝකෙට බැස ගත්ත කෙනෙකුට ඒක ප්‍රකට වෙන්නෙත් නෑ. ඒ දැනුනත්, ඒ ප්‍රකට වුණත්, එය හමු වුණත් එය ඉතාම අල්පේච්ඡයි. ඒ කියන්නේ ඉතාම දුර්වල ස්වභාවයකින් තමයි මතු වෙන්නේ. හැබැයි එක ප්‍රකට වෙන්න ඕන කලාමැදිරි එළියක් වගේ ඔබට ඒ අත්දැකීම ලැබෙන්න පුළුවන්. ඊට ටික ටික ටික ටික **විවරිතෝ, විජයීතෝ** කියන විදියට **විවර වෙන්න පුළුවන්.**

මේ තමයි නිවන් අත්දැකීම. ඒ රාග, ද්වේශ, මෝහ කෙලෙස් ක්ෂය වෙන්නේ මේ දර්ශන ඤාණය, සත්‍ය ඤාණය තුළ මෙය හඳුනා ගත්තොත් පමණයි. මේ අකාලික දහම හමුවන්නේ අන්න එතනයි. **තුන් කාලයෙන් මිදුණු දහමක් හමුවන්නේ අන්න එතනයි. අතීතය ගැන හිතුවත් මේ මොහොතේ සිතක්මයි. අනාගතය ගැන හිතුවත් මේ මොහොතේ සිතක් විතරයි. මේ මොහොතේ මේ සිත ඒ සිතත් එතන ඇත්තක් නෙමෙයි. අන්න තුන් කාලෙම මිදෙනවා. අකාලික දහමක් හමු වෙනවා. මහා නුවණින් මේකද දකින්න ඕන තැනක්.** බොහොම පරිස්සමින් අධ්‍යනය කරන්න. බොහොම පරිස්සමෙන් විමර්ශන බුද්ධියෙන් ගන්න මේ **අනිදස්සන විඤ්ඤාණය** කියන එක. අර දෙයක් කියල දෙයක් හමු නොවුණ තැන, අර චිත්‍රයේ තියෙනවා පුටුවක් හැබැයි ඇත්තටම චිත්‍රයේ පුටුවක් කියලා දෙයක් නෑ. ඇත්ත **ලෝකය දැන් මේක ප්‍රායෝගිකව ඔබ දකිනකොටත් වෙන විදිහට පේනවා, වෙන විදිහට ඇහෙනවා, වෙන විදිහට විදිහට දැනෙනවා වුනාට ඇත්තටම එහෙම දෙයක් කියලා දෙයක් දැනෙන් නැති ස්වභාවයකට ඔබ පත් වෙනවා. ඒ පත්වෙන්නේ ඒ සත්‍ය ඤාණය, ඒ දර්ශන ඤාණය, අවබෝධයක් ඒ ඤාණය තුළයි මහා ප්‍රඥාව තුළයි. ඒක මහා නුවණටයි හසුවන්නේ.** ඉතින් ඒක මහ නුවණින් දකින්න ඕනි කාරණාවක්. ඉතින් දැන් මෙතනදි නිමිති නොගන්නා සුළු වූයෙමි. යම් හේතුවකින් චක්ෂු ඉන්ද්‍රිය අසංවෘත කොට වසන තෙල මා කරා ලාමක අකුසල ධර්ම වන අවිද්‍යා දෝමනස්සය ලුහු බැඳි නම් ඒ චක්ෂු ඉන්ද්‍රිය සංවරයට චක්ෂු ඉන්ද්‍රිය ඒ රැක් කෙම් නම් අවිද්‍යා දෝමනස්සයට ලුහු නොබඳිනම් ඒ චක්ෂු ඉන්ද්‍රියෙහි සංවරයට පැමිණේ නම් ඒ විදිහටම සෝත ඉන්ද්‍රිය, ඝාණ ඉන්ද්‍රිය, ජිව්හා ඉන්ද්‍රිය ඒ විදියට ආයතන හයම පෙන්නනවා.

ආයතන හයටම එන අරමුණුවල ඒ සත්‍ය දැකලා මිදෙන තැන රාග, ද්වේශ, මෝහ ස්වභාවය ඒ දෙයක් හමු නොවන තැන රාග, ද්වේශ, මෝහ ඇලෙන ගැටෙන ස්වභාවයෙන් මිදෙන තැන, ඒ අකම්පිත ස්වභාවය තුළත් අවිද්‍යා දෝමනස්සයෙන් ලාමක අකුසල් ගෙන් ලුහුබඳින්නා හූ නම් ඒ විදිහටම කියනවා මනේන්ද්‍රියත් සංවරයට පැමිණීමෙන් ආර්ය ඉන්ද්‍රිය සංවරයෙන් සමන්නාගත වූයෙම් නම් අන්න අධ්‍යාත්මයේත් කෙළෙසුන් විසින් අනාරක්ෂිතයි කියලා කියනවා මේ ඉන්ද්‍රිය සංවරය ඇති නොවුණොත්.

**ඉන්ද්‍රිය සංවරය ඇති වෙනවා කියන්නේ දැන් මේ ආයතන ඇස, කන, දිව, නාසය, කය, මන කියන මේ ආයතනයට එන අරමුණු ප්‍රකට වෙන්නේ නෑ, බැසගන්නේ නැහැ. සත්‍ය කරගන්නේ නෑ. එතන නිමිති බැස ගන්නේ නෑ. සබ්බේ ධම්මා නාලං අභිනිවෙසා** කියන තැන අන්න නිමිති නොගන්නා සුළුයි කිව්වේ එතකොට. මේ විඤ්ඤාණය අනිදස්සන වන තැන සිතට එන අරමුණේ සත්‍ය දැකලා මිදෙන මග එතන. අපිට ඇසින් දෙයක් බලලා ඒක වර්ණ සිතක්, අපි ගත්ත ශබ්ද සිතක්, ගන්ධ සිතක්, ඒ රස සිතක්, ඒ උණුසුම, සීතල, තද ගතිය දැනෙන ඒ සිත් ඒ සිතුවිල්ලකින් එන මනෝ ද්වාරයෙන් එන ඒ ආරම්මණයක් ඒ ආරම්මණ වල දෙයක් ප්‍රකට වෙන්නේ නැත්නම් අන්න එතනයි අනිමිත්තයි කියන්නේ. එතකොට ඒ ආරම්මණ වල දෙයක් කියලා බැස ගත්තොත් එතැනමයි **සබ්බේ සංඛාරා** ඒ කියන්නේ **කාය සංඛාර, වචී සංඛාර, මනෝ සංඛාර එතනම ආත්ම ස්වභාවයක් බැසගන්නවා.** ආත්ම ස්වභාවයක් බැස ගන්න තැන රහතන් වහන්සේ නමක් නෑ. එතන රහත්භාවයේ යනගමනක් නෑ. එහෙනම් එය පිරිහීමයි. කෙලෙසුන් විසින් අන්න අනාරක්ෂිත වුනයි කියලා කියන්නේ අන්න එතනයි. ඒ ලෝකෙට

බැසගන්න ස්වභාවය. එතකොට මෙන්න මෙතනයි ප්‍රශ්න කරන්න කියන්නේ. නිමිත්ත, අනිමිත්ත ස්වභාවය එතකොට ඊගාවට දැන් එතකොට කියනවා.

**"අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී අහොසිං, ආලොකිතෙ විලොකිතෙ"**

ඒ විදිහට සතර ඉරියව්වේම ඒ විදියට කියනවා

**"සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී අහොසිං, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී අහොසිං, සමිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී අහොසිං, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී අහොසිං, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී අහොසිං, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී අහොසිං, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී අහොසිං."**

**"සො ඉමිනා ච අරියෙන"**

දැන් අපි නැවතත් එමු පරිවර්තන පැත්තට මේ කියන්නේ

**අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හෝති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හෝති, නිසින්නෝවා රිසින්නෝවා සම්පජාන කාරියෝ හෝති**

මේ කියන්නේ සතර ඉරියව්වේම මෙන්න මේ සත්‍ය දකින්න කියන එකයි. මේ සත්‍ය දකිනවා රහතන් වහන්සේගේ ස්වභාවය කියන එකයි. ඒ දකින් නැතිනම් එතන පිරිහීමක් තියෙනවා. අරමුණුවලට බැස ගැනීම තුළ ආත්ම ස්වභාවයක් දෙයක් කියලා ගත්ත තැන ආත්ම ස්වභාවය ඉස්මතු වෙනවා. එතන කෙලෙසීමක් තියෙනවා. එතන අරහත්වයට

පත්වීමක් නෑ. එතකොට එතන අරහතන් වහන්සේ අඳුනාග න්න කියනවා. මේ සතර ඉරියව්වේම අරහතන් වහන්සේ ගේ ස්වභාවය මේ ස්වභාවයෙන් පවතින බව මෙතනැනදී පැහැදිලි කරනවා.

මේ ආර්ය සීල ස්කන්ධයෙන් සමන්නාගත වූයෙමි මේ ආර්ය ඉන්ද්‍රිය සංවරයෙන් සමන්නාගත වූයෙමි. මේ ආර්ය ස්මෘති සම්පජන්නයෙන් සමන්නාගත වූයෙමි. පංච උපාදානස්කන්ධයෙහි අභිද්‍යා දුරුකොට ඊට පස්සේ කියනවා පංච නීවරණ ධර්මයෝ ගැන පැහැදිලි කරනවා. මේත් රහතන් වහන්සේගේ ස්වභාවයමයි. කලින් අපි පැහැදිලි කරේ සිතට එන අරමුණේ සත්‍ය දැකලා මිදෙන තැන.ඒ නිමිති ප්‍රකට නොවන තැන අනිමිත්ත ස්වභාවය රහතන් වහන්සේගේ කෙසේ විය යුතුද කියලා. ඒ කෙලෙස් ස්වභාවයෙන් මිදෙන්නේ මෙන්න මේ ආකාරයට දකිනවා නම් සතර ඉරියව්වේම කියන එක එතනදී මනාකොට පැහැදිලි වෙනවා.

**ඊගාව කාරණාවට එනවා. පංච නීවරණ ධර්ම.** පංච නීවරණ ධර්ම ප්‍රකට වෙනවා කියනවා රහතන් වහන්සේට පංච නීවරණ ධර්ම දුරු කරලයි තියෙන්නේ කියන එක. එතකොට අපි දන්නවා **කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, උද්දච්ච කුක්කුච්ච, විචිකිච්ඡා** කියන පංච නීවරණ ධර්ම දුරු කරලා තියෙන ස්වභාවය එතනදී පැහැදිලි කරනවා. අධ්‍යාත්මයෙන් මනාකොට සන්සුන්ය. විචිකිච්ඡා දුරුකොට තරණය කළ විචිකිච්ඡා කුසල ධර්මයෙන් **"කතං කතීභාවා"** විචිකිච්ඡා සිත පිරිසිදු කළෙමි. ඊට පස්සේ කියනවා මම චිත්තයාගේ උපක්ලේශ වු ප්‍රඥාවගේ දුර්වල කරන වූ මේ පංච නීවරණයන්ගෙන් දුරු කොට කාමයෙන් වෙන්ව, අකුසල දහමින් වෙන්ව, ඒ සවිතක්ක සවිචාර වූ විවේකයෙන්,

ප්‍රීතියෙන් විවේකයෙන් උපන් ඒ ප්‍රීති, සුඛ ඇති ඊට පස්සේ කියනවා සවිතක්ක සවිචාර කියන වචනෙ මෙතනදී මනා කොට දකින්න ලැබෙනවා.

**"සො ඉමෙ පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහාසිං"**

එතකොට **සවිතක්කං, සවිචාරං, ප්‍රීති සුඛං ප්‍රථමං ධ්‍යාන**

එතකොට මේ සවිතක්ක සවිචාර සමාධි හමුවන්නේ ලෝකෝත්තර භූමියේදී, ඔබ ඒක හොඳට දන්නවා. විතක්ක විචාර සංසිඳෙන එක තමයි එතකොට අපි දන්නවා ලෞකික භූමියෙහි සමාධිය, අපි ඔබට මීට පෙරත් පවසලා තියෙනවා. මේ ප්‍රථම ධ්‍යාන, ද්විතීක ධ්‍යාන, තෘතීක ධ්‍යාන, චාතුර් ධ්‍යාන, අපි කතා කරන්නේ ගොඩක් වෙලාවට ආනාපානසති භාවනාව තුළ, මේවා කතා කරන්නේ. ගොඩක් අපි සූත්‍ර වල පුරුදු වෙලා තියෙන්නේ සමාජය තුළ ප්‍රකටව තියෙන්නේ ප්‍රථම ධ්‍යාන, ද්විතීක ධ්‍යාන, තෘතීක ධ්‍යාන, චාතුර් ධ්‍යාන ලෞකික ධ්‍යාන අර වේදය තුළත් අපට හමු වෙනවා. අපි දන්නවා පස්වග තවුසොත් මේවා රැක්ක. අපි දන්නවා රූපාවචර සමාධි වල හිටියා. රූපාවචර බ්‍රහ්ම ලෝකවල හිටියා කියන්නේ ඒකනේ. එතකොට රූපාවචර සමාධි වල ඉන්න එක තමයි රූපාවචර බ්‍රහ්ම ලෝකව වල ඉන්නවා කියන්නේ. මේ අමුතුවෙන් කොහේවත් තියෙන ලෝකයක් නෙවෙයි . මේ බ්‍රහ්මලෝක කොහේවත් හොයන්න යන්න එපා. මේ සිතේම තියෙන සුඛුම ස්වභාව. ඔබ දන්නවා අරූපාවචර බ්‍රහ්ම ලෝකවල නම් ටික ඔබ දන්නවා. ආකාසඤ්ඤායතන,

විඥ්ඥනන් ආයතන,ආකිඤ්ඤායයතන, න සඤ්ඤා නාසඤ්ඤායතන නායන් ලෝකෝ, න පරලෝකෝ, නො බෝ චන්දිම සුරියෝ. අපි මේ කතා කරනවා නේ. ඒ කියන්නේ ආකාසඤ්ඤායතන, විඤ්ඤාණයතනය, ආකිඤ්ඤායයතන න සඤ්ඤා නාසඤ්ඤායතනය කියන්නේ අරූපාවචර බ්‍රහ්ම ලෝක කියලා කියනවා. හැබැයි ඒවා අරූපාවචර ධ්‍යාන වල නම්. එතකොට අපිට තේරෙනවා මේ ධ්‍යාන නොපෙනුන ධ්‍යානවල කටයුතු කරයි නම් ඒ අන්න එතනයි අරූපාවචර බ්‍රහ්ම ලෝක කියලා පෙන්නුවේ.

වෙනම නැතුව එළියෙන් තියෙන බ්‍රහ්ම ලෝකයක් ගැන නෙමෙයි. ඒ අරූපාවචර බ්‍රහ්ම ලෝක හැබැයි රූපාවචර බ්‍රහ්ම ලෝකත් ඒ වගේම තමයි. දැන් ප්‍රථම ධ්‍යානයෙන් යම්කිසි කෙනෙක් අපි හිතමු නොපිරුණු ධ්‍යානයෙන් යමෙක් හුස්ම ගියොත් එහෙම ධ්‍යානයේම පිරිහිලා නෑ. ධ්‍යාන අවස්ථාවේම හුස්ම යනවා. එතකොට අපි කිව්වා හීනයක් දැක දැක ඉන්න කොට හීනේම හුස්ම ගියොත් එහෙම හුස්ම හිර වෙලා ඉන්නවා වගේ ධ්‍යාන අවස්ථාව කියන්නේ. සුකුම ස්වභාවය. ඒක විතක්ක, විචාර, ප්‍රිති, සුඛ, ඒකාග්‍රතා කියන්නේ ප්‍රථම ධ්‍යාන. එතකොට මේ ප්‍රථම ධ්‍යාන අවස්ථා වේම එතකොට සුකුම ස්වභාවයකම හුස්ම යනවා. හුස්ම ගියොත් එහෙම අන්න ධ්‍යාන ස්වභාවයෙන් හිරවෙලා ඉන්නේ. මේ කොහෙවත් කියන ලෝකයක් නෙමෙයි. අර ධ්‍යාන ස්වභාවයේ හිර වෙලා ඉන්න එක. මේ කොහෙවත් තියෙන ලෝකයක් නෙවෙයි.

බ්‍රහ්ම පාරිසජ්ජය, බ්‍රහ්ම පුරෝහිතය, මහා බ්‍රහ්මය කියලා කිව්වේ බ්‍රහ්මයෝ ටික තමයි දාගෙන හිටියේ නම් ටික. මේක එතකොට සිතේම ස්වභාවයක්. එළියේ තියෙන එකක්

නෙමෙයි. ඒකයි කිව්වේ තිස් එක් ලෝක ධාතුව සිත තුළින් දැකගන්න කියලා. ඒක ඔබ දැක්කා සංඛාර උප්පත්ති සූත්‍රය තුළ පෙන්නුවා තිස් එක් ලෝක ධාතුවම සිත තුළින් දකින හැටි. නව සත්තාවාස වලත් අපි ඒක පෙන්නුවා. **සංඥාවේ ස්වභාවය. ඒකත්ත සංඥා, ඒකත්ත කායා, ඒකත්ත සංඥා, නානත්ත කායා මේ විදියට අපිට සංඥාවේ ස්වභාවය අනුවමයි තිස් එක් ලෝකධාතුව සිත තුළින් තමයි දැක්කේ.** ඒ ස්වභාවය අනුවයි මේ සකස් වීම් ගැන කතා කළේ. එතකොට අපි බ්‍රහ්ම පාරිසජ්ජය, බ්‍රහ්ම පුරෝහිතය, මහා බ්‍රහ්මය කියන ප්‍රථම ධ්‍යාන අවස්ථාව කියන්නේ විතක්ක, විචාර, ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා කියන මෙන්න මෙය අවස්ථාව. එතකොට මෙතන බ්‍රහ්ම පාරිසජ්ජය කියන්නේ එළියෙ කොහේ හරි තියෙන ලෝකයක් ද? නෑ බ්‍රහ්ම පුරෝහිත කියන්නේ එළිය තියන එකක්ද? මහා බ්‍රහ්මය කියන්නේ එළියෙ තියන එකක්ද? නෑ සිත තුළ සකස් වෙන සංඥා ස්වභාවයක්. ඒක තියෙන තැනක් නෑ. මේ ඇඟ කොහේ හරි ඇතුළතද සිත තියෙන්නේ. අපි ඒකයි කිව්වේ මේ සිත ඇඟ ඇතුලේ පනවන්න බෑ කියලා. ඇඟ ඇතුලේ තියෙන එකක් නෙමෙයි කියල. ඒකයි අපි ඔබට සිරස දානවා වගේ, දෙරණ දානවා වගේ, හිරු දානවා වගේ මෙන්න මේ සිස්ටම් එකක් පෙන්නුවේ. ඒ ස්වභාවය මේක දැකගන්න අපි ඔබට උපමා අරන් පෙන්නුවේ. **මේ සිත කොහේවත් තියෙන එකක් නෙමෙයි කියන එක. සකස් වෙනවා පමණයි. තියන තැනක් පනවන්න එපා කියලා කිව්වේ.** තවත් ඉස්සරහට දීර්ඝව පැහැදිලි කරනවා. නැත්නම් ඔබ අභිඤ්ඤා දේශනා අහන්න. ඔබට එක පැහැදිලි වෙයි. දැන් මෙතනදි අපි ධර්මයට අනුව මේක මෙන්න මේ කොටස මෙතන තියෙනවා රහතන් වහන්සේගේ ස්වභාවය පැහැදිලි කරන කොට බුදුන් වහන්සේ මෙන්න මෙසේ විය යුතුයි

කියලා කියනකොට මෙතන **"සවිතක්කං සවිචාරං" සිතට එන අරමුණේ සත්‍ය දැකලා මිදෙන තැන අර ලෞකික සමාධිය නෙමෙයි ලෝකෝත්තර සමාධිය උපදිනවා.** අර බුදුන් වහන්සේ බොජ්ඣංග සූත්‍ර වල අපට හමු වෙනවා **බොජ්ඣංග ධ්‍යන්වදාමි** කියනවා. ස්වාමිනි අන්තුඩු පිරි වැඩියොත් බොජ්ඣංග වඩනවා ස්වාමීනි. එසේය මහණ මහණෙනි, පිරි වැඩියෝත් වඩනවා බොජ්ඣංග මේ

**ඉධ භික්ඛවේ භික්ඛු**

මේ සාසනයේ බොජ්ඣංග නෙමෙයි මහණෙනි කියලා බුදුන් වහන්සේ දේශනා කළේ ඇයි? එහෙනම් සප්ත බොජ්ඣංග සමථය වඩනකොටත් තියෙනවා. සප්ත බොජ්ඣංග සිතට එන අරමුණේ සත්‍ය දැකලා මිදෙන තැන. ඒ ස්කන්ධයේ උදය වැය දකින තැන. සීලය රකින තැන ආර්යකාන්ත සීලය තුළත් හමු වෙනවා. ආකාර දෙකයි. ලෝකෝත්තර භූමියයි, ලෞකික භූමියයි. ඒකත් මේ මොහොතේමයි. මේ ලෝකෝත්තර භූමිය වෙනින් කොහෙවත් මේ ලෞකික භූමිය වෙනින් කොහෙවත් නෙවෙයි. මේ මොහොතේ එන අරමුණේ මේ සිතේ දෙකම තියෙනවා. මෙලොව කියන්නේ මොකක්ද?, දැන් **එන සිත බාහිර පොත තියෙනවා, තියනවානම් මෙලොව. පොත, මේසය, ඇඳ තියෙනවනම් මෙලොව. දැන් එහෙම දෙයක් නැති බවට අවබෝධයක් තියෙනවා. ආයතන වල ඇත්ත වීම මෙලොව ආයතනවල මිදීම එලව.** මෙලොවින් අන්න එතෙර වෙනවා කියන්නේ ඕකටයි. අන්න **එලොවත් මිදිලා, මෙලොවත් මිදිලා, සමව වාසය කරනවා කියන්නේ මේ මොහොතේම එන අරමුණේ නොගැටී, නොඇලී වාසය කිරීමයි. ඒයයි රහතන් වහන්සේගේ වාසය කිරීම. ඒ තුළ තියෙනවා**

**සවිතක්ක, සවිචාර සමාධිය.ඒ තුළ තියෙනවා ප්‍රථම ධ්‍යාන, ද්විතීක ධ්‍යාන තෘතීක ධ්‍යාන, චාතුර් ධ්‍යාන කියන අවස්ථා ටික ලෝකෝත්තර සමාධිය තුළ හමු වෙනවා. ඒ කියන්නේ විතක්ක, විචාර සංසිඳෙනවා. සිතට එන අරමුණ බාහිර පතිත වෙන්නේ නෑ. සිතෙත් පතිත වෙන්නේ නෑ. එහෙනම් සිත පනවන තැනක් නැහැ.** පොත කියලා දෙයක් බාහිරෙන් හමුවෙන්නේ නෑ. සිතක හමු වෙන්නෙත් නෑ. **නාම රූප උපරූජ්ජනය වෙනවා.** අන්න **අනිදස්සනං** වෙනවා. අන්න සිත මේ මොහොතේ **අප්පටිත්තිත** වෙනවා. පතිත වෙන්න තැනක් නැති වෙනවා. **අන්න මේ අරමුණේ ම මිදෙනවා. අන්න එතනයි ශූන්‍යතයි, අනිමිත්තයි, අප්‍රනිතයි කිව්වේ.** එතකොට අපිට මේ මොහොතේම දකින්න ලැබෙනවා මේ කියන කාරණාවට ඔබ බලන්න විතක්ක, විචාර සංසිදෙනවා. ප්‍රායෝගිකව ඔබ අත්දකිනවා. ඔබ මේ ධර්මය දකින කොට මේ සිත බාහිරට යන්නේ නෑ. බාහිර දෙයක් නැති බව ඔබට අවබෝධයට හසුවෙනවා. වෙනදා විදිහට පේනවා, වෙනද විදිහටම දැනෙනවා. හැබැයි ඔබ ගිනි ගන්නේ නෑ. ඔබ ඒවට පත්තු වෙන්නේ නෑ. පිච්චෙන්නේ නෑ. දැනෙන්නේ නෑ. තණ්හාව එතන මතුවෙන්නේ නෑ.

එතකොට මේ ස්වභාවය ඔබ හඳුනා ගන්න. මේ දියුණු ස්වභාවය ඔබ හඳුනා ගන්න. ඒ දියුණු ස්වභාවය තමයි, ඒ ඔබගේ දුකින් මිදෙනු ස්වභාවය. දැන් බොහෝ අයට මේ බුද්ධෝත්පාද නාලිකා ඔස්සේ මේ අත්දැකීම් ලබනවා. දැන් බොහෝ අය මේ අත්දැකීම අඳුනාගන්න ඔහුන්ට එකවරම හැකියාවක් ලැබෙන්නේ නෑ පර්යාය අනුව. පර්යායෙයි, මේකෙයි තියෙන විදිහට බැලුවොත් ඉතාම දියුණුයි. හැබැයි දැන් ප්‍රායෝගිකව දැන් මේ ඉන්න අම්මල එච්චර ඉගෙන

ගන්නේ නැති වෙන්න පුළුවන්. නමුත් මේ අත්දැකීම් ලබනවා. ඔහුන්ට දැන් එන අරමුණ එච්චර ලොකු ගින්නක් නෑ. මේ දරුවා කියලා මැරීගෙන අනේ පුතේ කියලා අඬාගෙන නෑ. ලොකු නිකම් බන්ධන බලයකින් ගැට ගැහිලා නැති වෙන්නේ නෑ, කරගන්න බැරි කම්පාවක වේදනාවක, සිය දිවි නසාගන්න තැනට මේ අපේ තරුණ දරුවෙක්වත් ඇති වෙන්නෑ. ඇයි ඒ ධර්මය අහන දරුවෝ ඇති වෙන්නේ නෑ. ඇයි ඒ. ඒ දරුවෝ මේ සත්‍ය දකිනවා. **මේ තමන්ගේම සිත නේද සියල්ලම කියලා. අන්න එතනයි විතක්ක, විචාර සංසිඳිලා අන්න ලෝකෝත්තර ධ්‍යාන මතුවෙනවා. දැක්කද ඒ රහස. එතන ගැඹුරු රහසක් සමාජයට ඒක තාම රහසක් වගේ නමුත් ප්‍රායෝගිකව ඔබ අත්දකිනවා. විතක්ක, විචාර සංසිඳෙනවා. ඔබට ප්‍රීතියක් දැනෙනවා. ඔබට සුඛ අවස්ථාව දැනෙනවා.** ඔබ පර්යංකයේ හිටියද නෑ. ඔබ භාවනා කළා ද. නෑ. නමුත් ඔබ සසර දුකිනුත් මිදිලා. සියලු දුකින් මිදෙන මඟ හඳුනාගෙන සුගති පරායන වෙලා. ඔබ දුගතියට වැටෙන්නේ නෑ. ඔබ කළේ එකයි. බුදුන් වහන්සේ දේශනා කරපු අර සත්‍ය ධර්මය අවබෝධ කරපු එකයි. අන්න බුදුන් වහන්සේ ධර්මය දේශනා කරන කොටම අන්න මගඵල ලබනවා. අන්න කොණ්ඩඤ්ඤට වැටහුණා. අඤ්ඤා කොණ්ඩඤ්ඤ කියලා කියනවා. ඇයි භාවනා කරල ද වැටහුනේ? නෑ. කොණ්ඩඤ්ඤ තාපසතුමා භාවනා කරලා නැද්ද, භාවනා කරලා තියනවා. මග ඵල ලැබුවද? ඒත් නෑ. දැන් කොහොමද කොණ්ඩඤ්ඤ තාපසතුමා මගඵල ලැබුවේ. සද්ධර්මය ශ්‍රවණය කරනකොට මේ මොකක්ද කිව්වේ කියලා වැටහුණා. ඒ අවබෝධය තුළයි මගඵල ලබන්නේ. සද්ධර්ම ශ්‍රවණය තුලයි එය සිදුවන්නේ. එ නිසයි අපි ඔබට කිව්වේ ඔබ ධම්ම සංගිකරණය අධ්‍යයනය කරන්න. පිටු ගණනාවක් දකින්න ලැබෙයි. ඔබ සබ්බාසව

සූත්‍රය අධ්‍යයනය කරන්න. ඔබට මනා කොට දකින්න ලැබෙයි **දස්සනා පහාතබ්බා** කියන්නේ කුමක්ද කියල. ඒ දර්ශන **අවබෝධයයි.** ඒ තුළින් ආනන්දය හිමාලය පර්වතය වගේ කෙලෙස් සංසිඳෙනවා. ආනන්දය අතේ තියෙන ගල් කැටේ වගේ බොහොම ටිකයි ආනන්ද ඉතුරු වෙන්නේ. අන්න නියත සම්බෝධි පරායණය කීවේ ඒකයි. **නියත සම්බෝධි පරායණය මේ ධර්ම ශ්‍රවණය තුළම ඇසෙන මොහොතේම අවබෝධක් ඥාණය තුළම එය අවබෝධයට පත් වන විටම රාග, ද්වේශ, මෝහ කෙලෙස් සංසිඳීමට ලක්වෙනවා.** ඒක ඔබට ප්‍රායෝගිකව අත් දකින්න ලැබෙන්නේ ඔබ ඊට පස්සේ එදිනෙදා කටයුතු කරන කොට ඔබට දැනෙන්න ගන්නවා. ඔබගේ කෙලෙස් සංසිඳිලා කියලා. ආශ්චර්යයි ස්වාමීනි, අත්භූතයි ස්වාමීනි, මට වැටහුණා ස්වාමීනි කියලා මේ අත්දැකීම ලැබෙන හැමෝම ප්‍රකාශ කර ගන්නවා. මෙයයි සත්‍ය ධර්මය. මේ රහතන් වහන්සේට මෙන්න මේ දේ අවබෝධයක් නැත්නම් මේ වැටහීමක් නැත්නම්, මේ රහතන් වහන්සේ නමක් නෙමෙයි කියලා. ඔන්න බුදුන් වහන්සේ මනා කොට පැහැදිලි කරනවා. ඒ ජබ්බි සෝධන සූත්‍රය තුළ. දැන් ආකාර ගණනාවක් අපි ඔබට පැහැදිලි කළා. දේශනා තුන්වෙනි දේශනයටත් ආවා. තාමත් ඉවරයක් නෑ. ඇයි? ඒ බුදුන් වහන්සේ මනාකොට මේක පිරිසුදු කරනවා රහතන් වහන්සේගේ චිත්ත ස්වභාවය මෙය නොවේ නම් බාර ගන්න එපා. ඔහු රහතෙක් නෙමෙයි කියනවා. හොර රහතෙක් කියලයි කියන්නේ. බෞද්ධයාට මේ ධර්මය හොඳින් විවර වෙන්න ඕනි. බෞද්ධයාට වෙන් මගක් නෑ.

**නත්ථි මේ සරණං අඤ්ඤං, ධම්මෝ මේ සරණං වරං**
**සෝ ධම්මං පස්සති, සෝ මං පස් පස්සති**

කිච්චේ ඒකයි. ධර්මය දැක්කොත් විතරයි ඔබට බුදුන් සරණවත් නෑ නැත්නම්. ඒ බුද්ධ කියන්නේ පුද්ගලයෙක් නෙමෙයි. සෑම සිතකම බුද්ධ ස්වභාවය තියෙනවා. මේකට ආගමක් නෑ. මේක ධර්මතාවයක්. බුදුන් වහන්සේ ධර්මය දේශනා කරලා නෑ කවදාවත් බෞද්ධයෙකුට. බුදුන් වහන්සේ ධර්මය දේශනා කළේ ජටිලයෝ, නිගන්ටයෝ, බ්‍රාහ්මණයන්ට. බෞද්ධයා කියන්නෙ ධර්මය අවබෝධ කරපු අය. සත්‍ය ධර්මයට අවදි වන්න. ධර්මය නම් ධර්මයයි. ධර්මය තුළ දෙයක් නෑ. ලෝක ධර්මතාවය නම් එය පමණයි. එය සත්‍ය දෙකක් නෑ. සත්‍යය නම් සත්‍යය පමණයි. අවදි වේ නම් සියලු මිථ්‍යාදෘෂ්ටි සුනු විසුනු වෙලා යනවා. ඒ සත්‍යය අවදි වීමයි විය යුත්තේ. හොඳයි මෙන්න මේ පැහැදිලි කිරීම මේ ද්වයං වදාමි. ඒ කියන්නේ මේ ප්‍රථම ධ්‍යාන, ද්විතීක ධ්‍යාන තෘතීක ධ්‍යාන, චාතුර් ධ්‍යාන සිතට එන අරමුණේ සත්‍ය දකින තැන මතු වෙනවා කියල අපි ඔබට පෙන්නලා දෙනවා. ඒක විතක්ක, විචාර සංසිඳෙනවා. ඔබට ප්‍රායෝගිකව අත් දකින්න ලැබෙනවා.ඒ ප්‍රීති අවස්ථාව ඔබ අත්දකිනවා. සුඛ අවස්ථාව ඔබ අත්දකිනවා. ඒ වගේමයි ඒකාග්‍රතාවය ඔබ අත්දකිනවා. ඒ අවස්ථාව ඔබ ලෝකෝත්තර දකින්න හමු වෙනවා. මේ සවිතක්ක සවිචාර සමාධියයි. ඒ සවිතක්ක සවිචාර සමාධිය තුළත් අර විතක්ක විචාර සංසිඳිලා අර ප්‍රීති ස්වභාවය මතු වෙනවා. ඒක තමයි ඔබට මේ කොටසේදී හමුවෙන්නේ. දකින්න ලැබෙන්නේ. එතකොට මෙතනදි ඒ පැහැදිලි කරපු පැහැදිලි කිරීම ඒ ධ්‍යාන අවස්ථා ටික මතුවෙනවා. ඊටපස්සේ වැදගත්ම තැනට එනවා. මේ පැහැදිලි කිරීමේ ඒක තමයි මම මෙසේ හෙයින් සමාධිගත සිත පිරිසිදු වූ කල්හි උපක්ලේෂ විගත මුදුවත් කර්මාන්‍යවත් ස්ථිතිය ඒ කියන්නේ නොසැලෙන බවට පත්ව ආසවක්ඛය ඤාණය සඳහා සිත නතු කළෙමි. ඒ

**කියන්නේ අන්න ආසවක්ඛය ඤාණය මෙතැනදී තමන්ගේම ආශ්‍රව කෙලෙස් ක්ෂය වීගෙන යන බව තමන්ටම දැනෙන්න ගන්නවා. මේ සිතට එන අරමුණේ සත්‍ය දකින තැන මම මේ දුක යථාභූතයෙන් දකිමි. දුක්ඛ සත්‍යය යථාභූතයෙන් දකිමි. ඒ දුක්ඛ සමුදය අන්න දුක්ඛ නිරෝධය, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාය යථාභූත වශයෙන් දකිමි. ඒ ආශ්‍රව කෙලෙස් යථාභූත වශයෙන් ක්ෂය කරමි. අන්න ආසවක්ඛය ඤාණය තමන්ටම ස්වයංභූව මේ ආශ්‍රව කෙලෙස් ක්ෂය වී යනවා දකින්න ලැබෙනවා.**

අපි මේක ඔබට පැහැදිලි කරා ඔබ විසින්ම අපි ඔබව නැවත ඒ ඔබගේම ප්‍රත්‍යක්ෂතාවය තුළ ඔබ විසින්ම හෙළි කරන කාරණා අපි ප්‍රසිද්ධ කරා. ඒ කියන්නේ ඔබගේ කෙලෙස් ක්ෂය වන ස්වභාවය ඔබ අත්දකින ආකාරය ඔබ ඉස්සර තරම් කේන්ති යන්නේ නෑ. ඔබ මේවට ඇලෙන්නේ නෑ. ගැටෙන්නේ නෑ. ඔබ දරුවා කියලා දරු තණ්හාවෙන් පිච්චෙන්නේ නෑ. ඔබ මේ ලෝකෙට බැසගෙන ලොකු දුකක් විඳින්නේ නැහැ. ඔබ මේ මොහොතවත් පවතින්නේ නැතිබව දකිනවා. ඉන්න කෙනෙක් නැති බව ආත්මයක් නැති බව දකිනවා. ඔබ සමුදය දැක්කා. එන අරමුණ දෙයක් හම්බවෙන්නේ නෑ. අන්න එතන තණ්හාව ක්ෂය වුණා. අන්න දුක දැක්කා. අන්න දෙයක් නැති බව දුකක් නෑ .අන්න ඒක දැකපු තැන නිරෝධය දැක්කා. අන්න මාර්ගය මේ චතුරාර්ය සත්‍යයයි.

**ඒ චතුරාර්ය සත්‍යය දැකීමයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය වන්නේ. අන්න දුක්ඛ නිරෝධගාමිණී පටිපදා මාර්ගය ඔබ දැක්කා. එතකොට මෙන්න මේ රහතන් වහන්සේ මෙන්න මේ සාන්දිට්ඨිකව මෙය අත්දකිනවා කියලයි කියන්නේ. මේ**

තුළ ඔබට ඒක හමු වෙනවා. එතකොට ඔහු අශ්‍රවයන්ගෙන් අන්න යථාභූතයෙන්ම, යථාභූතයෙන් කියන්නේ මේ අභ්‍යන්තරයෙන් ඥාණයට මෙක අහු වෙනවා. යථාභූත යෙන්ම තමන්ගේම කෙලෙස් ක්ෂය වන බව අත්දකිනවා. ආශ්‍රව සමුදය යථාභූත අත්දකිමි. ආශ්‍රව ධර්ම ගැන කතා කරනවා. මොනවද ආශ්‍රව ධර්ම කියන්නේ කාමාශ්‍රව, භවාශ්‍රව, දිට්ඨාශ්‍රව. මේව කොහේද තියෙන්නේ. මේ සිතේ අරමුණේ තියෙන්නේ. ඔබ මේ මොහොතේ බිත්තිය දකිනකොට ඒ බිත්තිය කියනකොට ඒට තියෙන කාමාශ්‍රව එතන බිත්තිය කියල දෙයක් කියල ගත්ත භවාශ්‍රවය. ඒකට තියෙන වටිනාකම කාමාශ්‍රව. එතකොට කාමාශ්‍රව, භවාශ්‍රව. එතකොට ආත්මයක් වගේ මේ බිත්තිය තියෙනවා නම් ඒක ආත්මීය දෙයක් වගේ දැනෙන ආත්ම ස්වභාවය අන්න ආ. අන්න දෙයක් නැති බව දකිනකොට අවිජ්ජාශ්‍රව ප්‍රහාණය වෙනවා. අන්න ආශ්‍රව ධර්ම ප්‍රහාණ වන බව රහතන් වහන්සේගේ නුවණට අසු වෙනවා. මේ කෙලෙස් ක්ෂය වීගෙන යන ස්වභාවය එය දියවී ගෙන යනවා. ඒ කියන්නේ ටිකෙන් ටික ටිකෙන් ටික ක්ෂය ධම්මා, වය ධම්මා, සංඛත ධම්මා ස්වභාවය සකස් වුණේ අභිසංස්කරණයක් නිසයි. අන්න අභිසංස්කරණ නිරෝධයට යන තැන ක්ෂය වී ගෙන යනවා. තමන්ටම සිහියට හසුවෙනවා. ඥානයට හසු වෙනවා. කාලයාගේ ඇවෑමෙන් ටිකෙන් ටික ටිකෙන් ටික කාමාශ්‍රව, භවාශ්‍රව, දිට්ඨාශ්‍රව කෙලෙස් ක්ෂය වී ගෙන යනවා. ඒක ඔබටම අත් දකින්න ලැබෙනවා. ඉතින් එයයි ආර්ය අෂ්ඨාංගික මාර්ගය කියලා පෙන්නුවේ. ප්‍රතිපදාවක් පෙන්නුවේ. මේක ක්ෂය ධම්ම, වය ධම්ම කියන එක. මේ කෙලෙස් ක්ෂය වෙන එක තමන් යථාභූත ඥානයෙන් සත්‍ය දකින එක පමණයි කළේ. නමුත් ආශ්‍රව කෙලෙස් ක්ෂය වී ගෙන යන තමන් හිතලා කරේ නෑ.

ඒක නිරායාසයෙන්ම සිද්ධ වෙනවා කියලයි මෙතැනදී ඔබ දකින්න. මේ පැහැදිලි කිරීම රහත්වහන්සේගේ ස්වභාවයයි කියලා මේ පැහැදිලි කරන ස්වභාවය. එතකොට මෙලෙස රහතන් වහන්සේ මේ සත්‍යව මෙන්න මේ ස්වභාවය මෙන්න මෙලෙසයි කෙලෙස් ක්ෂය උනේ කියලා මේ විදිහටයි මේක වෙන්නේ කියන එක අන්න පැහැදිලි කරයි නම් ඒ රහත් ඵල උතුමන් වහන්සේ නමක් කියලා බුදුන් වහන්සේ පැහැදිලි කරනවා. ආශ්‍රව නිරෝධය අන්න යථාභූත ව දැන ගනී. මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ මාගේ සිත ඒ කාමාශ්‍රව, භවාශ්‍රව දිට්ඨාශ්‍රව අවිජ්ජාශ්‍රව කියන අන්න මිදුනේයයි අන්න විමුක්ති කල්හි විමුක්ති ඥාණයයි. අන්න විමුක්ති ඥාණය පහළ වූ බව දැන ගනි. අන්න විමුක්ති විමුක්ති ඥාණය පහළ වුණා. මිදුණ බවට ඥානයට හසු වුණා. සිහියට ජාතිය ක්ෂය විය. කිසිවක් දැන් දෙයක් කියලා හමුවන්නේ නෑ. මේ පුටු, ඇදන්, දුව, ගෙවල්, දොරවල්, අඹ ගහ, නා ගහ මේ ජාතියක් තියෙනවා. එහෙනම් දෙයක් හම්බ වෙනවා, භවයත් තිබ්බොත්, ජාතියක් තියෙනවා කිව්වේ ඒකයි. අන්න ජාතිය ක්ෂය විය දෙයක් හමුවන්නේ නෑ. දෙයක් හමු නොවන තැන ඔහුට වාසය කරන්න මෙලොවක් හමුවන්නේ නෑ. අන්න මෙලොවත් මිදිලා. අන්න එලවත් මිදිලා. අන්න දෙලොවම සමව වාසය කරනවා කිව්වා. අන්න එතනයි **අනුත්තරත්වය.** සදා අමරණීයත්වය. දැන් සදාඅමරණීයත්වයට පත් වෙන හැටි මේ ස්වභාවය තුළ ඔබ දැක්කා. ඉතින් මෙතනයි මේක අත්දකින දෙයක් මැරිල ලබන දෙයක් නෙමෙයි. මරණින් මත්තේ වෙන එකක් නෙමෙයි. ඒ මිථ්‍යාදෘෂ්ටියේ මත මේ ධර්මයේ නෑ. සාන්දිට්ඨික ධර්මයක් ප්‍රත්‍යක්ෂ ධර්මයක් මේක අදහන එකක් නෙමෙයි. විශ්වාසයක් නෙවෙයි. ඇදහිල්ලක් නෙවෙයි. මේක මේ මොහොතේම ඔබට ප්‍රත්‍යක්ෂ වෙනවා.

ඉතින් ඒ ධර්මය තමයි මේ හොඳින් පැහැදිලි වෙනවා. ඔබට ඒක අහන්න ලැබෙනවා. ඉතින් මෙය හොඳින් අධ්‍යයනය කරන්න. මේ සූත්‍රය ඉතාම වටිනවා. ඒවායේ තිබෙන ගැඹුරු කාරණා අවබෝධයක් ඇතිව ප්‍රත්‍යක්ෂතාවය තුළ ඔබටම පිරිසුදු කරලා දෙනවා. ඔබ යන මග නිවැරදි බවත් ඒ වගේම යමෙක් ඒ මග පටලවාගෙන ඒ මහ විකාරයක් වගේ දොඩ වවනවා නම්, කටමැත දොඩම්වවනවා නම්, පටලවාගෙන එ මග හිර වෙලා අන්න එතනයි අර මග්ගා මග්ගඤාණදස්සනය. ඒ කියන්නේ මඟ නොමග පැටලුණු තැන පටිසංඛානු ඥානය ඒකටත් අන්න ඔබට සිහිය අහුවෙනවා පටලැවීලි ඇති බව. පටිසංඛාව කිව්වේ ඒකයි. එහෙනම් උදයව්‍යඤාණය, වය ඤාණය, භයතුපට්ඨාන ඤාණය, මුඤ්චිකම්‍යතා ඤාණය, ආදිනවනානුපස්සනා ඤාණය, අන්න පටිසංඛා ඤාණය අන්න සැක සංකා දුරු වෙලා. සත්‍යම දැක්කා. අන්න සංඛාර උප්පත්තිය. අන්න එතනයි ඒ සංඛාර උපේක්ඛා ඤාණය සියල්ල සංඛාර ධර්මයෝ. අන්න මිදුණු තැන. ඒයයි විමුක්ති ඤාණං කියලා කිව්වේ. එහෙනම් ඒ විමුක්ති ඤාණං කියලා කිව්වේ අන්න මිදෙන බව තමන්ටම සිහියට අසුවෙනවා. දැන් සියල්ල එන අරමුණේ සත්‍ය දකින ඒ හැටි දැකලා මිදෙන ආකාරය ආශ්‍රව කෙලෙස් ක්ෂය වීගෙන යන බව තමන්ගේම. අභ්‍යන්තරයේ තණ්හාව නමැති කෙලෙස් ගින්න දියවී ගෙන ගිය බව දැනෙන්න ගන්නවා, ඔබට එය දකින්න ලැබෙයි. ඒ ඔබගේම අත්දැකීමක් තුළ පමණයි බාරගත යුතු වන්නේ. විශ්වාසයක් ඇදහිල්ලක් නෙවෙයි. ඉතින් මෙතන බුදුන් වහන්සේ මේ ජබ්බි සෝධන සූත්‍රය තුළ අපට දකින්න ලැබෙනවා. පැහැදිලි කරලා තියෙන්නේ නිවන් මගක්. ඒ සමගමයි. ඒ සමගම මේ පැහැදිලි කිරීම තුළ නිවන් මග පැහැදිලි කරලා තියෙනවා. හැබැයි රහතන් වහන්සේ නමක්

මේක පටලවාගෙන බොරුවක් කරන්න ගියාට වැඩක් නෑ. මෙන්න මේ විදිහට ප්‍රශ්න කරන්න කියලා බුදුන් වහන්සේ ප්‍රශ්න වල මෙන්න මේ ස්වභාවය ඔහුට බැරිනම් පහදා දෙන්න ඔහු රහතෙක් නෙමෙයි කියලා එතනින් කියනවා. එතනින් ආකාර ගණනාවකින් මේ පැහැදිලි කරන බව ඔබටත් දැන් අහන්න ලැබෙනවා.

එතකොට **විමුක්ති විමුක්ති ඥාණය කියලා අන්න ඥාණයට හසු වෙනවා මිදෙන බව. ජාතිය ක්ෂය වන බව. අන්න බ්‍රහ්මචරියා වසන ලදී කියන තැනට අන්න සිව්මග කතකරණිය කරන ලදී කියන තැනට එනවා. මේ රහත්ඵලය සඳහා කළ යුතු අන් කිසිවක් නැතැයි අන්න ඔහුගෙම සිහියට නුවණට හසුවෙනවා. ඥානයට හසුවෙනවා. ඇවැත්නි, මෙසේ දන්නා වූ, මෙසේ දක්නා වූ මා විසින් මේ සවිඥානක කයෙහි දු බැහැර හැම නිමිත්තෙහිදු අහංකාර මමිංකාර මානානුශයෝ නසන්නා ලද යයි අන්න එය යමෙක් අවබෝධට පත්වී ඒ ආකාරයට පැහැදිලි කරයි නම් අන්න ඒ උතුම් රහතන් වහන්සේ නමක් කියල බුදුන් වහන්සේ පැහැදිලි කරා.** මේ බෞද්ධයා කියන්නේ අධ්‍යාත්මිකව ඉතාම දියුණු ධර්මයක් අවබෝධ කරගන්න අයයි බෞද්ධයින් වන්නේ. එහෙනම් ඔහුන් නිකං මේ වගේ ස්වභාවයකට පත් වෙලා තියෙන්නේ ඔවුන්ගේ අධ්‍යාත්මික පිරිහිම නිසයි. අද මුළු රටටම ව්‍යසනයට හේතුව මෙන්න මේ අධ්‍යාත්මික පිරිහීමයි. බාහිර දෙයක් නැති කොට මොනවද හොරකම් කරන්නේ. කවදාක හරි පුලුවන්ද මේ සිත පිනවලා ඉවර කරන්න පුළුවන්ද කවදාවත් බැහැ.

තෙරුවන් සරණයි !!!

# ජබ්බි සෝධන සූත්‍රය - 04

තෙරුවන් සරණයි !

**බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ 12 වන ග්‍රන්ථයේ මජ්ඣිම නිකායේ තුන්වෙනි කාණ්ඩය 149 වන පිටුව. 143 වන පිටුවේ ඉඳන් මේ දේශනය පිටු දහයක පමණ දකින්න ලැබෙනවා.**

ජබ්බි සෝධන සූත්‍රය අපි දිගටම පැහැදිලි කර ගෙන ආවා. මේ ජබ්බි සෝධන සූත්‍රයේ කොටස් 3ක් පැහැදීලි කලා. මේ සූත්‍රය තුල පෙන්නන විශේෂම දේ තමයි, මේක ඔබට දිගටම පැවසුවා. ඉතිං මේ සූත්‍රය තුල බුදුන් වහන්සේ මම රහත් කියල කිව්වට පිලිගන්න එපා කියල කියපු එක පැහැදිලිවම දේශනා කරලා තියෙනවා. ඒ අභිනන්දනය කරන්න එපා පිලිගන්න එපා ඒ විදියට

**'ඛීණා ජාති, වුසිතං බ්‍රාහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී'ති. තස්ස, භික්ඛවෙ, භික්ඛුනො භාසිතං නේව අභිනන්දිතබ්බං '**

මේ විදිහට කිව්ව කියල

**'ඛීණා ජාති, වුසිතං නාපරං ඉත්ථත්තායාති පජානාමී'ති.**

කියල කිව්වට පිලිගන්න එපා කියල බුදුන් වහන්සේ පැහැදිලිවම භික්ෂුන් වහන්සේලාට දේශනා කළා.

"න නේව අභිනන්දිතබ්බං"

බාර ගන්නත් එපා කියලා කිව්වා. රහතන් වහන්සේ නමක් කියලා බාර ගන්නත් එපා කියලා කියනවා. පිලි ගන්නත් එපා කියලා කියනවා. "**නේව අභිනන්දි තබ්බං**" කියලා "**නප්පටික්කොසි**" ඒ කියන්නේ ඒ පිලිගන්න එපා කියන එක. ඒ කියන්නේ "**තබ්බං අභිනන්දිතබ්බං අප්පටික්කෝසි**"

එතකොට මේ විදියට තමයි අන්න බුදුන් වහන්සේ පැහැදිලි කරනවා. කොහොමද මේක පිළිගන්නේ. කොහොමද එහෙනම් අපි රහතන් වහන්සේ නමක් හඳුනාගන්නේ කියන එක. එතකොට බුදුන් වහන්සේ ප්‍රශ්ණ කරන්න කියලා කියනවා. මොනවද ප්‍රශ්ණ කරන්නේ. බුදුන් වහන්සේ ඔය ප්‍රශ්ණ කරන ආකාරය පැහැදිලි කරනවා. ඒ විතරක් නේවෙයි, ඒ ප්‍රශ්ණ වලට කෙලෙසද පිළිතුරු දිය යුත්තේ කියන එකත් බුදුන් වහන්සේ, මේ සූත්‍රය තුළ පැහැදිලි කරනවා.

යමෙකුට මේ ධර්මය පොඩ්ඩක් අහන්න ලැබෙන කොට ඇතුළට එනවා එක දරාගන්න බැරි කම්පනයක්. ස්වභාව ටිකක්. මේ ගොඩක් අයට වෙන දේ මේ කියන්නේ. චිත්ත කම්පන ඇති වෙනවා. ඒවා ලෝකෝත්තර චිත්ත කම්පන වෙන්නත් පුළුවන්. ලෞකික ස්වභාවය වෙන්නත් පුළුවන්. ධර්මවබෝධයක් නැතුව ඇතිවන චිත්ත කම්පන ලෞකික චිත්ත කම්පන ධර්මාවබෝධය කියන්නේ මේ ඔබ හිතන තරම් එහෙම සුළුපටු දෙයක් නෙමෙයි මේ අනුසෝතය තුළ මේ එක රටාවකට ගලන සිත ඒක දරාගන්න බැරි කමට ඒක පටිසෝතයට හැරෙනකොටම චිත්ත කම්පන ඇති වෙනවා. නමුත් ඒක රහත්භාවය නෙවෙයි නමුත් සමහරු ඔතනම රහත් වෙලයි කියලා හිතනවා.

මේ සමහර අය අපිටත් කෝල් කරනවා. අපිත් මේව ඉදිරිපත් කරලා තියෙනවා. ඔබට අහන්නත් ලැබිලා ඇති. මේ ප්‍රශ්ණ කරන්නේ මේ රහත්ද කියලා මේ නොකියා අහන්නේ. මේ මෙහෙම ධර්මය අහගෙන ඉන්නකොට ඇතුලේ නිකං වයිබ්‍රේෂන් එකක් වගේ එනවා. මේක දරාගන්න බෑ. ඊට පස්සේ කරන දේ මතකත් නෑ. ඉන්න තැන මතකත් නෑ. ඔක්කොම අමතක වෙලා යනවා. ඔය වගේ ලොකු චිත්ත කම්පන ස්වභාව එක එක විදිහට විවිධාකාර විදිහට, ඔලුව කැක්කුමක් ආවා. මේ විදිහට ගොඩක් ඒවා කියනවා. විවිධාකාර විදිහට අහන්න ලැබෙනවා. ඔබ හිතනවාද මේ රහත් වෙලා කියලා. නෑ. ඔබ හිතනවාද මේ සෝතාපන්න වෙලාද කියලා. ඒත් නෑ. මොකද්ද ඔය වෙලා තියෙන්නේ. ඒ චිත්ත කම්පන විතරයි. මොනවද ඒ ලෞකික චිත්ත කම්පන. ඔබ කළුවරේ යනකොට ඔබ සාමාන්‍ය පෘථග්ජන කෙනෙක් විදිහට ඔබ දකින්න කළුවරේ යනකොට කවදාවත් දැකලා නැති විදිහට මොකක් හරි ඔය අත්තක් හෙල්ලෙන කොට හරි මොනාහරි චායාවක් මැවෙන්න ගත්තොත් ඔබ බය වෙලා දුවනවා. ඇයි ඒ, ඔබ හිතනවා මේ භූතයෙක්, පෙරේතයෙක් එහෙම තමයි එකපාරටම ගන්නේ. සමහර විට මේ අසරණ මනුස්සයෙක් ගහක් යට නිදියගෙන ඉඳලා ගහ හෙල්ලෙනවා. ඒ වගේ ඒවා අපි ගොඩක් දාලා තියෙනවා. ගොඩක් මේ සමාජයේ තියෙන්නේ මිත්‍යාවක්, දෘෂ්ටියක් තියෙන්නේ. ඔය අපි හිතන ගොඩක් ඒවා අපේම සිතිවිලි තියෙන්නේ. හොඳට බලන්න. අපි හොඳට ඔබට පැහැදිලි කළා නේද? මේ ඇස, කන, දිව, නාසය, කය මෙන්න මේ ආයතන ඇතුළේ අපේ මේ විඤ්ඤාණ අත්දැකීමෙන් තොර දෙයක් නෑ කියල. ශබ්ද අපි හදාගත් එකක්. අපි කිව්වනේ කර්ණශංඛ පටලය හෙල්ලෙන හැටි. අපි හදාගත් එකක්. වර්ණ අපි හදාගත්ත එකක්. ඒ චක්ඛු

විඤ්ඤාණ කියල අපි හදාගත්ත එකක්. යෂ්ටි සෙල අපි හදාගත්ත එකක්, දැන් වර්ණ එලියේ නෑ.අපි ඒවා හදාගෙන තියෙන්නේ. ශබ්දත් නෑ ඒවත් අපි හදාගෙන තියෙන්නේ. රස අපි හදා ගත්ත එකක්. දිව සෙන්සර් එක වැඩ කරනකොට රස දැනෙනවා. ඒක අපි හදා ගත්ත එකක්. කවුරුත් හදාග න්ත එකක් නෙමෙයි. මේක සිස්ටම් එකටම ඒක සිද්ධ වෙන දෙයක් මැවෙන එක. ඒක හරි නම් දේදුන්නක් මැවෙනවා වගේ තමයි. අර හදුන්කුරුක් කරකවන කොට ගිනි වළල්ලක් පේන්නේ ඒ වගේ තමයි.

**සංඛාර මැවෙන එකක්. සකස් වෙච්ච එකක්. ගන්ධය, රස, වර්ණ, ශබ්ද ඒ විතරක් නෙමෙයි උණුසුම, සීතල, තද ගතිය. දැන් මේවා ඔක්කොම දැන් විඤ්ඤාණයෙන් මැවෙන්නේ. විඤ්ඤාණ අත්දැකීම. දූන් මේවා කොහෙවත් බාහිර හම්බ වෙන්නේ නැහැනේ.** හොඳට බලන්න දැන් මේ බාහිර නෙමෙයි, අපේම මේ අත්දැකීමනේ ඇසුරු කරන්නේ. විඤ්ඤාණ මායාව ඇතුලේ අපි දැන් ෆන්ටසි වල්ඩ් එකක් වගේ හදාගෙන නේද ජීවත් වෙන්නේ. මේ පුංචි දරුවා ඉපදෙන කොට මුකුත් දන්නේ නෑ. බුද්ධාගමේද, හින්දුද, ක්‍රිස්තියානිද, මොකක් වත් දන්නේ නෑනේ. පුංචි දරුවා ගැහැනුද, පිරිමිද කියලවත් දන්නේ නැහැනේ. මේ විදිහට නේ ඔබත් ඉපදුනේ. ඕවා දැන් බාහිරෙන් නේද දාන්නේ. ආ දිව්‍ය ලෝකයක් තියෙනවා. නිරයක් තියෙනවා මෙන්න මෙහෙමයි. දැන් ඊට පස්සේ දානවානේ, මේ බ්‍රාහ්මයෝ මෙහෙමයි, පෙරේතයෝ මෙහෙමයි, එහෙ තියෙනවා මෙහෙම මාලිගාවක් තව එක, එක ඒවා දානවා නේ. ඕවනේ හීන වගේ මැවෙනවා නේද. ඊට පස්සේ කාටූන් වගේ ඕවා හදලත් දානවා නේද? ඊට පස්සේ ඕව ත්‍රිමාන කරලා පින්තූර

ඇඳලා එක එක විදිහට දානවා නේද? දැන් මේවා ඔබ ගේම මනෝමය අර සංඥාවල සකස් වෙනවා නේද? ඊට පස්සේ ඔබට ඒවා පේන එක ඔබ හිතනවදා ද කොහේ හරි තියෙනවා කියලා. අපිට අපිවත් හමුවෙලා නැතිකොට, අපිට බාහිර ලෝකෙක අත්දැකීමකුත් නැතිකොට අපි අපේ විඥානය අත්දැකීම් නම් මේ, අපි මේ ඔක්කොම ඇසුරු කරන්නේ මේවත් අපේම විඤ්ඤාණ අත්දැකීම් නෙමෙයිද? නේද මේක මායාව. මේ අසෘතවත්, පෘථතග්ජන මනුස්සයා නැති ඒවා මවා ගන්නවා. ආ මෙහෙමය ඒ කාලේ මෙහෙමය. මෙහෙම ඉන්නවාය. මෙහෙම තියනවය, දැකලා තියනවය මෙන්න කියලා ඔක්කොම විඤ්ඤාණ මායාවක්නේ.

බුදුන් වහන්සේ තුච්ච පෝඨිල කියලා කියනකොට බුදුන් වහන්සේට කේන්ති ගිහිල්ලා කිව්වා නෙමෙයි. ඒ පෝට්ල භික්ෂුවගේ මානය නැති වෙන්නේ මෙහෙම කිව්වොත් තමයි. ඒක නිසා තමයි පෝඨිල භික්ෂුව ඇත්තටම සත්‍ය අවබෝධ කරන්නේ. අර ලොකු දැනුමක් කරේ තියාගෙන ලොකු මාන්නයකින් ඉදිමෙන් පලක් වෙන්නේ නෑ. මොකද අභ්‍යන්තරයේ මමය නැති වෙලා නෑ. මමය ඉන්නවා. ආත්මය නැති වෙලා නෑ. ආත්ම සංඥාවේ ඉන්නකම් දුක උරුමයි. දුකින් මිදෙන්නේ නෑ. අන්න බුදුන් වහන්සේ දුකින් මුදවන්න මේ සත්වයාට කරන දේ බලන්න. සැරෙන් කතා කරනවා. තදින් කතා කරනවා. තුච්ච පෝඨිල කියලා හත්වතාවක් විතර ජේතවනාරාමයෙන් එළියට බහිනකම්ම කියනවා. දැන් ඔබ කියයි ආ බුදුන්වහන්සේ කරපු එක වැරදියි. ඒ ඔබගේ අඥානකම. ඔබ මොනවද ඔබ ධර්මය තුළ ඔබට ඇත්තටම අවබෝධයක් තියෙනවද එහෙම. ඔබ බුද්ධ විෂය හඳුනනවද. ඔබ මේ ධර්මය අඳුරනනවද නෑ. ඔබ පෘථග්ජන කියන්නේ

උන්මත්තක කියන්නේ අවිද්‍යා භූමිය. ඔබ මොකුත් දන්නේ නෑ. හැමදාම ඉතිං දන්නෑ කිය කියා මේක නිකං බෙරයක් වගේ ගහ ගහ ඉන්නවද?. කවද්ද ඔබ දැන ගන්නේ. ඒක තමයි බුදුන් වහන්සේ දේශනා කරන්නේ මහණෙනි, මේ සත්‍ය නොදැක කල්පයක් හිටියත් වැඩක් නෑ මහණෙනි කියලා. මේ සත්‍ය එක මොහොතක් දකිනවානම් කල්පයක් හිටියත් වැඩක් නෑ මහණෙනි. එයයි වටින්නේ කියලා කියනවා. මේක තමයි ඇත්ත කතාව. ඔබ ඔය කතා කරන භූත කතා ඒව මේව සේරම විඤ්ඤාණ මායාවල්. මේක මේ ධර්මය තුළ තියෙන වටිනාම ස්ප්‍රිට් එක වගේ. ඒ කියන්නේ, අපි කියන්නේ ස්ප්‍රිට් එක වටිනාම ටික කියලා, අන්න ඒ ටික මේ කියන්නේ.

ඔබ රැවටෙන්න එපා. ජටිලයෝ, නිගණ්ඨයෝ, බ්‍රාහ්මණයෝ, බුදුන් වහන්සේ ධර්ම දේශනා කරන්නේ මේ බ්‍රාහ්මණ සංකල්පය ඔළුවේ තියාගෙන ඉන්න මහ බ්‍රාහ්මයා ලෝකය මැව්වා කියලා කියන අයට. ඒ ගොල්ලන්ව ගලවන්න ලේසි නෑ. ඒ ගොල්ලො මේ බණ අහන්නේ නෑ. ඒ ගොල්ලන්ගේ ඒවට මොනවා හරි විරුද්ධව කතා කළොත්, ඔබ දන්නවා තමන්ගේ බිසව ජේතවනාරාමයට එන්නවත් කැමති වෙන්නේ නෑ.

අනිත්‍ය ධර්මය දේශනා කරන කොට, ඊට පස්සේ කවි කියෝනවා. ඊට පස්සේ ජේතවනාරාමේ සුන්දර බලන්න කවිවල. ඒවා ඇහෙන්න එහෙම බලන්න ජේතවනාරාමයට එනවා. ඊට පස්සේ බුදුන් වහන්සේ බැහැ නොදැක ජේතවනාරාමෙන් එළියට බහින්න බෑ කියලා රජතුමා අණක් නියම කරනවා. ඊට පස්සේ බුදුන් වහන්සේ බැහැ දකින්න යනවා. වන්දනා කරලා එනවා කියලා. බුදුන් වහන්සේ

මොකක්ද එතැනදී අන්න කාන්තා රුවක් වැහැරෙනවා. ලස්සනට ඉන්න කාන්තා රුවක් වැහැරෙනවා මැව්වා කියලනේ කියන්නේ ධර්මය තුළ. ඉතිං ඕක කියනකොටත් මැවෙනවානේ. ඔබ බලන්න නිකන් කාන්තා රුවක් මෙහෙම මෙහෙම කියල ඕක කියනකොටත් මෙහෙම දත් ටික හැලිලා, මෙහෙම වැහිරිලා මෙහෙම යනවා කියනකොටත් මැවෙනවානේ . ඒක තමයි මැවීම කියන්නේ. අන්න මෙය අවබෝධ වෙනවා. ඊට පස්සේ තමයි ධර්මය අවබෝධ වෙන්නේ. ඒ බිසවුන් වහන්සේට ධර්මය අවබෝධ කරවන්න රජතුමා කරපු උපක්‍රමය. ඉතිං මෙන්න මේ ධර්මය කියන්නේ කුමක්ද කියල බලන්න. ධර්මය තුළ අපට බොරුවක් එහෙම ඇත්ත කරගන්න බැහැ.

මේ ජටිලයෝ, නිගණ්ඨයෝ, බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණ සංකල්ප ඔලුවේ තියාගෙන මහා බ්‍රාහ්මයා ලෝකේ මැව්වා කියනකොට, ඔබ දන්නවා සැරියුත් හිමියෝ බ්‍රාහ්මණ ගිහිකල. බ්‍රාහ්මණයෙක්. උපතිස්ස බ්‍රාහ්මණ. එතකොට මහා බ්‍රාහ්මයා ලෝකේ මැව්වා කියල එක තමයි තියෙන්නේ. සැරියුත් හිමියන්ගේ අම්මා, සැරියුත් හිමියෝ අන්තිම මොහොතේ පිරිනිවන්පානකනුත් සැරියුත් හිමියන්ගේ මව මිත්‍යාදෘෂ්ටිකයි. එතකන් හිතන් ඉන්නේ මහා බ්‍රාහ්මයා ලෝකේ මැව්වා කියලා. බ්‍රාහ්ම සංකල්පයයි, දේව සංකල්පයයි ඔක්කොම ඔළුවේ තියාගෙන ඉන්නේ. දැන් බලන්න සැරියුත් හිමියෝ එතන දාන්නේ අර බුදුන් වහන්සේ දෙන උපක්‍රමයයි. මහා බ්‍රාහ්මයා ඇවිල්ලා වැන්දා කියනවා.

අසනීපෙන් හිටපු සැරියුත් හිමියන්ට මහා බ්‍රාහ්මයා ඇවිල්ලා වැන්දා කියනවා. එතකොට මොකද වෙන්නේ.අර අම්මගේ අර මෙච්චර කලක් මම මොකටද මහා බ්‍රාහ්මයාට

වැන්දේ, මහා බ්‍රාහ්මයාත් මගේ පුතාට වඳිනවා නම් කියල. අන්න තමන්ගේ අර ධර්මයට තියෙන ගෞරවය ඇති වෙනවා. අර මිතථ්‍යාදෘෂ්ටිය බිඳ වැටෙනවා. අර මහා බ්‍රාහ්මයා ලෝකෙ මැව්වා කියල. එතනින් බ්‍රාහ්ම සංකල්පය කඩන්න බලන්න සම්‍යක් ප්‍රයෝගයක් නෙමේයි ද ඒ භාවිතා කරන්නේ. ඒ සම්‍යක් ප්‍රයෝගය භාවිතා නොකරා නම් අර අම්මට නොකිව්වා නම් මේ බ්‍රාහ්මයා නෙමෙයි ලොකු. මේ ධර්මය අවබෝධ කරපු පුරුෂයාට වඳිනවා කියල ඇයි බුදුන්වහන්සේ මේක කරනවානේ.

ජටිලයෝ, නිගන්ඨයෝ, බ්‍රාහ්මණයෝ, බණ අහන්න එනකොට ඒ ගොල්ලො කියන්නේ බ්‍රාහ්ම පාරිසජ්ජය, බ්‍රාහ්ම පුරෝහිතය, මහා බ්‍රාහ්මය. දේව ලෝක. ඔව තමයි කියන්නේ බුදුන් වහන්සේ  එහෙයි එහෙයි කියනවා. ඉතිං ඔය දානේ දීලා එහේ යනවා කියල කියන්නේ. ඒකටත් එහෙයි කියනවා. හැබැයි දාන දාහක් දෙනවට වැඩිය මේ ධර්මය එක මොහොතක් දකින්න කියන එක නේද අගයක කරන්නේ. දෙවියන්ටත් සුගතිය මනුස්ස ලෝකෙය කියනවනේ. එතකොට මේ බ්‍රාහ්මයින්ට, මේ අදහන අයට මොකද වෙන්නේ. යන එන මං නැති වෙනවා. ඇයි ඒ දැන් එහේ යන්නේ මොකටද, එහේ අගේ කරන්නේ මනුස්ස ලෝකය නම් මේ සුගතිය තියෙන්නේ. එහේ ගිහිල්ලා ආයි මෙහෙ එන්නේ මොකටද? රවුම් ගහන්න ද යන්නේ. අන්න එතකොට හිතනවද නෑ නෑ, එහෙනම් මේ මනුස්ස ලෝකෙම සත්‍යය අවබෝධ කරගන්න ඕනා කියලා. ඕකට හරවන්න නෙවෙයිද ඔය කියන්නේ. දැන් අපේ අය අර බණ කියන්නේ පොතේ ලියලා තියෙනවා දැන් අර එහෙයි, එහෙයි කියපු ටික තියෙන වානේ. අර බ්‍රාහ්මපාරිසජ්ජ, බ්‍රාහ්ම පුරෝහිත

මේවා මරුන්, බඹුන්, මිනිසුන් දෙවියන් සහිත මිත්‍යාදෘෂ්ටික භූමියක්. දැන් තියෙනවා කියලා හිතුවා නේ බුදුන් වහන්සේ කිව්වා කියල නෑ නෑ. බුදුන් වහන්සේ එහෙම දේශනා කරලා නැහැ. බුදුන් වහන්සේ කියන්නේ ඒ භූමියෙන් මිදිලා සම්මා සම්බුද්ධත්වයට පත්වුණා කියලා. ඒ මිථ්‍යාදෘෂ්ටික භූමියෙන් මිදුන කියලයි කියන්නේ. ඒක මිථ්‍යාදෘෂ්ටික භූමිය කියන වචනයම එතන තියෙනවා ගැබ්වෙලා. එතකොට අවිද්‍යා මිථ්‍යාදෘෂ්ටික භූමිය කියන්නේ මරුන්, බඹුන්, මිනිසුන්, දෙවියන් සහිතයි කියල හිතන එකමයි. මේ මිථ්‍යාදෘෂ්ටියෙන් ඔබ ගැලවෙන්නේ කවද්ද ? ඒක ඇත්ත කරගෙන ඔබ ඉන්නේ. එහෙම දෙයක් නැති බවයි ධර්මය තුළ හොඳට අධ්‍යනය කරනකොට නව සත්තාවාස කියලා කියනකොට සංඛාර උප්පත්ති ලෝක කියලා සිත තුළින් තිස් එක් ලෝක ධාතුව දකින හැටි බුදුන් වහන්සේ දේශනා කරනකොට එතකොට මොනවද කියන්නේ. දෙවියන්ටත් සුගතිය මනුස්ස ලෝකය කියනකොට දෙවියන් මිනිස්සුන්ට වදිනවා කියන කොට ඔබ දිව්‍යලෝකේ යන එක නවත්වන්න නෙවෙයි බුදුන් වහන්සේ දේශනා කරන්නේ. ඒ සිහිනයේ ඒ සිතූ සිතුවිල්ල ෆන්ටසි එක ඒ සිහින සංකල්පය බිඳ වට්ටන්න නේද හදන්නේ. මිත්‍යා මායාව. **ඔන්න ඔතෙන්ට එන්න. අන්න එදාට තමයි සම්මා දිට්ඨියට එන්නේ.** එතකන් ආර්යෂ්ඨාංගික මාර්ගයකුත් නෑ. සම්මාදිට්ඨිය කුත් නෑ. අවිද්‍යා භූමියේ ඔබ දුගති පරායනයි. ඒකයි අසිදිසි මහා දානය දුන්නත් මල්ලිකා දේවිය දුගතියට යනවා කිව්වේ ඒකයි. අසුභාරදාහක් වෙහෙර විහාර හැදුවත් අශෝක අධිරාජ්‍යයා දුගතියට වැටුණේ. මේ කර්ම භූමියයි. හේතු ඵල දහමයි කවලම් කර ගන්න යන්න එපා. අද පොත් තියෙනවා ඒවා ඒ අයට තියාගන්න කියන්න. සත්‍ය ධර්මය නම් ඔබ ඒ විදිහටම දකින්න. අබුද්ධෝත්පාද තිබුනු එකක්

තමයි කර්ම ඵලය කියන්නේ. මහරහතන් වහන්සේ නමක් බුදුන් වහන්සේ හඳුන්වන්නේ කොහොමද

**"යෙ ධම්මා හේතුන් හගවා තේසං හේතු තථාගත ආහ"**

තථාගතයන් වහන්සේ හේතුඵල දහමයි දේශනා කරන්න කිව්වේ. ඒ තථාගතයන් වහන්සේ හේතුඵල දහමක් දේශනා කරයි. මේ බුදුසමය මහරහතන් වහන්සේලා බුදුන් වහන්සේ හඳුන්වන්නේ එහෙමයි. එච්චර ඕන නෑ. ඔබ බලන්න ඔබට පොඩි හරි නුවනින් බලන්න විමසලා බුද්ධත්වයට පත්වෙලා පස්වග තවුසෝ මුණගැහෙන්න එනවා. **ඒ දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කරන්නේ පෙර නොඇසූ විරූ දහම කියලා තිබු කර්ම ඵලය ද, ඒ, නෑ. ඒ හේතුඵල දහමයි.**

**"හේතුන් පටිච්ච සම්භූතා - හේතු භංගා නිරුජ්ජති"**

කියලා ධර්මය තමයි සාස්ශ්‍රතයයි, උත්තේජනයයි දෙකෙන් මිදුණු දහමක්. ඇත කිව්වත් වැරදියි, නැත කිව්වත් වැරදියි .අන්තයකට නොගිය දහමක්. මජ්ඣඣාණං කියලා දේශනා කරන්නේ. කවදාවාත් චතුරාර්ය සත්‍ය ගන්න බෑ අන්තේකට. **චතුරාර්ය සත්‍යය කියන්නේ**

**දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරොධ සත්‍යය, මාර්ග සත්‍යය**

**ඒකි කියන්නේ දෙයක් තියෙනවනම් එතන දුක්ඛ සත්‍යයයි. හැබැයි දෙයක් නැති බව දැක්කොත් අන්න එතනයි. දෙයක් තිබ්බොත් දෙයක් තියෙනවා කියලා ගත්තොත් ඒකමයි දුක්ඛ සත්‍යය. එයමයි සමුදය සත්‍යයට හේතුව ඒකමයි. එහෙම දෙයක් නැති බව දැකීමයි නිරෝධ සත්‍ය. ඒ දකින එකයි මාර්ග සත්‍යය. මේක නිකන් අවුල් කර කරගන්න ඕන් නෑ.**

හරිම සරලයි. අද මේ වෙනකොට බුධොත්පාද නාලිකාව තුළින් අද සංඝයා වහන්සේලා පවා තේරුම් අරන් ඉන්නවා. **දුක්ඛ සත්‍ය නැති කරන්න නම් බාහිර දෙයක් නැති බව දකින්න ඕනා කියලා. දෙයක් තියෙනවා කියලා දකින තාක් කල් එතන හිතන කෙනා ඉන්නවා කියලා. කෙනා හිතලා නැති කරන්න බැරි බව.** අද භික්ෂූන් වහන්සේලා දේශනා කරන්නේ බුද්ධෝත්පාද නාලිකාවේ මේ දේශනා උකටහ ගෙනයි. ආත්මය නැති කරන්න නම් දෙයක් නැති වෙනවා. දෙයක් තියෙන කම් ආත්මය තියෙනවා කියලා දැනුයි වැටහිලා තියෙන්නේ. එයයි බුදුන් වහන්සේ දේශනා කරපු ඒ පරම සත්‍යය කියලා අපි ඔබට හෙළි කළා. මේ දේශනා කාටවත් අයිතියක් එහෙම කාටවත් බැබළෙන්න එහෙම එකක් නෙවෙයි සොබාදහමේ න්‍යායයි. මේ සොබාදහම තුළ සත්වයෙක්, පුද්ගලයෙක්, කෙනෙක් හමුවන්නේ නෑ. ඒ සොබාදහම පමණයි.

එතකොට මේ ජබ්බි සොධන සූත්‍රය තුළ මොකද්ද මේ බුදුන් වහන්සේ මේ පිරිසිදු කරලා දෙන්නේ. මේ තමන්ගෙම ඉන්ද්‍රිය පිනවීම තමයි, මේ ආයතන ටික පිනවීම තමයි, අපි මේ කාම භූමියේ හැමෝගේම ඒ ස්වභාවය. කාම භූමියේ ඉන්න හැමෝගේම ස්වභාවය. අවිද්‍යා භූමියේ ස්වභාවය මොකක්ද? ආයතන ටික පිනවන එක. එකේ පිනවීමේ එක කොටසක් තමයි මම රහත් කියලා කියන්න උත්සාහ කරන එක. ඕක ව්‍යසනයක් වගේ එකක් ඕක. බුදු සමයෙන් තිබ්ල තියෙන බව පේනවා මේ සූත්‍රය බැලුවහම. හරි ලේසියි කියන්න මම රහත් කියලා.

ගිහි වතේ කවුරුත් රහතන් වහන්සේලා නෑ. ඒක හොඳට මතක තියා ගන්න. දරාගන්න ඒක. බුදු සමයේ වත් අසූහාර

දහසක් ධර්මස්කන්ධයේ වත් කොහේවත් හම්බුවෙලා නෑ. අරහත්ත කියන්න රහ නැති වුණා කියන එක. ඒ කියන්නේ සම්මුතියෙන් කතා කරනවා නම්, මලයි කියල එතෙන කෙනෙක් ඉන්න විදියක් නෑ. මේ අරහත්වයට පත්වෙනවා කියන්නේ කෙනෙක් නෙමෙයි, පුද්ගලයෙක් නෙමෙයි.

සතර වෝහාර ධර්මවත් අඩුගානේ වැටෙන්නේවත් නෑ. එහෙම වැටහෙනවා නම් මේක කරන්න බෑ. මේ බුදුන් වහන්සේ රහත් භාවය යමෙක් ප්‍රකාශ කරනවානම් ඒක බාර ගන්න එපා පිළිකෙව් කරන්න එපා.

"නේව අභිනංදිතෝ තබ්බං"

එහෙම්මම කෙලින්ම කියලා ඒක කෙලින්ම ප්‍රතික්ෂේප කරලා ඉවරයි. මේ රහත් භාවය එහෙම කියන එකක් නෙ නෙවෙයි. තමන්ටම සන්දිට්ඨිකයි. තමන්ටම එහෙම කිසිම දෙයක හරයක් මොකුත් නොදැන එහෙම සත්ව, පුද්ගල ආත්ම ස්වභාවය ගිලී ගියා කියල. ආත්මයක් නැත්තන් ආයි ඔහු කියන්න යන්නේ නෑ. කවුරුත් ආත්මේ තියෙන හින්දයි කියවන්නේ. අද අපේ මේ සම්මුතිය තුළ, සම්මුති පැවිද්ද තුළ පැවිදි වෙලා ඉන්නේ භික්ෂූන් වහන්සේ මේක ලොකු ව්‍යසනයක් වෙලා. මේ සූත්‍රයවත් හරියට අධ්‍යයනයක් නැති කම මෙය අධ්‍යයනය කරානම් ඔබ කියන්න යන වචන එළියට එන්නේ නෑ. දාන්නේ නෑ. එතරම්ම ලැජ්ජා හිතෙනවා. ධර්මය තුළත් කියැවෙන්නේ වයසට ගියාම වැඩිය කතා කරන්නේ නැහැනේ. බකමූණු වයස කියලානේ කියන්නේ. එතකොට රහත් වෙලාද? ඒ බකමූණු වයසට වැඩිය කතා නොකර ඉන්නේ. යමෙක් රහත් භාවයට පත්වෙනවා නම් ඒකාන්තයෙන්ම පළවෙනි කාරණාව තමයි ඒකාන්තයෙන්ම

එතන ඒහි භික්ෂුභාවයෙන් හෝ ඒ කියන්නේ පැවිද්දට එන නිකම්ම සිත සකස් වෙනවා පැවිද්දට. කවුරුත් කියන්න අවශ්‍ය නෑ. එයාට කිසිම දේක හරයක් එහෙම ගෙයක්, දොරක් මේකේ කෙලින්ම බුදුන් වහන්සේ මේ සූත්‍රය තුළ අපි දිගටම පැහැදිලි කරා ඔබට දැන් කොටස් තුනකින්. බුදුන් වහන්සේ කෙලින්ම පැහැදිලි කරනවා මේ එක විහාරී ස්වභාවය. එකලා වාසය, අල්පේච්ඡතාවය, මහිච්ඡතාවයෙන් අයින් වීම. එතකොට ඒක බත වැළඳීම. ඇත්තටම රහත් භාවයෙන් කියන්නේ රහ නැති එකට.

**අනුත්තරත්වය කියලා කියන්නේ, ඒ කියන්නේ රහ නැති වෙන එකට.** ආත්මය නැතිවෙන්න එකට. ඇත්තටම මැරුණා හා සමානයි. මැරුණ කෙනෙකුට හිතෙනවද ඔය වගේ දේවල්, නෑ නේද, මැරුණ කෙනෙකුට හිතන්න බෑ නේ. එහෙනම් ඔතනයි රහත්භාවය තියෙන්නේ. බුදුන් වහන්සේ, භික්ෂූන් වහන්සේලා ඒකයි කලහ කෝලහලය කරගන්න කොට බුදුන් වහන්සේ අන්ධ වනයට වඩිනවා. බුදුන් වහන්සේට අවශ්‍යතාවයක් නෑ ඒවා පැටලිලා දඟලන්න. බුදුන් වහන්සේ දෙන දඬුවම බලන්න. චන්න ඇමතිට දෙන දඬුවම බලන්න. චන්න ඊට පස්සේ පැවිදි වෙනවානේ. බුදුන් වහන්සේ පිරිනිවන් මංචකයේ ඉන්නකොට චන්න කියනවානේ ඊට පස්සේ ඉන්නේ චන්නනේ කියලා. චන්න කියනවානේ සතර පෙරනිමිති කියලා දුන්නේ. ඊට පස්සේ ආනන්ද හාමුදුරුවෝ ගිහිල්ලා බුදුන්වහන්සේගෙන් ඔය පිරිනිවන් මංචකයේ අහනවනේ. මහාපරිබ්‍රාන සූත්‍රයේ අපට මේවා අහුවෙනවනේ. ආනන්ද හාමුදුරුවෝ අහනවානේ, ස්වාමිනි චන්න ට කුමක් කරමුද කියලා. ඊට පස්සේ කියනවානේ ආනන්දය බ්‍රාහ්මදණ්ඩනය පනවන්න. අන්න බ්‍රාහ්ම දණ්ඩනය පනවන්න කිව්වා.

මොකක්ද මේ බ්‍රාහ්ම දණ්ඩනය. ලෝකයේ තියෙන ලොකුම දඬුවම මොකක්ද? උලතියෙන එකක්ද? නැහැ. බ්‍රාහ්මදණ්ඩනය කියලා කියන්නේ ඇත්තටම කිසිම දෙයක් අන්න උත්තර දෙන්නේ නෑ. භාෂිතයක් නෑ. කතා කරන්නේ නැහැ. අහන ප්‍රශ්ණ වලට පිළිතුරු දෙන්නේ නැහැ. අතරමං වෙනවා. ඔය බ්‍රාහ්මදණ්ඩනය පැනවුවොත් ඕනම කෙනෙක් යන එන මං නැති වෙනවා. ඒ තරම් ඒක, ඒ බ්‍රාහ්මදණ්ඩනය ඉතාම ඇත්තටම මේ සාසනයේ අපිට දකින්න ලැබෙන ඒ ඉහළම තියෙන දඬුවම තමයි බ්‍රාහ්ම දණ්ඩනය. ඒක තමයි බුද්ධ දේශනයේ තියෙන ඉහලම දඬුවම. චන්න රහත් වෙන්න කලින් චන්න බුදුන් වහන්සේ පිරිනිවන් පාන කම්ම රහත් වෙලා තිබුනේ නෑ. මාන්නයක හිටියේ. ඒ මාන්නය නැතිව වෙන්නේ ඔන්න ඔය බ්‍රාහ්ම දණ්ඩනය නිසයි. ඉතිං මේක දකින්න. බ්‍රාහ්ම දණ්ඩනය තුළත් බුදුන් වහන්සේ පනවලා තියෙන්නේ මේ ධර්මය දේශනා කරන්නේ නෑ. ධර්ම සාකච්ජා කරන්නේ නැ. අහන ප්‍රශ්ණ වලට පිලිතුරු දෙන්නේ නෑ. නිහඩතාවය ගත කරන්නේ. සියලුම භික්ෂුන් වහන්සේලා ඔහු සමග ඒ බ්‍රාහ්මදණ්ඩනය පනවලා තියෙන නිසා කතා කරන්නේ නැහැ. ධර්මය විමසුවාට ධර්මය දේශනා කරන්නේත් නෑ. එයයි බ්‍රාහ්මදණ්ඩනය කියන්නේ. එතකොට ඔබ දකින්න දැන් මේ සමාජය තුළ පිරිසිදු වෙන්න ඕන තැන රැවටෙන්න යන්න එපා. මේ අහිංසක ගිහියෝ ඔබ රැවටෙනවා. ඔබට මේ ධර්මය හරියට පිරිසිදු නැති නිසා කෙනෙක් කියන්න පුළුවන් අතීතයත් මේ මොහොතේ, අනාගතයත් මේ මොහොතේ හැබැයි, මේ මොහොතේ තියෙන සිතත් ඇත්ත නෙමෙයි.

මම දැන් ධර්මය අවබෝධ කරලා තියෙන්නේ. මම දැන් රහත් ඵලයට පත් වෙලා තියෙන්නේ කියලා ඔය ටික දැනගත්ත කියල එතන රහතෙක් වෙන්නේ නෑ. රහත් භාවයට

පස්සේ නම් මෙතන සම්පූර්ණ කෙලෙස් ක්ෂය වෙන්න ඕනේ. රාග, ද්වේශ, මෝහ කෙලෙස් සංසිඳීමක් සිද්ධ වෙන්න ඕනේ. ධර්මය අවබෝධ වුනත් ඒ සුතමය ඥානය තිබුනොත් ඒත් ප්‍රමාණවත් නෑ. මේකේ හොඳට බුදුන් වහන්සේ සතර වෝහාර ධර්මයෝ කෙසේ විය යුතුද ප්‍රශ්ණ කරන්න කියනවා. පංච උපාදානස්කන්ධයෝ කෙසේ විය යුතුද, ප්‍රශ්න කරන්න කියනවා. ඔබ හිතන්න එපා අද පොත්වල තියෙන ඒවා කිව්වා කියල ඔබ රහතෙක් කියලා. ඒවා ප්‍රායෝගික නැහැ. ප්‍රායෝගිකව නම් උපාදානස්කන්ධ වෙනම කතාවක්. ඒක මේ කිසිම පොතක දකින්න ලැබෙන්නේ නෑ. වෝහාර ධර්මයෝ වෙනම කතාවක් කිසිම පොතක දකින්න ලැබෙන්නේ නෑ. ප්‍රායෝගික පැත්ත. අපි ඒවා එළි කරේ ඒ නිසාමයි. එළි කර ගෙන යන්නේ ඒ නිසාමයි. එතකොට ඔබ දැක්කා ඊට පස්සේ බුදුන් වහන්සේ මෙතන එකලා වාසය පෙන්නුවා. ඉන්ද්‍රිය දමනය පෙන්නුවා. ඒ සෑම සිතකම බුදුන් වහන්සේ පෙන්නුවා ඒ සිතට ඒ සිතේ එන අරමුණුවලට ඇලෙන්නේ ගැටෙන්නේ නැති ස්වභාවයක අන්න පවත්වා ගැනීමයි. එතකොට රහතන් වහන්සේගේ ස්වභාවය කියලා.

එහෙනම් ඔබ හඳුනා ගන්න. එහෙනම් ඔය ඉන්ද්‍රිය සංවරය කියන තැනේදී බුදුන් වහන්සේ පෙන්වනවා ඕන ඕන කෑම කනවා නෙමෙයි, ආස හිතෙන කෑම හදාගෙන කනවා නෙමෙයි, දිව පිනවනවා නෙවෙයි, මේ පිනවීමක් පස්සේ දුවනවා නෙවෙයි. මේ ලොව්තුරු සුවය මට ඕන දෙයක් කරන්න පුළුවන් කියන එකක් නෙමෙයි. අද ගොඩාක් අද රහත් වෙලා කියන අය මේ වගේ අඥාන ක්‍රියා කරනවා. මේ අසරණ ගිහියෝ රැවටෙනවා. අද ඒ අයම කියාගන්නවා ධර්මය ඒ අයට ඕන විදිහට කොහොමද කියන්නේ වේදනා,

සංඥා, සංකාර, විඤ්ඤාණ මෙන්ම මෙහෙමයි මේක කියන්නේ. ඔන්න ඔබට අහන්න ලැබෙයි දේශනාව හොඳට විඳින්න, හොඳට කන්න, හොදට සැප විඳින්න, වේදනාව විඳින්න ඕනේ. ඊට පස්සේ ඒක දැනගන්න ඕනා. සංජානාති කියන්නේ ඒක දැනගන්න එක කියලා. හොඳට කන්න කියනවා. හොඳට ආයතන ටික පිනවන්න කියනවා. ඊට පස්සේ ඒක දැනගන්න කියනවා. සංජානාති කියන්නේ ඒක කියලා. ඒක ඊට පස්සේ අතාරින්න කියනවා. ඒකයි කියනවා මේ ඕක තමයි කියනවා නිවන් මග .

ගෞතම බුද්ධ ශාසනයේ අවසානේ තිත තියත හැකියි. අඥාන රහතන් වහන්සේලාගේ ක්‍රියාකලාපය නිසා. මේ මහා අපරාධයයක් සිද්ධ වෙනවා. ඇත්තටම කිව්වොත් සංඝා ගාථලා බවට පත්වෙනවා. ඒ සාසනය ඝාතනය කරන භික්ෂුවක් බවට පත්වෙනවා. දෙව්දත්ගේ සාසනය වගේ එකක් එතකොට හැදෙන්නේ. හැබැයි මේක එක පැත්තක් විතරයි. මේ එක පැත්තක ඉන්න රහතන් වහන්සේලා කියාග න්න දේ. ඒක අතිශය භයානකයි. මොකද ඒක හරි ලාබයි, බොළඳයි. ඒක තමයි මාකට් වෙන්නේ. ඒක මාකටින් කරන්න හදන්නේ. ඒක විකුනන්න හදන්නේ, මොකද එයා සැප විඳින්නයි. එයාගේ තියෙන චේතනාව. හොඳට බලන්නකෝ මොකක්ද යටි අරමුණ තියෙන්නේ කියලා. සැප දේට විතරයි ආයතන පිනවන එකක්. ඔතන රහතන් වහන්සේ නමක් තියා පෘතග්ජන ස්වභාවයටත් ගැලපෙන්නේ නැති අන්න මිත්‍යා දෘෂ්ටියක් තියෙනවා. රස, රස කෑම ඕන ඕන විදියට හදාගෙන කන ඒවා නිකන් ඕනම දෙයක් එයාට ඕනම දෙයක් හිතෙනවා කරන්න පුළුවන් කියලා. ඒ තරම්ම ඔතන අන්ධ වෙලා තියෙනවා. දෘෂ්ටිගත වෙලා තියෙනවා. එතන

ධර්මයක් වත් නැහැ. ඇත්තම කිව්වොත් ඔබ රැවටිලා ඉන්නේ. ඒක හරි භයානක ස්වභාවයක් ඉතිං ඒක දකින්න. මේ සිත මිස කය නැ කියපු, සිත මිස කය නැති බඹලොව කියල කියපු, අර හිත ඇතුලේන්ම මැවෙන බ්‍රාහ්ම ස්වභාවය. අර රූපාවචර ධ්‍යාන අපි කියනවා රූප සඤ්ඤා, අරූප සඤ්ඤා කියලා. රූප සංඥාවල නේ බ්‍රාහ්මලෝක කියලා කිව්වේ. ඒ අරූප සංඥාවලත් දැන් ලෝක හදාගෙන තියෙනවා. දැන් මේ නිමිත්තක් පනවන්න බැරි එකක්. නිමිත්තක් හදාගෙන. දැන් නැති එකකට රූප සංඥාව හදාගෙන. දැන් බ්‍රාහ්මයොත් රූප අඹාගෙන. දැන් මේ බ්‍රාහ්මයෝ කියලා එහෙම ඉන්න එකක් නෑ. බ්‍රාහ්මයින්ට කවදද රූප තිබ්බේ. ඒක සාමාන්‍ය ගමේ මනුස්සයත් දන්නවා. සිත මිස කය නැති බඹලොව කියලා.ඒ කට්ටිය රහතන් වහන්සේලාට වැඩිය භයානකයි. ඒ කට්ටිය ඉන්නේ මග ඵල දෙන අය. ඒ කියන්නේ සියල්ල දත්. මේ ඇවිල්ලා දෙව්දත්ගේ නියමම නූතනයේ දෙව්දත්ලා. මේගොල්ලෝ හඳුන්වා ගන්න. මේ ජබ්බි සෝධන සූත්‍රය බුදුන් වහන්සේ කරන්නේ පිරිසුදු කරන එක. බුදුන් වහන්සේ මේ බොරු මගඵල ලාභීන් පෙන්නලා දෙන එක කරන්නේ. මේ අයගේ මෙන්න මේ දේවල් නැත්නම් මොවුන් රහතන් වහන්සේලා නෙමෙයි කියන එක කියන්නේ. මේක ඇතුලේ සියල්ලම කියැවෙනවා. කෙසේද සැබෑම රහතන් වහන්සේලා නමක් කියන එක මේකෙන් මතුවෙනවා. මේ ධර්මය දකින කෙනාට පේන්න ගන්නවා. පොඩි යම්කිසි නුවණනක් තියෙනවනම් මේක ඇස් ඇරලා බලන්න. ගිහිවතේ රහතන් වහන්සේ නමක් නැති බව ඔබට තේරෙයි.

එතකොට අද වෛද්‍යවරු අරහත්ත කියලා කියාගන්න ඔක්කොම බොරු බව තේරෙයි. ඒ මතක තියාගන්න. ඒ

ගිහි වතේ ඇත්තටම රහත් කෙනෙක් නෑ. එතෙන්ටම ඔබ දකින්න. මේ යුගය නැත්නම් පිරිසිඳු වෙන්නේ නෑ. මේකෙ අපිට මෙහෙම කියන්න අද සිද්ධ වෙලා තියෙනවා මේ ධර්මය තුළ කොහේ වත් හම්බ වෙන්නේ නෑ. ඔබ අහයි ඇයි එහෙනම් දාරුචීරිය ගිහිවතේ නේ. ඇයි රහත් නේ. දාරුචීරිය රහත් වෙලා ගිහි වතේ හිටියද යමෙකුට මේ රහත් බවට පත් වෙනකම් විතරයි. ඇත්තටම ගිහි වතේ රැඳෙන්න බෑ. ඒකට හේතුව එහෙම රැඳෙන්නෙත් නෑ. එතන කෙනෙක් නැති බව අවබෝධ වෙනකොට ඉඳිද? ඉන්නේ නෑ. ඕක තමයි ඇත්ත කතාව. ඇයි මෙහෙම රජකෙනෙක් හිටියේ. රජ්ජුරුවෝ ඊට පස්සේ හිටියේ නෑ. පැවිදි වෙනවා. පැවිදි වෙන එක ස්වභාවයෙන්ම සිද්ධ වෙනවා. ඒක හිතුව නොහිතුව එක හිතන දේකුත් නෙමෙයි සිද්ධ වෙනවා. ඒක ඔබට වැටහෙයි ධර්මය හොඳට බැලුවොත් වැටහෙයි. එතනින් එහාට පවතින්නේ නෑ. එතන රහතන් වහන්සේ ගාව සුදුසුත් නෑ, වෙන්නේත් නෑ. පවතින්නේත් නෑ. එතනින් ඔබ සම්පූර්ණයෙන්ම සුද්ද වෙලා තියෙන්නේ. ඔබ අරහත්ත ඔය කියන ඒවා ඔක්කොම ඉවරයි. ඒවා සේරම බොරු කතා. එතකොට ඔබට තේරෙන්වා මේ පිනවන ඒවා වෙන්නෙත් නෑ. ඒකත් මේ. මේක පරිශුද්ධව බුදුන් වහන්සේ සුද්ද කරනවා. මේ ජබ්බි සෝධන සූත්‍රය තුළ පාරිශුද්ධව සුද්ද කරනවා මේක. මේ ප්‍රශ්ණය සම්පූර්ණම මේ සූත්‍රය බැලුවහම විසඳිලා යනවා. කිසිම කෙනෙකුට ඉඩක් හම්බු වෙන්නේ නෑ. ඉන් එහාට කතා කරන්න. ඒ වෙනුවෙන් තමයි අපි මේ දේශනා මාලාවම දියත් කරන්න හිතුවේ. මේක සමාජයට වැදගත්. මේ සමාජයේ සත්‍යය අවදි වෙන්න ඕනා. මේ සමාජය සත්‍ය දැනගන්න ඕනා. හැබැයි මේ හැමෝටම පුළුවන් අර භාහිය තාපසතුමා කළා වගේ. භාහිය තාපසතුමා බොරුවට රහත් කියපු කෙනෙක්. භාහිය

තාපසතුමා ඔබ දන්නවා ලී කෑලි ටිකක් ඇඳගෙන ඒක නාවික කතාවක්. භාහිය තාපසතුමා අනතුරකින් ඊට පස්සේ ගොඩ බැහැලා සුකා පටුන කියලා එතනින් ගොඩබැහැලා ඊට පස්සේ ඔය දර කෑලි ටිකකින් ශරීරය වහගෙන ඉන්න කොට මිනිස්සු හිතනවා රහත් වෙලයි කියලා. රහතන් වහන්සේ නමක් කියලා. ඊට පස්සේ මිනිස්සු දානය ගේනවා, පිරිකර අරන් එනවා. ඊට පස්සේ ආහාරයක් වත් නෑනේ ගන්නනේ. මේවා මෙයාට දැන් ගොඩක් භෝජන. එතකොට හිතෙනවා ඇත්තටම රහත් වෙන්න. ඊට පස්සේ ඒක බලනවා. ඒක හරියන්නේ නෑ. ඊට පස්සේ එයාට දැනගන්න ලැබෙනවා මෙහෙම ගෞතම බුදුන් වහන්සේ දේශනා කරනවා කියලා රහත් භාවයට පත්වෙන ආකාරය. ඊට පස්සේ බුදුන් වහන්සේ බැහැ දකින්න එනවා. සුක්කා පටුනේ ඉඳලා හැතැප්ම ගානක් ගෙවාගෙන. ඔය එන ගමන තුළ තමයි ලොකු උත්සාහයක් යෙදුණු තපස් වරයෙක් විදිහට රහත්භාවයට පත් වන්නේ නැති නිසා තමයි මේ කටයුත්තට එන්නේ. අන්න එතකොට තමයි භාහිය තාපසතුමා මුණගැහෙන්නේ ඔය පිණ්ඩපාත වඩින මොහොතේ. එතකොට තමයි භාහිය තාපසතුමා ඔය ධර්මය දේශනා කරන්න කියලා ඉල්ලා සිටින්නේ . අන්න ඒ එතනදී තමයි.

**දිට්ඨේ දිට්ඨ මත්තං, සුතේ සුත මත්තං,**

**දිට්ඨේ දිට්ඨ මත්තං භවිස්සති, සුතේ සුත මත්තං භවිස්සති, මුතේ මුත මත්තං භවිස්සති, විඤ්ඤාතේ විඤ්ඤාණ මත්තං භවිස්සති**

භාහිය කියලා කියන්නේ. ඕක තමයි අපිට මේ ධර්මය තුළ ඇහෙන කෙටිම ඇත්තටම මේ නිවන් මඟ පැහැදිලි

කරන කෙටිම දේශනය. තුන් වතාවක්ම බුදුන් වහන්සේ එය බැහැර කරනවා. මේ පිණ්ඩපාත වඩින මොහොතයි. භාහිය මේ මොහොතේ ධර්මය දේශනා කරන්න සුදුසු නෑ කියලා පසුව නැවතත් ඉල්ලා සිටින කොට බුදුන් වහන්සේ ධර්මය අර කෙටියෙන් දේශනා කරනවා. දේශනා කරලා පිණ්ඩපාතේ වඩිනවා. හැබැයි, ඒ ගමන තුළ ගොනා ඇනලා මැරුණ කියලා ධර්මයේ සඳහන් වෙනවා. රහත් භාවය තුළ පවතින් නැති බවයි ඒකට හේතුව. ඒක හැම තැනම වගේ ඔබට දක්නට ලැබෙයි. ගිහි වතේ පවතින්නේ නැහැ ඒකයි ඇත්ත. ඇත්තටම ඔබට මේ ධර්මය හොඳට අවබෝධයක් ඇති වුනොත් මේක හිතලා කරන එකක් නෙමෙයි. ඒක සිද්ධ වෙන්නේත් නැති බව දැනෙනවා. සිද්ධ වෙන්නේත් නෑ. ඔබේ අභ්‍යන්තරයේම පරිවර්තනයක් සිද්ධ වෙනවා. ඇත්තටම ඔබ එතන ගිහියෙක් නෙමෙයි. ඔබ එතන ගිහියෙක් විදිහට ඔබට රැඳෙන්නත් බෑ. ගිහියෙක් වෙන්නේත් නැහැ. ඒක බුදුන් වහන්සේ දේශනා කරන විදිහට ඒහි භික්ෂු භාවයෙන් පැවිදි භික්ෂු වෙනවා හා සමානයි. ධර්මය හොඳින් පිරිසුදු වෙලා අවබෝධ වෙලා අර සියල්ලම අවබෝධක්ඥානය තුළ කෙලෙස් සංසිඳීලා. එනකොට ඔබගේ එනවා භික්ෂුත්වයක් .ඒ භික්ෂුත්වය ඒ උපසම්පදාව ඔබ තුළින්ම සකස් වෙනවා. අපි ඒ උපසම්පදාව සකස් වෙන ආකාරය අධ්‍යාත්මිකව ඒ උපසම්පදාව කෙසේ විය යුතුද කියන එක කිව්වා. එය චාරිත්‍රයක් නොවන බව කිව්වා. එය අභ්‍යන්තරයෙන්ම අධ්‍යාත්මිකවම සිදුවන බව කිව්වා ඔබට ඒක

**සබ්බ පාපස්ස අකරණං**
**කුසලස්ස උපසම්පදා**

කියල කියනවා නේ. අන්න ඒ කුසලස්ස උපසම්පදාව සිද්ධ වෙන අන්න එයයි සැබෑම උපසම්පදාව සිද්ධ වෙන ආකාරය. එයයි,

**සමුදයංච අත්ත ගමයංච**
**ආස්වාදයංච ආදීනවයංච නිස්සරණං ච.**

හැබැයි, මේකෙදිත් කියනවා, ආ මේ ආස්වාදය විඳිනවානේ. අන්න ආදීනව දකින්නවනේ. ආ අන්න නිස්සාරණය දකිනවනේ. අන්න ඕක තමයි නිවන් මඟ කියනවා. මේ අඥාන බොළඳ බාල මේ විදිහට ධර්මය ඇත්තටම ගන්න එපා. ඒ පිරිහිම අද ඔබට ප්‍රසිද්ධියේම දකින්න ලැබෙයි. ඔය රහතන් වහන්සේලා බුදු සමයේවත් ඔය වගේ දේවල් නෑ කියලා ඒ තරම් පිරිහීමක් ඒක. ඒ රහතන් වහන්සේලා නෙවෙයි

**ආශ්වාදයංච, ආදිනව යංච, නිස්සරණංච.**

කියන්නේ

**"අස්ත ගමයංත සමුදයංත"**

දකින තැනයි. ඒ කියන්නේ සිතට එන අරමුණේ සත්‍යය දකින තැන. ඒ සත්‍ය දැක්කොත් විතරයි මෙතන දෙයක් නැති බව. බාහිරෙන් අන්න දකින්න ඕනේ. එහෙනම් සිතෙත් දෙයක් නැති බව දකින්න ඕනෙ. එහෙනම් එයාට අනිමිත්ත, ශූන්‍යත, අප්‍රනීත විමුක්තිය පේන්න ඕනා. අන්න ඒකයි ආදීනව දකිනවා කියන්නේ. ඒ දකිනවා මෙතන දෙයක් කියලා ගත්තොත් එතන තණ්හාව. තෘෂ්ණාව දකින එකයි ආශ්වාදය දකිනවා කියන්නේ. එහෙම සත්‍යය දන්න යථාභූත ඥානය තියෙනවා නම් විතරයි. සත්‍ය ඥානය තියෙනවා නම් විතරයි එයා අන්න ආදීනව දකින්න තියෙන්නේ. ඒක ආදීනවානු

පස්සානාව තුළ හම්බ වෙනවා. ඒක අපිට හම්බ වෙනවා ඔය

**උදය වැය ඤාන, භය ඤාන, භයතු පට්ටාන ඤාන, ආදීනවානු පස්සානා ඤන, කියන තැන.**

**මුඤ්චිතුකම්‍යතා ඤාන** කියන තැන. ඊගාව එක එනවා. අන්න එහෙම වුනොත් තමයි අන්න

**ආස්වාදයංච, ආදීනවංච, නිස්සරණයංච**

කියන එක සිද්ධ වෙන්නේ.

ඔබ සත්‍ය දැනගන්න. ඔබ සත්‍යයට අවදි වන්න. ඉතින් මේ තරම් උතුම් ධර්මයක් මෙලොව පරම සත්‍ය ඔබට ඕන විදිහට නමන්න බෑ.

බුදුන් වහන්සේගේ භවය චුට්ටක්වත් පතන් නැති බව හරියට මේ ධර්මය යම්තම් හරි අධ්‍යයනය කළොත් කෙනෙකුට තේරෙනවා. එහෙමනම් බෞද්ධයෙක් වෙන්නෙත් නැහැ. මෙතන බෞද්ධයෙක් ඇත්තෙත් නෑ. මෙය කියපු කිසිම තැනක බෞද්ධ භාවයවත් රැකෙන්නේ නෑ. බෞද්ධ කියන්නේ දෙයක් නැති බව දකින එකයි. දෙයක් නැති බව දකින තැන ඔහොම දේවල් සිද්ධ වෙන්නේ නෑ. ඉතින් ඒක දකින්නත් මේ අඩුගානේ මේ සූත්‍රය තුළ තියෙන කාරණා ටිකවත් වැටහීමක් තියෙන්න ඕනේ.

එතකොට උපාදානස්කන්ධය දකිනවා වගේම ඊට **පස්සේ බුදුන්වහන්සේ මේ නිමිත්ත අනිමිත්ත දකින ආකාරය රහතන් වහන්සේගෙන් ප්‍රශ්ණ කරන්න කියනවා.** මෙතන නිමිත්තක් බැස ගන්නැති බව. එතකොට ඒකයි මෙතන අනිමිත්ත සමාධියක් වෙන්නේ. යථාභූත ඤානය තියෙන කෙනෙකුට

විතරයි මෙතන දෙයක් නැති බව දැක්කොත් විතරයි අන්න අනිදස්සන විඤ්ඤාණය කියන එක හමුවන්නේ. අන්න එහෙම වුනොත් තමයි අනිමිත්ත සමාධිය හමුවන්නේ දෙයක් නැති බව දකිනවා. එහෙම වුනොත් දකින කෙනෙකුත් නැති වෙනවා. අන්න කෙනෙක් නැති වෙන එක තමයි අරහත්වයට මග තියෙන්නේ. ඒ තුළ පිනවීම් නෑ. ඔය කියන විදිහට. හැබැයි මහා ශාන්ත සුවයක් දැනෙනවා. ඒ සුවය දැනෙන්නේ නිස්සරණය තුළින් සිතින් මිදීම තුළයි. එහෙම නැතුව අර කෑම කාලා පිනවන සුවයක් නෙමෙයි මේ කියන්නේ. මේ රහතන් වහන්සේගේ ස්වභාවයයි. ඒ අරහත්වයට යන ස්වභාවයයි. ඒ අනිමිත්ත සමාධිය ගැනයි මේ කතා කරන්නේ. **එතකොට බුදුන් වහන්සේ සය ධාතු ගැන මෙනෙහි කරන්න කියන්නේ. සයධාතු ගැන ප්‍රශ්ණ කරන්න කියන්නේ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ. ඒ පඨවි, ආපෝ, තේජෝ, වායෝ ආකාශ ධාතුවත්, විඥාන ධාතුවත් ගැන කතා කරන්නේ.** මේ අනිමිත්ත සමාධියට යන පාරේ මේක හමු වෙනවා. අපිට මේ පඨවි කියන්නේ අපි මේ ඝන සංඥ වලටමයි. ඒ ගේ සිත සෝමනස්ස, දෝමනස්ස, උපේක්ෂාව ගේය සිත මෙන්න මේ නෙක්ඛම්ම සිතට එනවා. **ගිහි අපි මේ ඇස, කන, දිව, නාසය, පිනවීම කියන කම් සැප පිනවීමෙන් අයින්ට වු තැන නෙක්ඛම්ම සිත ඇතිවෙනවා.** අන්න එතනයි කතා කරන්නේ. මේ පටිඝ සංඥාවලින් මිදෙන බව. එතනයි මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන මෙන්න මේ සය ධාතු ගැන කතාව වැදගත් වෙන්නේ. පඨවි ධාතුවෙන් මිදෙනවා කියන එක. ආපෝ ධාතුවෙන් මිදෙනවා. පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතුවෙන් මිදිලා, ආකාශ ධාතුවෙන් මිදිලා ඒ යන විඥාන ධාතුව අර ආකාසඤ්ඤායතනය, නේවසඤ්ඤා, නා සඤ්ඤායතන. එතන අර ආසඤ්ඤා තලයට යන කතාවයි

මේ කියන්නේ. ඒ කියන්නේ කොහෙවත් තියෙන ආසඤ්ඤා තලයක් එහෙම එකක් නෙමෙයි. මේ සිත තුලම මේ සඤ්ඤාව නොදැනෙන ස්වභාවයට යන ගමනයි මේ පෙන්වන්නේ. මේකයි සය ධාතු වල ඔබට අවසාන වශයෙන් එන එක. ඒ ධර්මාවබෝධයෙන් තමයි ඒ ටික දකින්න ලැබෙන්නේ. ඒක මහා ගැඹුරු තැනකින් පෙන්නුවේ. ඒක තාම ඔබ දකින්න නැති වෙන්න පුළුවන්. කලබල වෙන්න එපා. එතනයි. ඒ තැන. ඒ රහතන් වහන්සේගේ ස්වභාවයට එන්නේ. ඒ තැන දැකලයි. ඒ වගේම තමයි ඔබ දකින්න බුදුන් වහන්සේ මේ දිගටම කරන ප්‍රශ්ණ කිරීම් වල බුදුන්වහන්සේ ඒ දිගටම ප්‍රශ්ණ කරගෙන යන වාක්‍ය ටික ඔබට කියාගෙන යනකොට දැනෙයි ඔබගේ මේ සියලුම දේ ඔබ මේ ඇලුම්කරන භව, බෝග පවා අත්හරිනවා. ඒ භවබෝග පවා තියෙන රන්, රිදී, මුතු, මැණික් ඒ කිසිම දේකට ඔබගේ තියාගන්නවත් අදහසක් පහළ වෙන්නේ නැති බව. මේව ටික හොඳින් බැලුවොත් විකාල භෝජන, එතකොට රන්, රිදී, මුතු, මැණික් මේවා වත් තියාගන්න නැති, භවබෝග රැස් කරන්නේ නැති, තමන්ගේ කියලා දෙයක් නැති මෙන්න මේ ස්වභාවයට ගිලිහෙන තැන ගිහිවතේ කුමට නම් වැඩ සිටිත් ද ? තේරෙනවද කියන එක. අන්න එතනයි නික්මීම තියෙන්නේ. ගිහිවතෙන් නික්මෙන බවක් මෙතන ධර්මය තුළ බුදුන් වහන්සේ ම දේශනා කරනවා බුද්ධ වචනයෙන්ම ගිහිවතේ පවතින්නේ නැති බව. අජාසත්ත රජ්ජුරුවෝ දේව්දත්තට විශාල අසපු හැදුවා. ආරණ්‍ය හැදුවා. රාජ්‍ය අනුග්‍රහයත් තිබුනා. සිවුරක් පූජාකරන්න යන කොට කඨින චීවරේ පූජා කරන්න ඡන්දය ඉල්ලුවාහම මිනිසුන් ඡන්දය දුන්නේ දේව්දත්තට. අදත්, එහෙමයි. අද ඔබගෙන් ඡන්දයක් ඉල්ලුවොත් ඔබ දෙන්නේත් දෙව්දත්ට.

පිරිසිදු ශූන්‍යත පටිසංයුක්ත දේශනාවක් අහන්න. මේ සසර දුකින් මිදෙන දේශනාවක් අහන්න. ඔය දිව්‍ය ලෝකයක් ගැන කතාවක් ඔලුවේ ගහගෙන නිකන් මේක අර අනිත් ආගම් වල තමා බෝඩ් ලෑල්ලක් එල්ලන්නේ නිවන් මග තියෙන මෙවැනි දහමක් කොහේවත් නැහැ. මේක මේ නිවන් මගක් දේශනා කරන දහමක්. ලෝකේ කොහේ හරි තියෙනවද? මේ අසරණ සිංහල බෞද්ධයාට මොකක්ද ඇත්තටම අද වෙලා තියෙන්නේ මෙන්න මේ ව්‍යසනය නිසා තමයි. අනිත් හැම ආගමකින්ම තියන සේරම ගොඩ ගහලා මේකට මේ කුණු ගොඩ වගේ සුද්ද කරලා දාන්න සේරම. සිංහල බෞද්ධයාට තියෙන්නේ මහ මුහුද විතරයි වටේට ඉතුරු වෙලා.

ඔබේ මිත්‍යා දෘෂ්ටිය තුළයි ඔබ මේ හිරවෙලා මේ ඉන්නේ. සත්‍යයට අවදි වෙලා එන්න. එතනින් පිරිසිදු වෙන්න. එතකොට මේ කියන සේරම දේවල් පිරිසිදු වෙනවා. එතකොට මේ ධර්මය තුළ මේ ජබ්බි සෝධන සූත්‍රය තුළ මේ පෙන්නන කාරණා ඔබට හොඳින් දකින්න ලැබෙන්නේ. එතකොට **මේ හතරවැනි දේශනය තුළ බුදුන් වහන්සේ අවසාන වශයෙන් පෙන්නන කාර්ණාව ඉතාම වැදගත්. මේ පංච නීවරණ යටපත් කරනවා කියන කාරණාව.** අපි මේවා පැහැදිලි කරා ඔබට ඒ නීවරණ සංසිදෙන ආකාරය මේ රහතන් වහන්සේට පැහැදිලි කිරීමේ හැකියාවක් තියෙන්න ඕනා. පංච උපාදානස්කන්ධයෙන් මිදෙන ආකාරය රහතන්වහන්සේට පැහැදිලි කිරිමේ හැකියාවක් තියෙන්න ඕනා. එතකොට මේ නිමිත්ත, අනිමිත්ත වන ආකාරය, ශූන්‍යත වන ආකාරය, ඒ ස්වභාවය රහතන්වහන්සේට පැහැදිලි කිරීමේ හැකියාවක් තියෙන්නේ ඕනා.

ඒ මේ කියන දේවල් ප්‍රායෝගිකව මේ පොතක තියෙන වාක්‍යක් කියෝනවා නෙමෙයි. දැනුමක් නෙමෙයි. ප්‍රායෝගික අත්දැකීමක් ප්‍රකාශ කළ යුතු වෙනවා. සියලු කෙලෙස් සංසිඳුණු ස්වභාවය ප්‍රායෝගිකව ඔබට එළි කරන්න බැරිනම් ඔබත් රහතේක්ද නෑ. ඔබ කරන්නේ රැවටීමක්. දකින්න චතුරාර්ය සත්‍ය දේශනයේ බුදුන් වහන්සේ පෙන්වනවා මේ චතුරාර්ය සත්‍යය දේශනයක් හරියට කරන්න බෑ මහෝප දේශනා හතරට ගලපලා ධර්මයක් දේශනා කරන්න බෑ. ඒ මහෝප දේශනා සූත්‍ර අපි දේශනා කරා. ඔබට ඇහෙන්න ඇති. ඒ මහෝප දේශනා සූත්‍රය තුළ කුමක්ද ධර්මය, කුමක්ද විනය, කුමක්ද සාසනය කියන එක ඒ තුනම සිතකින් දකින ආකාරය **ඒ ධර්මය කියන්නේ කුමක්ද? දෙයක් නැති බව. විනය කියන්නේ කුමක්ද?ඒ එන අරමුණ දැකලා මිදෙන තැන. එතන ආත්මයක් නෑ. සත්වයෙක් නෑ. පුද්ගලයෙක් නෑ. නාමයක් නෑ. රූපයක් නෑ. ඒ බවට පත්වීම වෙනයි. ඒ බව සිතීම වෙනයි. සිතීම කියන්නේ රහත් භාවයක් නෙමෙයි.** ඒ පෝට්ඨිල භික්ෂුව ඒ තුච්ඡයි කියලා බුදුන් වහන්සේ පහත් කොට සලකපු එක. දැනුමෙන් රහත් වෙන්නේ නෑ කවුරුත්. ඒ බවට පත්වුණා කියන්නේ ඔබ සුළඟ වගේ ඉන්නේ. එහෙමනම් හුදකලාවකයි. ඔබ ගාව ඔය විච්චුර්න වැඩ සේරම නවතිනවා. **මේ බුදුන් වහන්සේ අවසාන වශයෙන් පෙන්නන කාරණාව තමයි මේ මහෝපදේශ හතරට ගළපලා මේ ධර්මය රහතන් වහන්සේ ප්‍රකාශ කරන එක, ප්‍රශ්ණ කරන්න කියලා කියනවා.** භික්ෂුවක් රහත් භාවය ප්‍රකාශ කරනවා නම් මෙන්න මේ විදිහට ප්‍රශ්ණ කරන්න කියලා මේ සූත්‍රය තුළ ඔබට දකින්න ලැබෙයි. ප්‍රකාශ කරනවා. **ඒ තුළ චතුරාර්ය සත්‍යය කුමක්ද, දුක්ඛ සත්‍යය කුමක්ද, සමුදය සත්‍යය කුමක්ද, නිරෝධ සත්‍යය කුමක්ද, මාර්ග සත්‍යය කුමක්ද කොයි ආකාරයකටද**

ඒ දේ සිද්ධ වෙන්නේ ඒ යමෙකුට දේශනා කරන කොට යමෙක් ඒ දේ අහලා ඒ දේ ඒ අයට ප්‍රත්‍යක්ෂ නම් එයාට ඒක සිද්ධ වෙනවා නම් අන්න ඔබත් රහතන් වහන්සේ නමක්. ඇයි ඒ ඒක ප්‍රත්‍යක්ෂතාවයෙන් ඔබට තියෙනවා ඉදිරිපත් කරන්න සාධක. මෙන්න ප්‍රත්‍යක්ෂ වෙනවා මෙයයි ධර්මය. මෙයයි විනය, මෙයයි සාසනය කියලා. කාටවත් ඒක දේශනා කරලා කවුරුත් එය ප්‍රත්‍යක්ෂ තාවයට පත්වන්නේ නැත්නම් ඒ රහතෙක් ගෙන් අපිට වැඩක් නෑ. එ කියන්නේ රහතන් වහන්සේ නමක් නම් ඒ කරන දේශනාව තුළ ඇත ඒ මඟ ගමන් කරලා අනිත් අයත් රහත් බවට පත් වෙන්න ඕනා.

ඔබට මගක් කියන්න බැරිනම්, මේ ඔබ මඟ ගිහිල්ලා කවුරුත් රහත් භාවයට පත් වෙන්නේ නැත්නම්, කෙලෙස් සංසිදෙන්නේ නැත්නම් අපි මේ අසරණ බෞද්ධ ඒ අසරණයිගෙන් අපි මේ බෞද්ධ සමාජයෙන් ඉල්ලනවා යන්න එපා එවැනි අය ගාව, ඔබ අමාරුවේ වැටෙනවා පමණයි. ඔබට කිසිම පිළිසරණක් නෑ. ඔබේ දුකින් මිදිමකුත් සිද්ධ වෙන්නේ නෑ. ඔබේ දුක මිදෙන් නැත්නම් ඒ මග අපට පලක් නෑ. දැන් ඔබට තේරෙනවා කියපු දේ. ඔබ රහතන් වහන්සේ නමක් කියලා කටින් කියන්න අවශ්‍ය නෑ. ඔබ යන මාවත පෙන්නන්න. ඒ ලිපිනය මාවත ලෝකෙට හෙළි කරන්න. ඒ මඟ යන කොට අන්න හැමෝම තේරුම් ගන්නවා ඔබත් සැබෑම රහතන් වහන්සේලා නමක් කියලා. එච්චරයි වෙන්න තියෙන්නේ. ඒක හරිම සරලයි මේ යුගයේ. බුදුන් වහන්සේ පෙන්වන කාරණාවල ඕකයි ගැබ්වෙලා තියෙන්නේ. අවසාන වශයෙන් අපි ඔබට කියන්න තිබුණු කාරණයත් ඒකමයි. සෑම යථාර්ථයක් වෙන්නේ අන්න එදාටයි. එතකම්ම ඔබ බොරුකාරයෙක් වේවි. මග යන අය අමාරුවේ වැටේවි.

අන්තිමට මේ රටටම ව්‍යසනයක් වුනා වගේ අන්තිමටම මුළු ධර්මයම අපිට මේ නිවන් මග යන ඒ මගත් අපිට ඔබ මග පටලෝලා අහිමි කරාවී. භාහිය තාපසතුමාටත් වැරදුනා. භාහිය තාපසතුමා බුදුන් වහන්සේ බැහැ දැකලා සැබෑම රහත් භාවයට පත්වෙන හැටි අන්න දැනගෙන ඒ මග කටයුතු කරා නේද අන්න රහත් භාවයට පත් වුණා

එක රහතන් වහන්සේ නමක් බීලා රහත් වුණා කියනවා. නෑ. බීල ධර්මය අසල බීලා හිටපු මොහොතක තමයි ධර්මය ශ්‍රවණය කරේ. නමුත් ඒ මොහොතේ සිහිය තිබුණ නිසා ධර්මය වැටහුනා. ඊට පස්සේ රහත් භාවයට පත් වෙලා උන්වහන්සේ කවදවත් බීලා නැහැ. සරකානිනේ. සරකානි අපට හම්බ වෙනවා නේද. මේ සරකානි කියලා ධර්මය තුළ හම්බ වෙනවා. භික්ෂූන් වහන්සේ බීලා ධර්මය ශ්‍රවණය කරනවා. හැබැයි එතකොට ඉන්නේ බීලා. ඊට පස්සේ මේ නුවණ තියෙන හින්දා මේ ධර්මය වැටහෙනවා. ඊට පස්සේ රහත් භාවයට පත් වෙනවා. ඊට පස්සේ සරකානි බොන්නේ නැහැ. රහත් වෙලා බීලා හිටියා කියලා කොහේවත් නෑ. මේ කියන විදිහට ඔබට දකින්න ලැබෙයි රහතන් වහන්සේගේ ස්වභාවය තුල මේ අල්පේච්ඡතාවය. ආයතන පිනවන්නේ නැති ස්වභාවය. ඒ ආයතන වල ඒ පිනවන ස්වභාවය මේකෙ හොඳටම තියෙනවා. ආයතන පිනවීමේ ඇත් වෙනවා කියන්නේ මොකක්ද කියලා. ඔබ හිතන විදිහට ඒවා කියන්න ගියාට හරියන්නෑ. **ඔබම පිරිහිලා ඔබම විනාශ වෙනවා හරියට නිකන් උන්වහන්සේ විනාශ වුණා වගේ. අපිට ඒක දකින්න ලැබුණා නේද?**

තමන් ඒ සත්‍ය මාවත හඳුනාගන්න. සත්‍ය මාවත හඳුනාගෙන ඒ මාවතේ කටයුතු කරන්න. නැත්තම් ඔබ ඒ

ව්‍යසනයෙන් බේරා ගන්න කාටවත් බෑ. ඒක ඔබ අසරණ නිසයි ප්‍රකාශ කරේ. ඉතිං මෙන්න මෙය දකින්න මහා නුවණින්. එතකොට **විමුක්ති ඥාණං** කියලා කියන්නේ. මේ හැමදේකින්ම මිදුන තැනයි. **ආශ්‍රව නිරෝධගාමිණී පටිපදාවේ ඉන්නවානම් පමණයි මේ විමුක්ති ඥාණං කියන එක ඇත්තටම සිදුවෙන්නේ.** නැතුව විමුක්ති ඥාණං කියන එකක් සිද්ධ වෙන්නේ නෑ. එතකොට ඔබ ඒ අන්තිමටම බුදුන් වහන්සේ පැහැදිලි කරන ඒ කොටස් ටික දකිනවා නම්.

"සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ"

එතකොට බුදුන් වහන්සේ දේශනා කරනවා

**සො ඉදං දුක්ඛන්ති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං; ඉමෙ ආසවාති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං. තස්ස මෙ එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චිත්ථ, භවාසවාපි චිත්තං විමුච්චිත්ථ, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චිත්ථ විමුත්තස්මිං විමුත්තමිති ඤාණං අහොසි. ඛීණා ජාති, වුසිතං බ්‍රාහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසිං. එවං ඛො මෙ, ආවුසො, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහංකාරම මංකාරමානානුසයා සමූහතා''ති.**

එතකොට

**ඛීණා ජාති, වුසිතං බ්‍රාහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසිං. එවං ඛො මෙ, ආවුසො, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහංකාරම මංකාර මානානුසයා සමූහතා''ති**

ඒ කියන්නේ අහිංකාර, මමිංකාර මාන අනුසය නසනා ලද යැයි කියනු ලැබේ. ඇවැත්නි, මෙසේ දන්නා වූ, මෙසේ දක්නා වූ, මා විසින් මේ සවිඥානකක කයෙහිද බැහැර හැම නිමිත්තේද බැහැර ඒ අහිංකාර, මමිංකාර මානානුශයෝ නසන්නා ලද යැයි සිය ස්වයංභූ ඥානයෙන්ම අවබෝධ කර ගනි. එතකොට නසන්නා ලද යැයි පරිවර්තනයේ සඳහන් වෙනවා. මේ පැහැදිලි කරන කාරණාව ඔබටත් වැටහේවි.

එතකොට මේ ආශ්‍රව කෙලෙස් තියෙනකම් මෙය සිද්ධ වෙන්නේ නැති බව ආශ්‍රව කෙලෙස් සංසිඳුණ තැන ඒ ස්වභාවයට පත්වන ආකාරයත්, විමුක්ති ඤාණයට පත්වන ආකාරයත් මේ තුළම ඔබට අසන්නට ලැබුණා. එතකොට මේ ආශ්‍රව සමුදයයි. මේ යථාභූතව දනී. මේ ආශ්‍රව නිරෝධයයි. යථාභූතව දනිමි. මේ ආශ්‍රව නිරෝධ නිරෝධ ගාමිණී පටිපටිපදාවයයි, යථාභූතව දනිමි. මෙසේ දන්නා වූ, මෙසේ දක්නා වූ, මාගේ සිත කාමාශ්‍රවයෙනුත් මිඳුනේය. භවාශ්‍රවයෙනුත් මිඳුනේය. ඒ අවිද්‍යාශ්‍රවයෙනුත් මිදුනේ යයි අන්න විමුක්ති කල්හි විමුක්ති ඤාණයයි. අන්න ඒ ඤාණයට හසුවෙනවා. ඒ විමුක්ති කල්හි ඒ විමුක්ත යන ඥානයට හසු වේ.

එතකොට

**"ඛීණා ජාති, වුසිතං බ්‍රාහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති**

**"කතං කරණීයං"කිව්වේ අන්න ඒ නිසයි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචාරය වසන ලදී. ඒ සිව්මග කතකරණීය කරන ලදී. මේ රහත් ඵලය සඳහා කළ යුතු අන් කිසිවක් නැතැයි දනිති.** ඇවැත්නි, මෙසේ දන්නා වූ, මෙසේ දක්නා වූ මා විසින් මේ සවිඥානක කයෙහිදු බැහැර හැම නිමිත්තේදු ඒ කියන්නේ සිතට එන හැම නිමිත්තක්ම ඒ දැකලා බැහැරවයි මේ දේ එතකොට මේ ස්වභාවයට පත්වෙනවා කියලා කියන්නේ. එතකොට ඔබට මේ නිමිති තවදුරටත් ප්‍රකට වෙලා ඇත්තටම කිව්වොත් මේ හොඳටම ඔබ දකින්න අපි දන්නවා මේ සුගතියට වැටෙන අය මේ ධර්මය හොඳින් පිරිසුදු කර ගත්ත අයට මේ ගැටළුව නෑ. නමුත් මේ හිරවෙලා ඉන්න විශාල පිරිසක් ඉන්නවා. ඔවුන් විශාල විදිහට රැවටිලා ඉන්නවා. ඔවුන් හිතනවා මේ බහුජන හිතාය, බහුජන සුඛාය කියල බුදුන් වහන්සේ කිව්වේ මිනිස්සුන්ට හොඳට කාලා බීල රැකියාවල් කරගෙන ඉන්න කියන එකයි කියලා. එහෙම දෙයක් නෙමෙයි බුදුන් වහන්සේ දේශනා කරේ. බුදුන් වහන්සේ රහතන් වහන්සේලාට බහුජන හිතාය, බහුජන සුඛාය කියලා වදාළේ කුමක්ද? මේ සත්වයා දුකෙන් මුදවන්නයි. මේ සත්වයා දුකට වැටිලා තියෙන්නේ මේ සියල්ලම බාහිර ඇත්ත කරගත්ත නිසයි. මේ සියල්ලම බාහිර තියෙනවා කියලා හිතා ගෙනයි මේ අය දුක් විඳින්නේ. එයා නිසයි මට දුක. ඒක නිසයි මං දුක් විඳින්නේ.ඒක මම හොරකම් කරලා හරි ගන්න ඕනි. මම එයාව පරාජය කරල හරි මම ලොක්කෙක් වෙන්න ඕනා. එතකොට මොකද වෙන්නේ. එයා දුකට වැටෙනවා. අන්න

එකෙන් මුදවන්නේ කොහොමද? අන්න බුදුන් වහන්සේ රහතන් වහන්සේට බහුජන හිතාය, බහුජන සුඛාය කිව්වේ මේ සියල්ලම සිතම බව දකින්න. බාහිර දෙයක් නැති බව දකින්න. බාහිර තියෙන බවත් තමන් සිතන බවම දකින්න. සිත තුළම ලෝකය බව දකින්න. **චිත්තේන නියති ලෝකෝ.** හඳුනාගන්න. එය දැකලා එතන දෙයක් නැති බව දැකලා අන්න අනිමිත්තයි, ශූන්‍යතයි, අප්‍රනීතයි කම්පා වෙන්න ඔබට හේතුවක් නෑ. මෙතන සත්වයෙක්, පුද්ගලයෙක් නැති බව දැක්කොත් අන්න සියලු දුකින් මිදෙනවා.

**අන්න ධර්මය දැක්කා සියලු දුකින් මිදෙනවා. අන්න බුදුන් දැක්කා කියන්නේ අන්න ධර්මය දැක්කොත් දෙයක් නැති බව, ආත්මයක් නැති බව, සත්වයෙක් පුද්ගලයෙක් නැති බව, අන්න අනිමිත්තයි, ශූන්‍යතයි, අප්‍රණිහිතයි කියන්නේ මේ බාහිර දෙයක් හම්බ වෙන්නේ නෑ කියන්නේ මේ සිත නිසයි අපි දුක් විඳින්නේ. අන්න සිතේ සත්‍ය දකිනකොට සිත කියලා දෙයකුත් නැති බව හමුවෙනවා. අන්න එතනයි දුකින් මිදීම තියෙන්නේ. අපි රැවටිලා ඉන්නේ බාහිර හැමදේම තියෙනවා කියලා අරගෙන එහෙම දෙයක් නැති බව සිතුවිලි බව දකින කොටම ඔබ සියලු දුකින් මිදෙනවා. ඉතිං මෙන්න මෙයයි බහුජන හිතාය, බහුජන සුඛාය කියන්නේ. මේ ධර්මයේ පඨිවිධයයි. බුදුන් වහන්සේ දෙන්න කියන්නේ. ඒ පඨිවිධය තුළිනුයි දුකින් මිදෙන්නේ.** ඒකටයි බහුජන හිතාය, බහුජන සුඛාය කියන්නේ. ඔබ දන්නවා කුඹුරක් වගා කරන තැනක බුදුන් වහන්සේ කතාවක් අපට අසන්න ලැබෙනවා. ඒ කුඹුර ගංවතුරට අසුවෙලා විනාශ වෙනවා. හැබැයි, එතනදී බුදුන් වහන්සේ වචනයෙන් පිහිට වෙනවා නේද. ඔබ ඒක ධර්මය තුළ ද දකිනවා නේද? එහෙනම් කුඹුර වගා කරන්නද බුදුන්

වහන්සේ උපකාර කළේ. නැහැ. බුදුන් වහන්සේ ඒ පිහිටවුණේ කොතනද? අන්න ඒ අර දුකින් මිදෙන්නයි පිහිට වුණේ. එහෙනම් මේ ගිහියන්ට පිහිට වෙන්න ඕනි. ඒ කියන්නේ මේ සාමාන්‍ය අපි සමාජය තුළ බහුජන හිතාය, බහුජන සුඛාය කියන්නේ මේ සියල්ලම ධර්මය පෙන්නලා දුකෙන් මිදෙන මග කියලා දෙන එකටයි.

**බුදුන් වහන්සේ දේශනා කරන්නේ නිවන් මගයි. බුදුන් වහන්සේ දේශනා කරන්නේ සත්වයා දුකින් මුදවන්නයි.** ඔබ හිතන්න තමන්ගේම ඥාති නන්ද කුමාරයා විවාහ දිනයේ ජනපද කල්‍යානි විවාහ කරගන්න ඉන්න මොහොතේ නන්ද කුමාරයාව අරගෙන යනවා ජේතවනාරාමයට මේ පාත්‍රය අරන් එන්න නන්ද කියලා. එහෙම කරන්නේ නිවන් මග පෙන්වන්නයි. නැත්නම් නන්දට කසාදයක් බැඳලා හොඳට කාලා බීලා ඉන්න බුදුන් වහන්සේ කියලා දෙනවද? ඒක වෙන්නේ නෑ. එහෙනම් තමන්ගේම ඥාතියාටත් එහෙම නම් කළේ ඔබ දන්නවා බුදුන් වහන්සේ රාහුල කුමාරයාටත් ඒකමයි කළේ. සුද්ධෝදන රජ්ජුරුවන්ටත් එහෙමයි කළේ, ප්‍රජාපති දේවියටත් එහෙමයි කළේ. ඒ හැමෝටම යශෝධරාවටත් එහෙමයි කළේ. නිවන් මගයි පෙන්නුවේ. වෙන මගක් පෙන්නලා නෑ. ඔබ හිතනවාද ජන සමාජයට වෙනින් දෙයක් කරයි කියලා. ඒක වෙන්නේ නෑ. ඒ කරන්නේත් ඒකමයි. නිවන් මඟයි පෙන්නන්නේ. ඇයි බහුජන හිතාය, බහුජන සුඛාය කියන්නේ. අන්න ඒ මග කියයි නම්, ඒ මග යයි නම් ඔබත් නිවණින්ම සැනසීම ලබයි. එයයි ඔබට දුකින් මිදෙන එකම මග. සසරම දුකයි. භවයම දුකමයි. භව නිරෝධයයි, බෞද්ධ කියන්නේ. ඒ දැකීමයි ඔබ සසර දුකින් මිදෙනවා කියන්නේ. ඉතිං ඒ මග යන්න ඔබටත් යහපතක්ම වෙන්න

ඕනි. ඒ මඟ යන්න සිත සකස් වෙන්න ඕනි. ඒ මඟ යන්න ඔබට සියල්ල සකස් වෙලා. ඒ සියලු දුකෙන් මිදෙන්න හේතු සකස් වෙන්න ඕනි. එහෙනම් මේ ඊට උපනිශ්‍රය වන වෙන්න ඕනේ.

හොඳමයි, එහෙනම්, ජබ්බි සෝධන සූත්‍රය තුළ ඉදිරිපත් කිරීම් මෙතනින් නිමාව වෙනවා. එහෙනම්, සමාජයේ එය ව්‍යසනයෙන් මුදවන්නයි මේ සත්‍යය ලෝකෙට හෙළි කළේ. ඒ හෙළි කළ යුතුම නිසයි.

හැමෝටම තෙරුවන් සරණයි !!!

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ආරණ්‍ය සේනාසන කටයුතු වෙනුවෙන් දායක වමට දැන් ඔබටත් අවස්ථාව උදා වී ඇත.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 100800597511

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

කුසට අහරක් හිතට සරණක් යන තේමාව යටතේ අසරණයින්ට පිහිට වීම උදෙසා මෙම සත්කාරය දියත් කර ඇත. ඒ වෙනුවෙන් ඔබටත් දායක විය හැක.

මෙත්මල් අරණ සමාජ සේවා පදනම

ගිණුම් අංක : 100800598542

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend, volume 1
11. The true dhamma has awakend, volume 2
12. The true dhamma has awakend, volume 3
13. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
14. ආර්ය කමටහන්
15. ලොවම දෙදරයි
16. සූත්‍ර දේශනා 01
17. සූත්‍ර දේශනා 02
18. මේ ගෞතම බුද්ධ සාසනයේ නැවත පිබිදීම
19. නොපෙනෙන සත්‍යය